# 2020/02/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/02/11 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2020.02.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. අද 2020 පෙබරවාරි මස 11 වැනිදා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම පවත්වන මේ අවස්ථාවට සහභාගී වී සිටින ගරු උප සභාපතිතුමා ඇතුලු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාම මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මම කවදත් බලාපොරොත්තු වෙන පරිදි සභාව ඉදිරියට කරගෙනයාමට ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින් මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**(අ)02. 2020.01.14 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2020.01.14 දින පැවති මහා සභාවේ සභා වාර්තාව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු **මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 යන මැයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2020.02.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2020 යන මැයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2020.02.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 - ප්‍රජා ශාලාව ඉදිකිරීම - 218 සී උක්ඹිවිට උතුර යන මැයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2020.02.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. පැමිණිල්ලක් රපෝර්තු කිරීම යන මැයෙන් සාමවිනිසුරු ටී. ඉලේපෙරුම, පරණවත්ත, උනන්විටිය විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

05. උක්ඹිවිට පෙර පාසල වෙනුවෙන් භාවිත කිරීමට නියමිත උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු කර ගැනීම යන මැයෙන් කේ.ජී.ජයනි, සංවර්ධන නිලධාරී (ප්‍රජා) විසින් යොමු කරන ලද 2020.01.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. නාගොඩ කැකුළු පෙර පාසලේ ගොඩනැගිලි කුලිය සංශෝධනය වීම පිළිබඳව ඒ.එස්.ආර්.විජේතිලක, රිවර් ෆෙයාර්, නාගොඩ විසින් යොමු කරන ලද 2020.02.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

07. සංඥා ලාම්පු ලබාගැනීම සම්බන්ධව බි.ජී. පියතිලක, රියදුරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද 2020.02.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

08. කැප්පිටියාගොඩ සෙනවිරත්න මාවතේ පිහිටා ඇති ගිංගඟ ආශ්‍රිත තොටුපොළ සංවර්ධනය සම්බන්ධව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යොමු කරන ලද 2020.02.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

09. 70 කන්ද මාර්ගය සම්බන්ධව ආර්.ජී. සුනිල් , ජන උදානගම, යටලමත්ත විසින් හිටපු පළාත් සභා මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතා වෙත යොමු කරන ලද 2020.02.11 දිනැති ලිපිය ප්‍රාදේශීය සභාවට යොමු කිරීමෙන් අනතුරුව සභාගත කරන ලදී.

10. යෞවන සමාජයේ ක්‍රීඩා පිටිය පවිත්‍ර කිරීම සම්බන්ධව උඩවැලිවිටිය බටහිර ස්වර්ණ රශ්මි යෞවන සමාජය විසින් යොමු කරන ලද 2020.02.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ප්‍රශ්න**

i. **අයාලේ යන ගවයන් හා නිදැල්ලේ හැසිරෙන ගවයන් හට අප සභාවෙන් ගත හැකි පියවර කුමක්ද?**

අයාලේ යන ගවයන් ඇල්ලීම සඳහා අපට කෙනෙකු යොදවන්න පුලුවන්. ඒ යොදවන පුද්ගලයාට අල්ලන එක් ගවයෙකු සඳහා මුදලක් ගෙවිය යුතුයි. ගාලක් සැකසිය යුතුයි. ගවයන් අල්ලන පුද්ගලයාගේ හා සතුන්ගේ ආරක්‍ෂාව කෑම බීම සම්බන්දව අපි වගකිව යුතුයි. මෙසේ අල්ලන ලද ගවයන් නිදහස් කර ගන්න හිමිකරුවන් පැමිනිය හොත් අපට ගාල් ගාස්තු හා කෑම සඳහා දිනකට මුදලක් අය කරන්න පුලුවන්. නැත්නම් සභා තීරණයක් අනුව අල්ලන ලද සතුන් වෙන්දේසි කරන්න පුලුවන්. අපි මේ සම්බන්දව පත්තරෙත් දැම්මා. නමුත් මේ සඳහා කිසිවෙක් ඉදිරිපත් වුනේ නැහැ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා :-** ගරු සභාපතිතුමනි මේ සම්බන්දව මම වැඩියමත් දැම්මෙ. අපි හරිත වැඩසටහනක් කළා. තල්ගස්වල වැව ආශ්‍රිතව. නමුත් ඒ සිටවන ලද කිසිම පැලයක් දැන් නැහැ. ගවයන් විසින් විනශ කරලා. ඒ වගේම ගෙදරකවත් කිසිම බෝගයක් වගා කරන්න බැහැ. අපිට මේක විශාල ප්‍රශ්නයක්. ඒ නිසා අපි මේකට මොනවාම හරි කරමු.

**ගරු සභාපතිතුමා :-** අයාලේ යන ගවයන් මාපලගම,නාගොඩ,ඌරල මේ හැම තැනටම විශාල ප්‍රශ්නයක්. අපි මේකට විසඳුමක් දෙන්න දීර්ඝ කාලයක සිට උත්සහ ගන්නවා. ඊයෙ සංවර්ධන කමිටුවෙත් මේ සම්බන්දව කතා කළා. කීප වරක්ම ගව හිමියන් දැනුවත් කළත් වැඩක් වුනේ නැහැ. නැවත වතාවක් ග්‍රාම නිලධාරී මගින් ගව හිමියන් දැනුවත් කරල කැඳවමු. පොලීසිය, කෘෂි කර්මය ආදී සියලු ආයතන සම්බන්ද කරගෙන. මේ සම්බන්දයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීමට සාකච්ඡා කරමු.

**ii. කටුපොල් කර්මාන්තශාලාවට (වටවල) අප සභාවෙන් නිකුත් කරනු ලබන පාරිසරික බලපත්‍රය ලබා දිය හැකිද?**

කටුපොල් කර්මාන්ත ශාලාව සඳහා අප විසින් ලබා දෙන වාර්ෂික පරිසර බල පත්‍රය තවම ලබා දීල නැහැ. කටුපොල් කර්මාන්ත ශාලාවෙ සවිකරපු මැෂින්වල රිපෝට් එක තවම ලැබිල නැතිලු. ඒක ලැබෙනකම් අපට බලපත්‍ර නිකුත් කරන්න බැහැ.

**iii. තල්ගස්වල සිට මාපලගම දක්වා කුඹුරු ගොඩ කිරීම සම්බන්ධව ගත් තීරණය කුමක්ද? ඒ සම්බන්ධව අදාළ නිලධාරීන් දැනුවත් කළාද?**

තල්ගස්වල සිට කුඹුරු ගොඩ කිරීම පිළිබදව අපි දැනුවත් වුනාම. ඒ සම්බන්දව අදාල ආයතන හා බලධාරීන් දැනුවත් කළා. ඊයෙ සංවර්ධන කමිටුවෙත් මේ සම්බන්දව කතා කළා. සංවර්ධන කමිටුවෙ සභාපතිතුමා පස් ගොඩ කිරීම ඊයෙ ඉදල නතර කරන්න කියලා නියෝගයක් දුන්නා.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**i. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් ප්‍රමුඛතාකරණය කරන ලද මගී ආවරණ ඉදි කිරීම සඳහා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.**

1. නාගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය අසළ
2. නාගොඩ වලව්ව හංදිය අසල
3. උඩුගම මහා විද්‍යාලය මාර්ගය දෙපස
4. උඩුගම බාර්හංදිය ගාලුපාරට මුහුණලා
5. කැප්පිටියාගොඩ සෙනෙවිරත්න මාවත අසල
6. යටලමත්ත හංදිය
7. වලකුඹුර සැන්ඩ්‍රොකඩේ අසල
8. යටලමත්ත බෝවිටියමුල්ල හංදිය
9. උනන්විටිය හන්දියේ බද්දේගම දෙසට මාර්ගයේ දෙපස සඳහා
10. කැටගොඩ පාර සුජනකන්තාරාම විහාරයට යන පාර අසල ඇති ස්ථානයේ
11. බුදපනාගම සමනළ පෙර පාසල අසල
12. යටලමත්ත රුක්මලගොඩ පුස්සවැල මහතාගේ නිවස ඉදිරිපිට
13. බණ්ඩාරනායකපුර මනමාල වංගුව අසල
14. ඌරල ගල්කන්ද හංදිය අසල
15. ඌරල සමූපකාරය අසල
16. ගෝණදෙණිය ඕසුහල අසල
17. 215 මාපලගම ග්‍රා.නී.වසමේ රණවිරුගම්මානයට යන පාර අසල
18. ඌරල සතොස අසළ
19. උඩුගම බාර් හන්දියෙන් කැටගොඩ දෙසට මාර්ග දෙපස සඳහා

20. ගෝණදෙණිය පාරේ බටහේන්ගොඩ මාර්ගයට පිවිසෙන ස්ථානයේ
21. පුහුල්හේන කන්ද මුදුන අසල
22. ගල්වාන මංසංධියේ විපුලසාර ගොඩනැගිල්ල ඉදිරිපස
23. 213 බී පරණතානායම්ගොඩ ග්‍රා.නි.වසමේ ගජනායක කඩේ අසළ
24. මාපලගම කොළඹ කඩේ අසල
25. උඩලමත්ත මිල්ලගහ අසල
26. 215 සී තල්ගස්වල කළුකොත පිවිසුම් මාර්ගය ඉදිරිපිට
27. මාපලගම ජනිත් ස්ටෝර්ස් ඉදිරිපිට

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

ii. උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ලේ වහල ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

iii. උඩුගම උප කාර්යාල මිදුල සැකසීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

iv. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම පිහිටි කඩ කාමර පිටුපස කටු කම්බි යොදා වැට සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

v. මාපලගම ආයුර්වේද ගොඩනැගිල්ලේ වහල ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

vi. 2019.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව එම වාර්තාව සභාව විසින් පිලිගැනීමත් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිලිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

vii. 2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ, අපහරණ හා වෙන්දේසි කටයුතු සිදු කිරීම සඳහා පහත සඳහන් සභිකයින්ගෙන් හා නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව පත් කිරීමට යෝජනා කරමි.

01. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
02. ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
03. ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය
04. චන්ද්‍රිකා දයාවංශ මිය - ලේකම්
05. ඩිලානි චන්ද්‍රප්‍රභා මෙනවිය - ප්‍රධාන කළමනාකරණ සහකාර
06. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරීක්ෂක
07. දිලිනි දිසානායක මිය - තාක්ෂණ සේවා නිලධාරී
08. කේ.ඒ. එදිරිසිංහ මයා - තාක්ෂණ සේවා නිලධාරී
09. කේ.ජී. මානෙල් සුදර්ශනි මිය - සංවර්ධන නිලධාරී
10. කේ.ජී. ජයනි මිය - සංවර්ධන නිලධාරී
11. පී.ඩී. යුරේකා මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරී
12. හංසිකා මුතුමාලි මිය - කළමනාකරණ සහකාර
13. චන්දිමා සෙනවිරත්න මිය - කළමනාකරණ සහකාර

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

viii. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ නිල රථය වන PF 7360 ඩබල් කැබ් රථය 2020.01.29 දින උඩුගම සිට කුරුපනාව මාර්ගයේ නාගොඩ දෙසට ධාවනය කිරීමේදී වාහනයේ වින්ඩ්ස්ක්‍රීනය (වාමුවාව) අනතුරට පත් වී ඇත. එබැවින් එය අළුත්වැඩියා කිරීමට යන වියදම රක්ෂණ සමාගම මගින් උපරිම අය කර ගත හැකි පරිදි අළුත්වැඩියා කටයුතු සුදුසු නිපුනතාවය සහිත ආයතනයකින් සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

ix. මාපලගම නගරය පිරිසිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත යොදවා සිටි අර්නෝලිස් මහතාගේ අසනීප තත්වය මත සේවයෙන් ඉවත් වී ඇත. එබැවින් අනියම් පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරට එක් සේවකයකු බඳවා ගත යුතුය. ඒ අනුව 2020.01.01 දින සිට හදිසි අවශ්‍යතාවය මත සේවයේ යොදවා ගන්නා ලද ආරුමුගම් ඥානසීලම් මහතා අනියම් පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරට බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

x. දැනට සභාවේ අනියම් පදනම මත සේවය කරනු ලබන කැළුම් චාමර යන රියදුරු මහතාගේ වසරක සේවා කාලය අවසන් වී ඇත. ඔහු වීථි පහන් නඩත්තු කිරීම් කටයුතු සඳහා කෘ කැබ් රථයේ සේවයට යොදවා ඇති බැවින් තවදුරටත් ඔහුගේ සේවය අවශ්‍ය වේ. එබැවින් එම රියදුරුගේ සේවා කාලය දීර්ඝ කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xi. භාවිතයෙන් ඉවත් කරන ලද CFL බල්බ් මිළ ගණන් කැඳවා විකිණීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xii. ගුණරත්න ජාගොඩ මහතාගේ ඉල්ලීම හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව ප්‍රාදේශීය සභා පනතේ 27,28 හා 29 වගන්ති ප්‍රකාරව ගිංගහවත්ත ගලබොඩවත්ත පාර අත්පත් කර ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xiii. සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 යටතේ 218 සී උක්ඕවිට උතුර ප්‍රජා ශාලාව ඉදිකිරීමට අදාළ පර්චස් 10 ක ඉඩම අන්‍යොන්‍යාධාර සමිතිය විසින් ප්‍රාදේශීය සභාවට පැවරීම සඳහා ඔප්පු ලිවීමේදී වැය වන මුද්දර ගාස්තු සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xiv. ඩයලොග් ආයතනය මගින් නව අන්තර්ජාල සම්බන්ධතා පුළුල් කිරීම සඳහා ගම්මැද්දේගොඩ නාගොඩ මාර්ගය, පඤ්ඤාලෝක මාවත, කන්දකැටිය මාර්ගය, මුලන මාර්ගය, වාඩියකන්ද මාර්ගය යන ප්‍රාදේශීය සභා මාර්ගයන්හි තෝරා ගත් ස්ථානවල දුරකථන කණු සවි කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. එම මාර්ගයන්හි කණු සිටුවීමට අදාළව සභාවට අය විය යුතු මුදල වන රු. 5000.00 ක් අය කර ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව සභා සම්මත නොවූ අතර, මේ සම්බන්ධව සාකච්ඡා කර පසුව තීරණයක් ගැනීමට තීරණය විය.**

xv. එල්.එස්.ආර්.විජේතිලක මයාගේ ඉල්ලීම අනුව නාගොඩ කැකුළු පෙර පාසලේ ගොඩනැගිලි කුලිය 2020 ජනවාරි මස සිට රු. 4500.00 සිට රු. 5000.00 දක්වා වැඩි කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xvi. සංඥා ලාම්පු ලබාගැනීම සම්බන්ධව බි.ජී. පියතිලක, රියදුරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද ඉල්ලීම අනුව 252-6478 කැබ් රථයේ අලුතින් සංඥා ලාම්පු සවි කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xvii. සභා රැස්වීමට සහභාගී වන මාධ්‍යවේදීන් දෙදෙනකුට පමණක් සභා අරමුදලින් දීමනාවක් ගෙවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

xviii. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

**අංක 01 සිට 32 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2020.02.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.2020 ජනවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 10316.85 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 514.50 |
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව | - රු. 459.60 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 862.20 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 917.10 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1722.30 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 386.40 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 313.20 |
| 8619142704 | - රන් කැකුළු පෙර පාසල | - රු. 258.30 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 294.90 |
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 441.30 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 1941.90 |

**2019 දෙසැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 258.30 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි**

දුරකථන බිල්පත් ගෙවීම (2020.01.01 - 2020.01.31)

i. 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම - රු. 3382.48

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.01.25) - රු. 61.30

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2019.12.20 – 2020.01.17) -රු. 3058.23

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2019.12.20- 2020.01.17) -රු. 3377.17

**05. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 3400.00

ii. සභාවට අවශය පොදු ආකෘති පත්‍ර රජයේ මුද්‍රන දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 3925.80

iii. LL 7650 කෘ කැබ් රථය සඳහා හැඩලයක් ලබා ගැනීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 695.00

iv. 2020.01.27 දින පැවති පරිසර කමිටුව සඳහා නිලධාරීන් සඳහා දීමනා ගෙවීම - රු. 3000.00

**06. අතිකාල දීමනා ගෙවීම**

**2019 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 4523.20 |

**2020 ජනවාරි මස**

| | | |
|---|---|---|
| යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 2277.00 |
| ඉරේෂා මදනායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1318.33 |
| එන්.එච්.ඩී.නිරෝෂනී මිය | - කළමනාකරණ සහකාර | - රු. 2049.00 |
| ජී.පී.පී. ශ්‍රීණිකා මිය | - කළමනාකරණ සහකාර | - රු. 951.00 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1801.33 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7756.25 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8640.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.10327.50 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 8083.20 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8596.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 8596.00 |
| ඩබ්.ඒ.සී.මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 2654.08 |

**07 .2020 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**08. 2020 පෙබරවාරි මස ගමන් වියදම්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 400.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| ජී.ඉෂානි දීපිකා මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 1740.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1720.00 |

**2020 ජනවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 7000.00 |
| සී.දයාවංශ මිය | -ලේකම් | - රු. 570.00 |
| ඩබ්.ඒ.ශාන්ත මයා | - සංවර්ධන නිලධාරී | - රු. 1290.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 450.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | -රු. 6300.00 |
| ප්‍රිමාලි ශ්‍රීනිකා මිය | - කළමනාකරණ සහකාර | - රු. 2100.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2720.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 3566.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| ඉරේෂා මදනායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1812.00 |
| ජී.ඉෂානි දීපිකා මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 2640.00 |

**09. චන්ද්‍රිකා දයාවංශ මිය, නාගොඩ ප්‍රාදේශීය සභාව**

නිවාඩු දිනයන්හි රාජකාරියේ යෙදීම වෙනුවෙන් වැටුප් ලබා ගැනීම - රු. 4686.50

**10. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**

2019.10.01 සිට 2019.12.31 කාර්තුවට අය කර ගත් මුද්දර බදු ප්‍රේෂණය කිරීමේ ගාස්තු - රු. 4900.00

**11.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**<u>2019 දෙසැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 74 ක් | - රු. 7696.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 42 ක් | - රු. 4368.00 |
| ඩෙංගු මර්ධන ධූමායන කටයුතු සඳහා පෙට්‍රල් ලීටර් 6 | - රු. 822.00 |
| ඩෙංගු මර්ධනධූමායන කටයුතු සඳහා ඩීසල් ලීටර් 30 | - රු. 3120.00 |
| ජල මෝටරය සඳහා භූමිතෙල් ලීටර් 05 | - <u>රු. 350.00</u> |
| **එකතුව** | **- <u>රු. 16356.00</u>** |

**12. ඩී.ආර්.ශ්‍යාමන් සෝමසිරි මයා, උඩුගම ඩිපෝ ඉංජිනේරු**

252-6478 අංක දරණ කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධ පෙර වාර්තාව සහ අලුත්වැඩියාවෙන් පසු වාර්තාව ලබා ගැනීම සම්බන්ධව දීමනා ගෙවීම - රු. 1000.00

**13. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**14. ටී.ජී.සුමනසිරි, ටී.ජී හාඩ්වෙයාර්, නාගොඩ**

ප්‍රධාන කාර්යාලය සඳහා ගෑස් සිළිංඩරයක් ලබා ගැනීමේ බිල්පත - රු. 615.00

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 පෙබරවාරි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2020 ජනවාරි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1155.00

**16.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක එල් 36 ට අදාළව 2019.11.25 හා 2020.02.10 කැඳවන ලද නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 6000.00

**17. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා පෙබරවාරි මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**18. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 ජනවාරි) - රු.13000.00

**19. කේ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 දෙසැම්බර් - රු. 7610.00

2020 ජනවාරි - රු. 7050.00

**20. දයානි පුද්.සමාගම, මාපලගම**

i. ප්‍රධාන කාර්යාලයේ සිවිලිං විදුලි පංකාවට රෙගියුලේටරයක් සහ සවිකිරීමේ උපකරණ ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 1166.00

ii. ෆොටෝ කොපි මැෂිම සඳහා ප්ලග් බේස් එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 604.00

iii. මාපලගම පුස්තකාලයේ සිවිලිං විදුලි පංකා අළුත්වැඩියා කර සවි කිරීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම - රු. 4480.00

iv. ප්‍රධාන කාර්යාලයේ වතුර මෝටරය අළුත්වැඩියාවට අදාළ උපකරණ ලබා ගැනීමේ බිල්පත - රු. 2150.00

**21. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**

ස්ප්‍රින් ටේප් එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 565.00

**22. ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව, කොළඹ**

සෞඛ්‍ය අංශයේ භාවිතය සඳහා අත්මේස් ලබා ගැනීමේ බිල්පත - රු. 6600.00

**23. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී, කොළඹ**

ෆොටෝ කොපි යන්ත්‍රය සඳහා ටෝනර් 2ක් ලබාගැනීමේ බිල්පත - රු.15768.00

**24. එන්.එච්.ඩී.නිරෝෂනී මිය, නාගොඩ ප්‍රාදේශීය සභාව**

මුදල් ලද බව සඳහන් සීල්පත් මුද්‍රණය කිරීම වෙනුවෙන් වැය වූ මුදල ලබා ගැනීම - රු. 1800.00

**25. සිසිර ජයමාන්න මයා, පොලිසීය අසල, උඩුගම**

2020 ජනවාරි මස 14 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සහ තේ සඳහා) - රු. 9393.00

**පොදු අරමුදල් කර්මාන්ත**

**26. ආසිරි ජොෂ්ඨ පුරවැසි කමිටුව, කැප්පිටියාගොඩ දකුණ**

සභාපති නිළ කාමරය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් නිදහස් කිරීම - රු. 75597.13

**27. සී/ස/බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, බද්දේගම**

නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවට යාබඳ ඉදි කර ඇති භාවිතා නොකරන වැසිකිලිය ඇති ස්ථානය විවේකාගාරයක් බවට පත් කිරීමේ කර්මාන්තය සඳහා සිමෙන්ති ගඩොල් කැට 25 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 950.00

**රජයේ ආධාර**

**පළාත් නිශ්චිත - සංවර්ධන ප්‍රදාන**

**28. සී/ස/බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, බද්දේගම**

උඩවැලිවිටිතලාව පොල්ලැච්චගොඩැල්ල වේල්ල සඳහා සිලිංඩර් 03 ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 23400.00

**29.** තල්ගස්වල ග්‍රාම සංවර්ධන සමිතිය, තල්ගස්වල
තල්ගස්වල නව නගර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ
පළමු හා අවසාන ගෙවීම - රු. 516862.37

**30.** උඩලමත්ත ග්‍රාම සංවර්ධන සමිතිය, උඩලමත්ත, ගාල්ල
උඩලමත්ත අලුත්නුවර සිට ධර්මදූත බෞද්ධ මධ්‍යස්ථානය දක්වා වූ මාර්ගය සංවර්ධනය කිරීමේ
කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු. 535514.91

**31.** කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව
ප්‍රියදර්ශනාරාම පන්සල පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු.525863.27

**32.** ප්‍රියදර්ශනාරාම වැඩිහිටි සමිතිය, හගරන්වල, නාකියාදෙණිය

i. හෝමදොළවත්ත නො.02 වතු නිවාස මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ
කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු. 445631.79

ii. නෙලුඇල ගමට යන මාර්ගය කිරිමඩුව අසළින් උඩට යන කොටස සංවර්ධනය කිරීමේ
කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම -රු. 540000.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**2.1. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. කොළඹ කඩේ අසළ කුඹුස්ස පාලම අබලන් වී එහි පැති බැම්ම ගැලවී ගොස් ඇත. ඉතා ඉක්මණින් පියවරක් ගෙන එම පැති බැම්ම ස්ථාපිත කර දෙන ලෙසට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**2.2. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. අම්පාර නගර සභාවේ ක්‍රියාත්මක වන කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය අධ්‍යනය කිරීම සඳහා සියළුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් වෙනුවෙන් අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීම සහ එම අධ්‍යයන චාරිකාව යාම සඳහා වැය වන වියදමෙන් රු. 100000.00 ක් සභා අරමුදලින් දැරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**මාර්ග ආලෝකකරණ වීථි ලාම්පු සඳහා ලැබී ඇති මිළ ගණන් කැඳවීම - (LED)**

| විස්තරය | ජෙම්සිටි (පුද්) සමාගම, කලුතර දකුණ (වගකීම් කාලය වසර 2 ½) | ලයිට් පැලස්, දෙහිවල (වගකීම් කාලය වසර 1 ½) | එවර්ග්‍රීන් ලයිට්නින් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල් ලංකා, මිනුවන්ගොඩ පාර, ඒකල |
|---|---|---|---|
| 150W | රු. 12750.00 | රු. 13100.00 | රු. 13323.96 |
| 100 W | රු. 9850.00 | රු.10250.00 | රු. 9250.20 |
| 50W | රු. 6850.00 | රු. 7850.00 | රු. 6416.28 |

**මාර්ග ආලෝකකරණ වීථි ලාම්පු සැපයීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව 150W බල්බ් (සවි කිරීමේ ආධාරකය සමඟ) අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ ජෙම්සිටි (පුද්) සමාගම, කලුතර දකුණ වන අතර, 100 W, 50W බල්බ් සඳහා අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ එවර්ග්‍රීන් ලයිට්නින් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල් ලංකා, මිනුවන්ගොඩ පාර, ඒකල වුවත් එම ආයතනයේ වගකීම් කාලය දක්වා නොතිබීම හේතුවෙන් ජෙම්සිටි (පුද්) සමාගම, කලුතර දකුණ ආයතනය වෙතින් වීථි ලාම්පු ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

i. 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 ජනවාරි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 ජනවාරි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 ජනවාරි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මේ අවස්ථාවෙ මම නැගී සිටියේ පහුගිය සභාවාර කීපයකදිම මම සඳහන් කළා. උඩවැලිවිට්තලාව මාර්ගයේ ගමන් කරන්න අපහසුයි කියලා. මම කලින් සඳහන් කරන වෙලාවෙ පාරෙ තාර ගැලවීගෙන එන මට්ටමක විතරයි තිබුනෙ. නමුත් මේ වෙනකොට වලවල් හැරිලා, වංගු සහිත ස්ථාන තමයි වැඩිය අනතුරේ තියෙන්නෙ. මොකද මේ දවස්වල නම් ඒ වලවල්වල වැටි වැටි හරි ගමන් කරන්න හැකියාව තියෙනවා. වහින කාලෙ වෙනකොට ඔය වලවල්වල වතුර පිරිලා ගමන් කරන්න අපහසු අවස්ථාවක් එනවා. ඒ වගේම තමයි ත්‍රීවිල් එකකින් හයර් එකක්වත් යන්න බැරි මට්ටමට පාර පත්වෙලා තියෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවදානය යොමු කරල ඒ පිළිබඳව සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමනි, පහුගිය දවස්වල ගෝණදෙනිය ක්‍රීඩා පිටිය පිළිබඳ යම් ගැටලුවක් ඇතිවුනා. විශේෂයෙන් ඒ සම්බන්ධව සභාව දැනුවත් කරන්න අවශ්‍යයි. ගෝණදෙනියෙ ක්‍රීඩා පිටියෙන් වී ගබඩාවට මාර්ගය ඉල්ලලා නඩුවක් දාලා තිබුනා. මේ වී ගබඩාව ලක්ෂ 10 ක මුදලට තමයි ලබා ගත්තෙ කියන එක ගැන අපි සභාව දැනුවත් කළා. එතකොට වී ගබඩාවට යන මාර්ගයට නඩුව පවරලා තියෙද්දි. අර මාර්ගය සකස්කරන කොන්ත්‍රාත් කරුවන් විසින් ගල් ගබඩා කිරීම සඳහා මේ වී ගබඩාව සහිත ඉඩම අවශ්‍යයි කියලා වී ගබඩාව හිමි අයිතිකරුවන්ගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. එතකොට මේ නඩුව දාලා තියෙද්දි, ගෝණදෙනිය ක්‍රීඩා පිටිය හරහා තාවකාලික මාර්ගයක් පාවිච්චි කරමින් ක්‍රීඩා පිටියට හානි වෙන විදිහට බර වාහන ඇතුලත් කරමින් මාර්ගයක් තනා ගන්නට උත්සාහයක යෙදුනා. ඒ උත්සාහය සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය ලිපියක් දීලා තිබුනා. මේක නිකුත් කරල තිබුනෙ

පහුගිය ආණ්ඩු සමයේ. ඒ ලිපියෙ සඳහන් වෙලා තිබුනෙ පෙරපාසලට සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයට දැනට භාවිතා කරන මාර්ගය භාවිතා කරන්න කියලා. නමුත් ඒකෙ නිෂ්චිතව කොහේද මොකක්ද කියල සඳහන් කරලා තිබුනෙ නැහැ. අවසර දීලා තිබුනා. ඒ වගේම සභාපතිතුමත් ලිපියක් මගින් පෙරපාසලට අවහිර නොවන පරිදි ඒ මාර්ගය භාවිතා කරන්න කියලා අවසර දීලා තිබුනා. ගරු සභාපතිතුමනි, ගම්වැසියන්ගෙන් ඇහුවනම් දැනගන්න පුලුවන් පෙරපාසලට සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයට ගමන් කළේ ඔය පිට්ටනිය හරහා ගිහිල්ලා නෙවෙයි. ඔය ප්‍රාදේශීය සභා පෙරපාසල් ගොඩනැගිල්ල විවෘත කරන වෙලාවෙ ඔය පිට්ටනියට පල්ලෙහායින් මාර්ගයක් තැනුවා. පෙරපාසලේ සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයේ මාර්ගය වුනේ ඒ මාර්ගය. නමුත් ලිපියකින් ලබාදීල තිබුනා ඒ මාර්ගය භාවිතා කරන්න කියලා. එතකොට ඔවුන් භාවිතා කළේ මේ ක්‍රීඩා පිටිය හරහා. ඒ නිසා ක්‍රීඩා පිටියට දැවැන්ත හානියක් සිදුවෙලා තිබුනා. මේක කුඹුරක් ගොඩ කරලා හදපු ක්‍රීඩා පිටියක්. බර වාහන දැම්මම ඒ මාර්ගය බහිනවා. එහෙම බැස්සම ඔවුන්ගෙ අරමුණ වෙලා තිබුනෙ ඒක උඩින් ABC යොදන්න. එතකොට බහින මාර්ගයේ ABC යෙදුවම අනිවාර්යයෙන් ස්ථිර මාර්ගයක් ඒ හරහා ගොඩනැගෙනවා. මේ සම්බන්ධව දැනුම් දුන්නට පස්සෙ ප්‍රාදේශීය සභාවෙ සභාපතිතුමාගෙන් හෝ ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් මට නිවැරදි පිළිතුරක් ලැබුනෙ නැහැ. පහුගිය බදාදා ප්‍රාදේශීය ලේකම්තුමිය සහ එම ඉඩම අයිති මහත්මයා උදේ 10ට එම ස්ථානයට සම්බන්ධ වෙනවා කියලා මට දැනුම් දුන්නා. ඒ අවස්ථාවට ගම්වාසීන් විශාල පිරිසක් සම්බන්ධ වුනා. නමුත් මේකත් කියන්න ඕන. පාර භාවිතා කරන්න කියල ලිපියක් ඔබතුමා ප්‍රාදේශීය ලේකම් හරහා දීලා තිබුන වගේම මේ පිට්ටනිය ප්‍රාදේශීය සභාව පාවිච්චි කරන ඉඩමක් එම නිසා මේ බර වාහන ඇතුලත් කිරීම කරන්න එපා කියල ප්‍රාදේශීය ලේකම්තුමියට ඔබතුමා නැවත ලිපියක් දීල තිබුනා. අන්න ඒ ලිපිය පදනම් කරගෙන ප්‍රාදේශීය ලේකම්ට මේ මාර්ගය නතර කරන්න හැකියාව ලැබුනා. ඔබතුමා අර කලින් ලිපිය ලබා දීල නොතිබුනා නම් ඔබතුමාට නැවත ලිපියක් ලබා දීමේ අවශ්‍යතාවයක් නැහැ. මම ඇත්තටම සතුටු වෙනවා අවසන් මොහොතෙදි හරි මාර්ගය නතර කරන්න කියලා ලිපිය ලබා දීපු එක සම්බන්දව. ඉඩම ප්‍රාදේශීය ලේකම් සතු වුවත් භාවිතා කරන්නෙ ප්‍රාදේශීය සභාව නිසා. ප්‍රාදේශීය සභාව විසින් මේක නතර කරන්න කියලා ඉල්ලීම කර බලය දීපු නිසා, ප්‍රාදේශීය ලේකම්තුමිය ජනතාවට සහ අපට දැන්නුවෙ නතර කරන්න බලය තියෙනවා කියලා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා වගේම අපි නියෝජනය කරන්නෙ ජනතාව. එතකොට ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් තමයි අපි පෙනී ඉන්න ඕන. මේ ගෝනදෙනිය ක්‍රීඩා පිටිය ඔබතුමාගෙවත් මගේවත් පුද්ගලික දෙයක් නෙවෙයි. මේක පාවිච්චි කරන්නෙ ග්‍රාමසේවා වසම් දෙකක ජනතාව. මේක රජයේ මුදල් විශාල ප්‍රමාණයක් වැය කරල ගොඩනගල තියෙන්නෙ. මේක අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම ජනතා නියෝජිතයන් වශයෙන් අපේ යුතුකමක්. නඩු කටයුත්ත සිද්ද වෙනවා. ඊයෙ සම්බන්ධී කරණ කමිටුවෙදි වී ගබඩාව නැවත රජයට පවර ගන්න තීරණය කළා. ඒ සම්බන්දව රමේෂ් පතිරණ ඇමතිතුමාට බොහොම ස්තූති වන්ත වෙනවා. ඉදිරියෙදි ඒ සම්බන්දව එකතුවෙලා කටයුතු කරමු කියලා මම ප්‍රාදේශීය සභාවෙ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. මේ රජයේ ගොඩනැගිල්ලක් ප්‍රදේශයේ කුඹුරුටික කෙරෙන කොට මේ වී ගබඩාවෙ අවශ්‍යතාවය දැඩිව අපට තියෙනවා. පහුගිය දවස්වල වී ගබඩා කරන්න තැනක් නැතුව මත්තල ගුවන්තොටුපොලෙත් වී ගබඩා කළා. ඒක නිසා මේ කුනු කොල්ලෙට විකුනපු අපේ මේ සම්පත් ටික නැවත පවරගෙන කටයුතු කළොත් ජාත්‍යන්තරව පිළිගත්ත මත්තල ගුවන්තොටුපොල වගේ තැන්වල වී ගබඩා කරන්න අවශ්‍යතාවයක් නැහැ. ඉදිරියෙදි අපි කුඹුරු ටික අස්වද්දවනවා. ගොවීන්ට සහනාධාර දෙනවා. මේ රට 2015 පෙර තිබුන විදිහටම සහලින් ස්වයංපෝෂිත කරද්දි මේ ගෝනදෙනිය ගම සතුව තියෙන වී ගබඩාව රජයට පවරා ගැනීම විශාල වරප්‍රසාදයක්. ඒ වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ ශක්තිය ලබා දෙන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ ගොම ප්‍රශ්නය පිළිබඳව මාස ගණනාවක් තිස්සෙ මේ සභාවෙ කතා කළා. විසඳුමක් ලැබුනෙ නැහැ. එහි ප්‍රතිඵල ඊයෙ සම්බන්ධීකරණ කමිටුවෙදි කිව්වා. මේ වෙනකොට ගවයන් තිස් ගණනක් හෝ හතලිස් ගණනක් හඳුනා නොගත් රෝගයකින් මිය ගිහින් තියෙනවා. පශු වෛද්‍යවරයා පවසන විදිහට මේ ගවයන් මිය යන්නෙ වටවල වැවිලි සමාගමෙන් නුවරඑළියෙ ඉදලා මෙහේට ගේන ගොමවලින් ඇතිවන විශබීජයක් නිසා. මේක විශාල තර්ජනයක් මේ වෙනකොට ලෝකය පුරා කොරෝනා ව්‍යාප්ත වෙමින් පවතිනවා. ඒකත් මුලදි කිව්වෙ සතුන්ගෙන් බෝවෙනවා කියල. ඉතිං මේ නුවර එලියෙන් ගේන ගොමවලින් මේ ප්‍රදේශයේ මිනිස්සුන්ටත් මේ වගේ තර්ජන ඇති වෙන්න පුලුවන්. වසංගත ඇතිවෙන්න පුලුවන් මොකද මේ පිටරටින් ගේන ගවයන්ගෙ ගොම තමයි මෙහේට අරගෙන එන්නෙ. ඒ නිසා මේ පිළිබඳ දැඩි අවදානය මහජන නියෝජිතයො විදිහට අනිවාර්යයෙන් යොමු කළ යුතුයි. මේ ගොම නිසා සිදුවෙන හානිය පිළිබඳව ඊයෙ පැහැදිළිව කිව්වා.

ඒ වගේම මම අදත් මතක් කරනවා. මේ කටුපොල් වගාව මේ වෙනකොට නැවැත්වූ බව කියලා කියනවා. නමුත් හොර හොරා රැට රැට සල්ලි දීල කටුපොල් හිටවනවා. මේක හරියාකාරව ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. කටුපොල් කර්මාන්ත ශාලාවට තවම පරිසර ආරක්ෂණ වාර්තාව ලබා දුන්නා කියල සභාවට නිර්නායකයක් ලැබිල නැහැ. සභාවට හැකියාව තියෙනවා මේ සම්බන්දව පියවර ගන්න. 2018.02.10 තමයි ප්‍රාදේශීය සභා මැතිවරණය තිබුනෙ. ඊයෙ වෙනකොට මැතිවරණය තිබිලා හරියටම වසර දෙකයි. නමුත් කියන්න කණගාටුයි. මේ වසර දෙකට මේ සභාවෙ කතා කරපු දේවල්වලින් 90% කෙරිල නැහැ. සියල්ල කෙරිල නැහැ කියල කියන්න බැහැ. යම් යම් දේවල් කෙරිල තියෙනවා. සභාපතිතුමාට පළාත් සභාව නැහැ. ආණ්ඩුව නැහැ අපි ඒවත් පිළිගන්න ඕන. නමුත් ආණ්ඩු පක්ෂෙ මන්ත්‍රීවරු විදිහට අපට කිසිසේත්ම සෑහීමකට පත්වෙන්න බැහැ. අපි බලාපොරොත්තු වෙනවා. තව මාස කීපයකින් අපි ආණ්ඩුව ගන්නවා. අරගෙන අය වැය තියලා අනිවාර්යයෙන් 2015 පෙර තිබ්බ ඒ සශ්‍රීක රට නැවත අපි ගොඩනගනවා. අද මාධ්‍යවේදීන් දෙපලක් ඇවිල්ලා ඉන්නවා. එතුමන්ලට මම ස්තුතිවන්ත වෙනවා. මේ අපි කතා කරන කරුණු රටට ගෙනියන්න. ඒ හරහා ජනමතයක් හැදිල අපට සුලු හෝ දෙයක් කරන්න පුලුවන් අපි පහුගිය සභාවෙ කතා කළා එතුමන්ලට පහසුකම් සපයන්න. ඒ සම්බන්දව සභාවෙ අවධානය යොමු කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවෙ ජනමාධ්‍යවේදීනුත් ඇවිල්ලා තියෙන නිසා මම පිට්ටනිය පිළිබඳව පිළිතුරක් දෙන්න ඕන. නැත්නම් වැරදි වැටහීමක් ඇතිවෙන්න පුලුවන්. ගෝණදෙනිය පිට්ටනිය පිළිබඳව මුල ඉදලම කතා කරන්න ගියොත් දවසකුත් මදි. ඒක දිග කතාවක්. මම 2002 වර්ෂයේ ඉදලා මේ සභාවෙ මන්ත්‍රී කෙනෙක් හැටියට හිටියා. මම දැනුවත්ව පෙරපාසලටයි, සෞඛ්‍ය මධ්‍යස්ථානයටයි යන්න දැන් ඔය තියෙන පාර තමයි තිබුනෙ. මම දන්නෙ නැහැ ඊට කලින් කොහෙන්ද ගියේ කියලා. මම 2002 ඉදල ඔතනින් තමයි පෙරපාසලටයි, සෞඛ්‍ය මධ්‍යස්ථානයටයි ගියේ. ඒ අනුව ගබඩා සංකීර්ණයේ අයිතිකරු මේ පාර භාවිතා කරන්න අපෙන් අවසර ඉල්ලුවා. මොකද එතුමා කිව්වා එතුමාලට යන්න බෙදා වෙන්කරපු නීත්‍යානුකුල පාර සභාවෙන් හිටපු සභාපතිතුමාලා කපලා ගෙපල ඇදලා පිට්ටනියට අරගෙන මෙහා පැත්තෙන් බෝක්කුවක් දාල පාර දුන්නයි කියලා. ඊට අමතරව එතුමා කිව්වා මේ පාර සංවර්ධය කරලා, පෙරපාසලේ අඩුපාඩුත් සකස් කරලා, පිට්ටනියත් සංවර්ධනය කරලා දෙන්නම් කියලා. ඉතිං අපි කැමතිවෙලා අවසර දුන්නා. මේක මේ මට ලාභ ප්‍රයෝජන ගන්න බලාගෙන කරපු දෙයක් නෙවෙයි. අපට කරගන්න බැරි එකේ කවුරුහරි කරල දෙනවා නම් අපි සතුටු වෙන්න ඕන. ඒක නිසා මම අවසර දුන්නා. ඊට පසුව දවසක් ධනංජය මන්ත්‍රීතුමා මගෙන් අහනවා පිට්ටනියෙ ගල් බාන්න අවසර දුන්නද කියලා. මම කිව්වා නැහැ කියලා. නැත්තෙ මොකද ගල් බානවයි කිව්වා. මමත් ගියා බලන්න.පිට්ටනියෙ ගල් බාලා තිබුනා.සොයල බැලුවම,පිට්ටනිය අයිනෙන් තියෙන

පාර සංවර්ධනය කරන්න ගෙනාපු ගල්. අපි ඒ පාර සංවර්ධනය කරන එක නැවැත්තුවා. ඊට පස්සෙ ඉඩම අයිති කෙනා කියනවා අපිට එහෙනම් අපේ නීත්‍යානුකූල පාර දෙන්න කියලා. එතනදි මම කිව්වා පිට්ටනිය අපට අයිති නැහැ. අපට තියෙන්නෙ භුක්තිය විතරයි. ඉඩම ප්‍රාදේශීය ලේකම්ගෙ ඒ නිසා එතුමියගෙන් අහල කරන්න කියලා. ඊට පස්සෙ මැනුම් නියෝගයක් අරගෙන ඒ අය මැන්නා. පර්චස් 73 අයිතිය ඒ අයට තියෙනවයි කිව්වා. එතකොට පිට්ටනියට බොහොම පොඩ්ඩයි ඉතුරු වෙන්නෙ. ඉතිං මම කිව්වා අපට අදාල නැහැ මැනල වැඩේ කරගන්න කියලා. ඔන්න ඕක තමයි සත්‍ය සිද්දිය.

ඒ අතරතුර ධනංජය මන්ත්‍රීතුමා මට කතා කරල කියනවා. අන්න පිට්ටනියට බර වාහන ඇතුල් කරනවා, අවසර දීලා තියෙනවද කියලා. මම කිව්වා නැහැ කියලා. මට කීපදෙනෙක් කතා කළා. ලියුමක් දීල තියෙනවයි කියනවා. මෙයාලා අදහස් කරන්නෙ මම කලින් දීපු ලිපියට අමතරව තව ලිපියක් දීල තියෙනවයි කියලා. මනින්නට කලින් අපි කැමැත්ත දීපු ලිපිය පෙන්නනවා. මම පසුවත් ලිපියක් දීල තියෙනවයි කියලා මාව අපහසුතාවයට පත්කරන්න. නමුත් අපට පිට්ටනියෙ අයිතියක් නැති නිසා බර වාහන යන එක නතර කරන්න කියලා මම ප්‍රාදේශීය ලේකම්ට දැන්වුවා. අපේ නිලධාරියෙකුත් ඒ අවස්ථාවට සම්බන්ධ කළා. එතන හිටිය අය මාව අපහසුතාවයට පත් කරල තිබුනා. මම පහත් පෙළේ වංචා දූෂණ කරන මිනිහෙක් නෙවෙයි. මම බැලුවෙ සභාවෙ සම්පත් ආරක්ෂා කරන්න. මම මේ වෙලාවෙ උත්තර දුන්නෙ ඔබතුමාගෙ කතාවෙන් වැරදි වැටහීමක් එන නිසා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම මේ වෙලාවෙ කතා කරන්න නෙවෙයි හිටියෙ. නමුත් ගෝනදෙනියෙ මගේ කොට්ඨාසෙ මගේ ගම් ප්‍රදේශයේ සිද්දියක් පිළිබඳව කතා කරපු වෙලාවෙ. මේ සම්බන්ධව මම දන්න දේ ප්‍රකාශ කිරීම මගේ යුතුකමක් වෙනවා. අපේ ධනංජය මන්ත්‍රීතුමාගේත් අපේ ගරු සභාපතිතුමාගේත් ඉතිහාසය ගැන පෞද්ගලිකව අපි කවුරුත් දන්නවා. ධනංජය මන්ත්‍රීතුමාගෙ පියා සමගත් මම මේ සභාවෙ වැඩ කරල තියෙනවා. ඒ කවුරු ගැනත් හොඳ අවබෝධයක් අපට තියෙනවා. නමුත් මම දන්න විදිහට මෙතන තියෙන්නෙ ඔබතුමන්ලා දෙන්නම කතා කරපුවට වඩා එහා ගියපු කතාවක්. අපේ ප්‍රාදේශීය සභාව දැනට කොටසක් භුක්ති විඳින උඩුගම ඇප්තොප්වත්ත ඉස්සර බද්දට අරගෙන අයිතිය තිබුනෙ කරුණාරත්න කියල මහත්මයෙකුට. ඒ මහත්මයම තමයි ඒ කාලේ රජයේ වෙන්දේසියකින් නීත්‍යානුකූලව මේ වී ගබඩාව අරගෙන තිබුනෙ. ගරු සභාපතිතුමනි, ගරු ධනංජය මන්ත්‍රීතුමනි, ගෝනදෙනියෙ වී ගබඩාව විතරක් නෙවෙයි එක්තරා කාලසීමාවක මුලු ලංකාවෙම තිබුන පාඩුපිට අතහැරදාපු වී ගබඩා වෙන්දේසි කළා. ඒ වෙන්දේසියෙන් ගත්තෙ මේ කරුණාරත්න කියන මහත්මයා. ඔබ කියන ඔය දේශපාලන චරිතය නෙවෙයි. ඇප්තොප්වත්ත කරුණාරත්න මහත්මයට බද්දට දීල තිබුන කාලෙ. ඒ කාලෙ හිටපු දේශපාලන අදිකාරිය විසින් දේශපාලන බලතල පාවිච්චි කරල ඇප්තොප් වත්ත බලෙන් ඇල්ලුව. ඇප්තොප් වත්ත දේශපාලන අධිකාරිය බලෙන් අල්ලන වෙලාවෙ මිනිස්සු හිතුවා මේ වී ගබඩාවත් ඇප්තොප්වත්තෙම කොටසක් තමයි කියලා. මොකද අයිතිය කරුණාරත්න මහත්තයට තිබුන නිසා. ඒක නිසා මේකත් අල්ලගන්න ආවා. දේශපාලන මංකොල්ල කෑමක් කරන්න හැදුවා. නමුත් කිසිම කණ්ඩායමකට ඒක කරන්න බැරිවුනා. ඊට පස්සෙ කරුණාරත්න මහත්මය සින්නක්කරව ගත්තු මේ වී ගබඩාව ආනන්ද කාරිය වසම් මහත්මයට විකුනුවා.

ගිය සභාවාරෙදි සම්බන්ධීකරණ කමිටුව පැවැත්වුනේ ගාල්ලෙ ගෝල් ඞී හෝල් එකේ. මමත් විපක්ෂ නායක විදිහට සහබාගි වුනා. ඒ සම්බන්ධීකරණ කමිටුවෙදි රජයේ ආයතන ගැන කතා වුනා. එතනදි මහින්ද රාජපක්ෂ මහත්මයා පින්තූරයක් තිරය මතට දාල ඇහුවා කවුද මේ විමලගේ කියන්නෙ කියලා. එතකොට ධනංජය මන්ත්‍රීතුමාගෙ තාත්තා කිව්වා විමලගේ නෙවෙයි විලේගේ ඒ මගේ නම කියලා. හරි සභාපතිතුමා කියල මහින්ද රාජපක්ෂ මහත්මය කිව්වා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඔබතුමාගෙ

තාත්තා අඳුනනවා. එවෙලෙම ආනන්ද කාරියවසම් මහත්මයා දැන් වී ගබඩාවෙ වර්තමාන හිමිකරු එවකට ඒ කණ්ඩායමේ පළාත් සභා මන්ත්‍රීවරයෙක්. එතුම නැගිටලා කිව්වා මේක රජයේ දේපොලක් නෙවෙයි මේ මගේ පුද්ගලික දේපොලක්. මම සින්නක්කරව අසවල් කෙනාගෙන් ගත්තෙ කියලා. හරි හරි ආනන්දල ගැන අපි දන්නවා ඔය ගොල්ලන් අපට ගොඩක් උදවු කරල තියෙනව කියලා. මහින්ද මහත්මයා දෙන්නවම සැනසුවා. ඒක පුද්ගලික දේපොලක් විදිහට එදා පිළිගත්තා. මම මේ මගේ ඇස් දෙකෙන් දැකපු දේ කිව්වෙ. ඊට පස්සෙ ඔබතුමාගෙ පියා සභාපතිතුමා විදිහට ඉන්න කාලෙ සභාවෙ වියදමින් ඒකට අවශ්‍ය සිලින්ඩර් දාල ආනන්ද කාරියවසම් මහතාට, පෙරපාසලට සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයට යන්න පාරක් වෙන් කරල දුන්නා. නමුත් ගරු සභාපතිතුමනි, වී ගබඩාවට අයිති නියම පාර ඕක නෙවෙයි. ඔය ප්‍රශ්නෙ වෙද්දි මමත් හොයල බැලුවා. වී ගබඩාවට අයිති පාර කෘෂිකර්මය අසලින්ම ඒ කාලෙ උඩින් පාරක් තිබිල තියෙනවා. පහලින් කුඹුරක් තිබිල තියෙන්නෙ. ඒ කාලෙ පාලන අධිකාරිය ඒ පාර කපල කුඹුර ගොඩ කරලා. දැන් වී ගබඩාවට යන්න පාරක් නැහැ. නමුත් මේ දැන් භාවිත කරන පාර පාවිච්චි කරන්න කියලා ඒ වෙලාවෙ අවසර දීලා තියෙනවා. ගිය මාසෙ වෙනකම් ඒක පාවිච්චි කළා. මමත් ඔය පාර පාවිච්චි කරල තියෙනවා. ගරු සභාපතිතුමා 2002 ඉදල මේ සභාවෙ ඉන්නවා. ඔබතුමාවත් මේ ගරු මන්ත්‍රීතුමාලවත් පෙරපාසලට යන්න ඔය පාර හැර වෙන පාරක් භාවිතා කරල තියෙනවද? මම හොඳට මේ පිළිබඳව හොයල බලල කතා කරන්නෙ. මෙතන ඉන්නවා ඉතිහාසෙ හිටපු සභාපතිවරු ඒ කිසිම කෙනෙක් මේ පාරෙ හැර ඔය කියන පාරක ගිහිල්ල තියෙනවද? නැහැ. මට මතක ඇතිකාලෙ ඉදල තිබුන පාර තමයි දැනටත් තියෙන්නෙ. ඔය පාර හදලා පිට්ටනියට හානියක් වෙනවනම් මමත් ඔබතුමත් සමග එකට ඉන්නවා. මේකෙන් ක්‍රීඩාංගනයට හානියක් වෙනවනම් මොන කොම්පැනිය වුනත් අපිත් විරුද්දයි. හිතේ එකක් තියාගෙන වෙන එකක් නෙවෙයි මම කියන්නෙ මම දන්න සත්‍ය සිදු වීම. ඒකට සාක්ෂි මේ සභාව ඇතුලෙම තියෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමාගෙන් හා ගරු ලේකම්තුමියගෙන් අවුරුදු ගණනක් තිස්සෙ අපි ඉල්ලීමක් කළා. අපි කතා කරන දේවල් විෂයෙන් පිට භාහිර ආයතන ගැන කතා කරනවානම් ඒ ගැන අදාල ආයතනයට දැනුම් දීල අපටත් දැනුම් දෙන්න කියලා. ඉතිං මම කතා කළ ඉහලගම සහ දිග්දොල බස් රථ ගමනාන්තයට ධාවනය නොවීම සම්බන්ධ ගැටලුවට අදාලව ඒ ආයතනයට ලිපියක් යවල තිබුනා. මට ඊයෙ දිනයෙදි ලිපියේ පිටපත ලැබුනා. ඒ සම්බන්ධව පසු විපරමක් කරලා යම් පිළිතුරකුත් ලබාගෙන ඒකත් ඉදිරි සභාවකට ඉදිරිපත් කරන්න කියලා මේ අවස්ථාවෙ ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි ගිය සතියෙ සඳුදා පොල දවසෙ මම දැක්කා උඩුගම ක්‍රීඩා පිටිය වහලා. වාහන දාන්න නොදී ආරක්ෂා කරල තිබුනා. මම හිතුවා අපි මේ සභාවෙ දිගින් දිගටම කතා කරපුවයි ප්‍රතිඵලයක් විදිහට යම් පියවරක් අරගෙනෙයි කියලා මම ඉතාමත් සතුටු වුනා. නමුත් ඊයෙ පොලට යන කොට ඒක ඉවරයි. පහුගිය සතියෙ නිදහස් දවසෙ ක්‍රීඩා උත්සවයක් පැවැත්වීම සඳහා මුදල් බැදල වෙන්කර ගත්ත පිරිසක් ඒ අයගෙ ආරක්ෂාවට වහල තියෙන්නෙ. ඒ ක්‍රමේ අපි දිගටම භාවිතා කරල අපේ සියලුම ක්‍රීඩා පිටි ආරක්ෂා කරන්න වැඩපිළිවෙලක් සභාවෙන් කරන්න කියල ඉල්ලා සිටිනවා. වාහන ගාල් කරන්නවත් ගවයන්ට ගාල් වෙන්නවත් නෙවෙයි ක්‍රීඩාව දියුනු කරන්න මේ සභාවෙ අවදානය යොමු කරල ඒ ස්ථාන ප්‍රයෝජනයට ගන්න.

අවසාන වශයෙන් ඊයෙ නාගොඩ තිබුන සම්බන්ධීකරණ කමිටුව ගැන කිව්වොත් ගරු සභාපතිතුමනි ඔබතුමාලගේ රජය පත්වෙලා නාගොඩ තියපු පළමු සම්බන්ධීකරන කමිටුව. ඔබතුමාල ඒක සාර්ථකව පැවැත්තුවයි කියල විශ්වාස කරනව ඇති. නමුත් ඒකෙ නීත්‍යානුකූල නොවන කටයුතුත් සිදු වෙලා තියෙනවා. ඒකට අනාරාධිත අයත් සහභාගිවෙලා තියෙනවා. දේශපාලන පක්ෂවල නියෝජිතයන්ට විතරයි යන්න පුලුවන්. පහුගිය කාලෙ චක්‍රලේඛ වලින් යම් කණ්ඩායම් නම් කරල තියෙනවා. ඒකට යන්න පුලුවන් ඒ අයට විතරයි. නමුත් සියලුමදෙනා ගිහිල්ලා ඒක දේශපාලන තත්වෙකට පත්කරගෙන තියෙනවා. අපි ඒ ගැන කණගාටුවෙනවා. ඔබතුමාලගෙ මංගල සම්බන්ධීකරන කමිටුවම

අසාර්ථකයි සහ නීති විරෝධියි කියලා මම මේ ගරු සභාවේ ප්‍රකාශ කරනවා. මම ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කරල ඇහුවා. එතකොට කිව්වා අපි ආරාධනා කළේනම් අසවල් අයට විතරයි ඊට වඩා වැඩි පිරිසක් ඇවිල්ලා තිබුන කියලා. දේශපාලන අතගැසීම් වැඩි නිසා එතුමියලට ඒක හරියට කර ගන්න බැරිවුනා. අපි සතුටු වෙනවා අවුරුදු හතරහමාරක් සම්බන්ධීකරන කමිටු වැදගත් ආකාරයෙන් කරන්න අපට හැකිවුනා. ඔබතුමාලගෙ මංගල සම්බන්ධීකරණ කමිටුවම අසාර්ථකයි කියල මම මේ අවස්ථාවෙ ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීතුමන්ලගෙන් අවසරයි. මම කිසිම මන්ත්‍රීවරයෙක් කතා කරනකොට බාධා කරන්නෙ නැහැ. ඒ නිසා මගේ කතාවට බාධා කරන්න එපා. ඔබට යම් ප්‍රශ්නයක් තියෙනවනම් පසුව මට කියන්න කියල ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, පසුගිය දවසෙ අපේ රජයේ පළමු සංවර්ධන කමිටු රැස්වීමට සහභාගිවෙලා. මට විසඳගන්න බැරුව තිබුන අපේ ගමේ ප්‍රශ්නයක් ඒ වෙලාවෙම විසඳා ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදීම පිළිබඳ මම ඉතාම සතුටට පත්වෙනවා. දැන් මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුනා. කමිටුවට මන්ත්‍රීවරුන් කැඳවන්න එපා කියලා. නමුත් ඒ රජයේ වැඩපිළිවෙල ජනතාව ප්‍රතික්ෂේප කරපු නිසා තමයි වෙන රජයකට බලය ලබාදීලා ඒ කමිටුව පැවැත්වීමට ඉඩ සලසා දීල තියෙන්නෙ. ප්‍රාදේශීය සභාවල වැඩිපුරම ඉන්නෙ පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු. ප්‍රාදේශීය සභාව පරාජයට පත්වුන රජයක් තමයි ආණ්ඩුව කරගෙන ගියේ. අපේ ප්‍රශ්න මේ කමිටුවට ඉදිරිපත් කරනකොට එදා පැවති රජයට ලොකු ප්‍රශ්නයක් වුනා. එතනදි එතුමන්ලට තිබුන පීඩනය මගහරවගන්න චක්‍රලේඛ සකස්කළාට, මම හිතනවා, මම හරියටම නීත්‍යානුකූලව කියන්න දන්නෙ නැහැ. ඒ රජය පෙරලීමත් සමග නව රජයේ ප්‍රතිපත්තිත් එක්ක අපට කමිටුවට යාමට අවසරයක් ඇතියි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දැන් සුලු මොහොතකට කලින් කතා වුන වී ගබඩාව. මට මතක හැටියට රජයේ දේපොලක් හැටියට පවරා ගැනීමට සභාවෙ යෝජනාවක් තුලින් සම්මත කරගන්න කිව්වා. ඒ අනුව ඒක තනි පුද්ගලයෙකුට යනවට වැඩිය සමස්ථ සමාජයටම ගැලපෙන විදිහට රජයට පවරා ගැනීම සුදුසුයි කියලා මම හිතනවා. ඒක අදාල කොට්ඨාසෙ මන්ත්‍රීවරයා යෝජනාවක් ගෙනේවි. තනි පුද්ගලයෙක් භාවිතා කරනවට වැඩිය ඒක රජයක් විසින් හදපු ගොඩනැගිල්ලක් නම්, ජනතාවගෙ අවශ්‍යතාවයක් තුල තමයි නිර්මාණය වෙන්න ඇත්තෙ. ඒක අපට අවශ්‍යයි. නමුත් ඒ කාලය තුල බලධාරීන්ගෙ ඕනෑ එපාකම් තුල වී ගබඩාව යම් පුද්ගලයෙකු සතු වෙන්න ඇති. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒ යෝජනාව මේ සභාවෙ සභාගත වුනොත් ඒකට සියලු මන්ත්‍රීවරුන්ගෙ කැමැත්ත ලබාදෙන ලෙස කාරුණිකව සිහිපත් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පසුගිය සභාවාරෙදිත් මම සාකච්ඡාවට ගත්තු කරුණක් තමයි. මගේ ප්‍රදේශයේ පුරංකුඹුරු බවට පත්වෙලා තියෙන කුඹුරු යාය අස්වැද්දීමට ඉඩ සලසා දෙන්න කියන කාරණය. අපේ ගරු සභාපතිතුමන් මේ කාරණය කමිටුවෙදි ඉල්ලීමක් කරල මට තාවකාලික විසඳුමක් නෙවෙයි. ඒකට නීත්‍යානුකූල විසඳුමක් ලැබෙන තෙක් කුඹුරු කරගෙන යාමට හැකි විසඳුමක් එතුමා මට ලබා දුන්නා. 2002 අවුරුද්දට පෙර ඉදලම මේ ප්‍රශ්නෙ තිබුනා. 2002 අවුරුද්දෙ ඉදල මම මේකට මැදිහත් වුනා. ඒ ප්‍රශ්නෙ තමයි ඇතා වැටුන පීල්ල කුඹුරුයාය. ඇතා වැටුන පීල්ල ප්‍රධාන මංසන්දියේ ඇලවල් තුනක් ගලා බසිනවා. එක ඇලක් දයානන්ද වීරසිංහ කියන කෝටිපති ව්‍යාපාරිකයෙක්ගේ තනි වුවමනාවට කුඹුරෙන් අක්කර භාගයකට වැඩිය ගොඩ කරලා ඒ ඇල මාර්ගය වසා තැබීම. ඊට පස්සෙ මම විවිධවූ ආයතන සමග, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, නීතිය තුලින් උසාවියට ආදී හැම තැනම ගිහිල්ල පිළිසරණක් නැති තැන. 2008 අවුරුද්දෙ මම උපවාස කරලා ඒ ඇල මාර්ගය නැවත පිළිසකර කර ගත්තා. දැන් වර්ථමානය වන විට නැවතත් ඒ පුද්ගලයා

විසින් ඇල මාර්ගය වසාගෙන සිටිනවා. ගොවිජන සේවා එකේ පහල මට්ටමේ සියලු නිලධාරින් මේකට විරුද්ධයි. ඒ අයගෙ කැපවීම කොච්චර තිබුනත් ගරු සභාපතිතුමනි ඉහලට යනකොට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වෙනම නීති නිලධාරීන් ඉන්නවා. ඒ අයගෙ දූර්වලකම, මම දන්නෙ නැහැ මොන හේතුවක් මත නිහඩ වෙනවද කියලා. මට ඒ අයට චෝදනා කරන්න බැහැ පගාව ගන්නවා කියලා. නමුත් අපට ප්‍රශ්නයක් තියෙනවා මෙහෙම වෙන්නෙ ඇයි කියලා. උසාවියට ගියාම අපි නඩුව පරාද වෙනවා. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට සහ ගොවි සංවිධානෙට විරුද්ධව දාපු නඩු බද්දෙගම උසාවියෙ හා මහාධිකරණයේ තියෙනවා. ඉහල නිලධාරීන් හරියට නඩු කියන්නෙ නැති නිසා අපේ ගමේ මේ වෙන කොට කුඹුරු අක්කර 100 වැඩිය වගා කරන්න බැරි වෙලා තියෙනවා. මේ වෙනකොට මීට පල්ලෙහා වසමෙ මේ අවුරුද්දෙ කුඹුරු අක්කර 184 වගා කරල තියෙනවා. ඒ 184 කෘෂීන්ගෙන් කුරුල්ලන් ගෙන් අයාලේ යන ගවයන් ගෙන් බේර ගන්න මිනිස්සු පුදුමාකාර විදිහට මහන්සි වෙනවා. මම මේ සභාවෙ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා අපේ ගමේ මේ ඇල මාර්ගය පිළිසකර කරගන්න අපට උදවු කරන්න. මේ සභාවෙන් කළහැකි යම් උපකාරයක් කරන්න. ඒ වගේම ඒ කාලෙ තිබුන මාධ්‍ය ආයතන කීපයකටම මම කතා කළා. ඔවුන් හරහා ජනතාව දැනුවත් කරල ඉහල නිලධාරීන් දැනුවත් කරන්න උත්සාහ ගත්තා. නමුත් එකම අවස්ථාවකවත් එක මාධ්‍යවේදියෙක්වත් අපේ දිහා බැලුවෙ නැහැ. 2008 ඉදලා මේ වනතුරු එකම මාධ්‍ය ආයතනයකින්වත් මේ සම්බන්දව සදහන් කරලා පෙන්නුවෙ නැහැ. එහෙම පෙන්නුව නම් යම් නිලධාරියෙක්ගෙ ඇහැ ඇරිලා මේ ගමට වෙන හානිය නවත්වලා ජනතාවට සහනයක් ලබා දෙන්න තිබුනා. අද දවසෙ මෙතන ඉන්න මාධ්‍යවේදීන් දෙපලගෙන් මම ඉල්ලා සිටිනවා. මේ සම්බන්දව ස්ථානීය පරීක්ෂාවක් කරල රූප රාමු අරගෙන මාධ්‍යට දෙන්න. පුලුවන්නම් මේ උදවුව කරන්න. පරණතානායම්ගොඩ කොට්ඨාසෙ ජීවත්වෙන විශාල පිරිසක් ඔය කුඹුරුවලින් තමයි රැකෙන්නෙ. මේ වගේ කටයුත්තකට ඔබ දායක වෙනවනම් කාලෝචිතයි කියලා මම හිතනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මේ සභාවෙන් ආදාහනාගාරයක් ඉදිකරනවා වගේම පරණතානායම්ගොඩ කොට්ඨාසයට සුසාන භූමියක් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කළා. පරණතානායම්ගොඩ ප්‍රදේශය මේ වෙනකොට ජනාකීර්ණ වෙමින් පවතිනවා. ඒ නිසා හිස්ව තියෙන ඉඩම් ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩුවෙමින් පවතිනවා. ආදාහනාගාරයකට ගෙනියගන්න බැරි මිනියක් වලලාගන්නවත් තැනක් නැහැ. ඒ නිසා පොදු සුසාන භූමියක් ලබා දෙන්න කියල මම කමිටුවෙදි සිහිපත් කළා. කමිටුවෙදි මට ඒකට පිළිතුරක් නම් ලැබුනෙ නැහැ. නැවත ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පුලුවන්නම් අපට වටවල වතු සමාගමේ තියෙන වගා කටයුතු නොකරන බිම් කොටසක් ඒ ප්‍රදේශයෙන් අපට පොදු සුසාන භූමියක් සදහා ලබා දෙන්න කියල සිහිපත් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි සභාවේ නිහඩතාවය රකිමින් මන්ත්‍රීවරුන් මට දුන්න සහයෝගය නිසා මම ඉමහත් සතුටට පත්වෙනවා. ගරු සභාපතිතුමාට වගේම ගරු මන්ත්‍රීවරුන්ටත් මම ස්තූති වන්ත වෙනවා. ඒ වගේම මම කියපු ප්‍රශ්නයට මන්ත්‍රීවරුන්ගෙ සහයෝගය ලබා දෙන්න. මුහුණු පොතෙන් හරි අපි ඉදිරියෙදි මේ කටයුත්ත ජනතාව අතරට අරගෙන ගිහිල්ල ඇල මාර්ගය එලිපෙහෙලි කර ගැනීමට උදවු කරන්න කියන කාරුණික ඉල්ලීම කරමින් නිහඩ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මමත් රජයේ සමෘද්ධි සංවර්ධන නිලධාරියෙක් වශයෙන් අවුරුදු 18 ක් සංවර්ධන කමිටු රැස්වීම්වලට සහභාගිවෙලා තියෙනවා. ඒ අනුව ඊයෙ පැවති සංවර්ධන කමිටු රැස්වීම ඉතාම සාර්ථකයි. මොකද අපට විසඳගන්න තිබුනෙ ඉතාම දරුණු පැරණි ප්‍රශ්නයක්. මාපලගම මාර්ගයේ වතුරෙන් යටවෙන ස්ථාන කීපයක් පිළිබඳව එහිදී සාකච්ඡා වුනා. එතනදි සංවර්ධන කමිටුවෙ සභාපති වශයෙන් හිටපු, අපේ ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා කාර්මික නිලධාරී නැගිටුවලා මාර්ගය යටවන ස්ථාන පිළිබඳව ඇහුවා. එතනදි ඔහු කියනවා එම ස්ථාන

පිළිසකර කරන්න මුදල් තිබුනලු. ඒකට විරෝධතාවක් ප්‍රකාශ කරන බව තමයි කියන්නෙ. සොහොනක් හදපු එක පිළිබඳව හා සියලු තොරතුරු කියනවා. නමුත් ඒ නිලධාරී මහත්මයා මගහැරීමක් කරපු බව තමයි එතනදි ඇහවුනේ. ඒ ස්ථානයේ ඒ කටයුත්ත කරන්න පුලුවන් තත්වයක් තිබිල තියෙනවා. කොන්ක්‍රීට් දාලා පාර දෙපස කානු පද්දතියක් හදලා ඒ සිද්දිය අවසන් කරන්න තිබුන කාලය නිකරුනේ ගෙවිල තියෙනවා. ඔහුගෙන් ප්‍රශ්න කරන කොට ඒක පැහැදිලි වුනා. පසුව යක්කලමුල්ලෙ මාර්ග සංවර්ධන අධිකාරියෙ ගරු සභාපතිතුමාට චන්දිම මහත්මාට එවලෙම දැනුම් දීමක් කළා. මේ සම්බන්ධව සොයලා බලලා මේ මාර්ගය දෙපස අබේසුන්දර මහත්මයාගේ නිවස අසලත් අලුත් පහල තියෙන කොටසත් ඉක්මනින්ම පිළිසකර කරලා වතුර බස්සන්න පුලුවන් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා. ඊයෙ පවත්වපු කමිටුව නීති විරෝධී කියල විපක්ෂ මන්ත්‍රීවරු ප්‍රකාශ කළත් සාර්ථක භාවයකින් හැමදේම විසඳුනා. අදාල නිලධාරීන් හෝ අමාත්‍යාංශ ලේකම් වරුන් එවලෙම සම්බන්ධ කරල තමයි කතා කළේ. ඊයෙ රැස්වීමෙ හිටපු ජනතා විමුක්ති පෙරමුණේ ජයවීර මන්ත්‍රීතුමා ඒක දන්නවා.

ඒ වගේම මාපලගම හා තල්ගස්වල චිත්‍ර ඇඳල නගර අලංකරණය කරපු නිසා දැන් දැන්වීම් අලවන්න තැනක් නැහැ. ඒ නිසා මාර්ගවල සවිකරලා තිබිල ගලවගෙන ඇවිල්ලා මේ සභාව පිටුපස දාල තියෙන ඒ පුවරු දෙකක් මාපලගම හා තල්ගස්වල නගර දෙකේ දැන්වීම් ඇලවීම සඳහා සවිකරල දෙන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා. නැත්නම් චිත්‍ර ඇඳල අලංකරණය කරපු තාප්පවල වැඩිකල් යන්න ඉස්සර වෙලා දැන්වීම් පෝස්ටර් අලවන්න පටන් ගනීවි. මට කියන්න තියෙන්නෙ ඔන්න ඔය කරුණු ටික තමයි සියලු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අද උදෙන්ම මම ලිපියක් සභාපතිතුමා වෙත ඉදිරිපත් කළා. මොකද දැඩි නියගයත් සමග පවතින කාලගුණ තත්වය නිසා කොට්ඨාසයේ විශාල පිරිසකට ජලය පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා. පසුගිය කාලය තුලදි අපි ගඟ ආශ්‍රිත ප්‍රදේශවල තොටුපොලවල් සාදා ගැනීම සඳහා පතිපාදන වෙන් කර ගැනීමක් සිදු වුනත් අයහපත් කාලගුණික තත්වය නිසා අපට තොටුපොලවල්වල වැඩ නිමා කරගන්න හැකියාව ලැබුනෙ නැහැ. පටන් ගන්නටවත් සිද්ද වුනේ නැහැ. ඒක නිසා අද ඒකෙ අනිත් පැත්ත තමයි සිදුවෙලා තියෙන්නෙ. ගරු සභාපතිතුමනි, නියඟය නිසා ජනතාවට දෛනික කටයුතු සඳහා ජලය ලබා ගැනීමට හැකියාවක් නැතිවෙලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කැප්පිටියාගොඩ කොට්ඨාසෙ සෙනවිරත්න මාවතේ තියෙන තොටුපොල කුමන හෝ විදිහකින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාවේ අනුග්‍රාහකත්වය ලබාදෙන්න කියලා ගෞරවණීයව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඊයෙ පවත්වන ලද සංවර්ධන කමිටුව ගැන අපි ගොඩක් සතුටු වෙනවා. පළවෙනි සංවර්ධන කමිටුව තුලින් සියලුම දෙනාගෙ කොට්ඨාසවල තිබුන කටයුතු ගොඩක් දුරට නිරාකරණ කර ගැනීමට හැකියාව ලැබුනයි කියලා අපි සතුටු වෙනවා. මොකද කැප්පිටියාගොඩ ප්‍රදේශය තුල ජල ව්‍යාපෘතියක් පටන්ගෙන තිබුනා. ඒ ජල ව්‍යාපෘතිය පිළිබඳව ඇත්තටම කිසිම විදිහකින් අපි දැනුවත් වෙලා හිටියෙ නැහැ. ඊයෙ දවසෙ ඒ ජල ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කළා. ඒ ව්‍යාපෘතිය අඩපන වීමක් පිළිබඳව සඳහන් කළා. ඊයේ තීරණය මත වැඩ නිමාවු තැන සිට ඉතිරි වැඩ කොටස කර ගන්න යම්කිසි ප්‍රතිපාදනයක් ලබා දෙන බවත් අපට දැන ගන්න ලැබුනා. ඇත්තටම ඒ ජල ව්‍යාපෘතිය පිළිබඳව අපි දැනගෙන හිටියෙ නැහැ. ඊයෙ සංවර්ධන කමිටුවට සහභාගි වීමත් සමග තමයි ඒ පිළිබඳවත් අපි දැනුවත් වීමක් වුනේ.

ඒ වගේම සපිරිගමක් යටතේ කරන මේ වැඩසටහන් පිළිබඳව, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පය යටතේ මේ සිදුවෙන සියලුම සංවර්ධන කටයුතු පිළිබඳව, විශේෂයෙන්ම අපි

ඇගයීමට ලක් කරනවා වගේම ඒ පිළිබඳ සතුටු වෙන ගමන්ම සියලු දෙනාටම සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි මීට පෙර දහ පහළොස් වතාවක් විතර සභාවෙ කතා කරපු දෙයක් පිළිබඳව තමයි පුංචි දෙයක් ඔබතුමාගෙන් අහගන්න තියෙන්නෙ. හෝමදොල දූරියන් ගහ පිළිබඳව කවුරුත් දන්නවා. ගරු සභාපතිතුමනි අදත් ඒ ආච්චි කුදු ගැහිල උඩුගමට එන්න ආවා. දූරියන් ගහ පිළිබඳව සභාව දැනුවත් කරන්න. මම ඇත්තටම එතනදි කිව්වා ආත්තම්මෙ සභාවට ඇවිල්ලා වැඩක් නැහැ. සභාපතිතුමාට කිව්වත් මම දන්නෙ නැහැ කරන්න උනන්දුවක් නැද්ද කියලා. එතුමත් උනන්දු වෙනව වගේ පෙන්නනවා. කරනවද කියල කියන්න දන්නෙ නැහැ කියලා. ඒක නිසා සභාපතිතුමනි මේක විහිලුවකට ගන්නෙ නැතිව. ඒ දූරියන් ගහ ඉවත් කරල දෙන්න දැන් ආයෙමත් දූරියන් මල් පිපෙනවා. ඒක නිසා අවුරුදු දෙකක් පරන කුනු ගොඩවල් අපට වැඩක් නැහැ. ගරු සභාපතිතුමනි, අවුරුදු දෙක තුලම ඉල්ලීම් කළා දූරියන් ගහ ඉවත් කරල දෙන්න කියලා. නමුත් ඒකට කිසිම වැඩපිළිවෙලක් ඔබතුමා දැනටත් ක්‍රියාත්මක කරලා නැහැ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් පුංචි දෙයක් දැනගන්න කැමතියි. මේ මාසෙ හතර වැනිදා උඩුගම මහජන ක්‍රීඩාපිටියෙ පොඩි ස්කැවේටරයක් දාලා වලවල් හාරන්න කටයුතු කළා. ඒ ගැන මම අපේ උප සභාපතිතුමාටත් අපේ කොට්ඨාසෙ මන්ත්‍රීවරුන්ටත් කතා කරලා කියල ඔබතුමාගෙනුත් ඇහුවා. ස්කැවේටර් දාල වලවල් හාරලා පැල හිටවන්න ඔබතුමා උසාවියට ලිපියක් දීලයි කියල තමයි ආරංචිය ආවෙ. ඊට පස්සෙ ගරු සභාපතිතුමනි, සභාවෙන් අපි තාක්ෂණ නිලධාරියෙක් යවලා වෙරංග මන්ත්‍රීතුමත් එතනට ගියා. අපි කියන්නෙ සභාපතිතුමනි එතන ක්‍රීඩාගාරෙ පිටිපස්සෙ පැල ඉන්දුවට කමක් නැහැ. උඩුගම මහජන ක්‍රීඩාංගනය අක්කර තුන හතරක ක්‍රීඩා පිටියක් නෙවෙයි. ගරු සභාපතිතුමනි සෙල්ලම් කරන්න තියෙන ප්‍රමාණය අක්කරයකුත් නැහැ. ඒකෙ පිච් එක තියෙන්නෙත් වොලි බෝල් කනුව තියෙන්නෙත් තාප්පෙ ඉදල අඩි 20 ක් 30 ක් දුරින් ඒක අයිනෙ ගස් ඉන්දුවයින් පස්සෙ සභාපතිතුමනි සෙල්ලම් කරන්න නෙවෙයි කිසිම දේකට ඉඩ නැහැ. සභාපතිතුමනි, ඔබතුමාට ක්‍රීඩා පිටි පිළිබඳවමයි පුංචි අවුලක් තියෙන්නෙ. ගෝනදෙනිය ගත්තත් මාපලගම ගත්තත් හැම තැනම ක්‍රීඩා පිටි ප්‍රශ්නයක් තියෙන්නෙ. ඒක නිසා ඉල්ලීමක් කරන්නෙ උඩුගමට තියෙන සම්පතක් උඩුගම මහජන ක්‍රීඩාංගනය. ඒවගේ දෙයක් කරන කොට ඇත්තටම හොයල බලල කටයුතු කරන්න.

ඒ වගේම තමයි ඊයෙ සම්බන්ධී කරණ කමිටුව ගැන කතා කළා. ඇත්තටම ඒක අපට ලබා දුන්න ලොකු අවස්ථාවක්. අපට එතනට ආරාධනා තිබුනත් නැතත් ගිය ආණ්ඩුව විසින් අපිව එතන හිර කරලා අපට එතනට යන්න නැති කරලා තිබුනා. නමුත් අපේ ආණ්ඩුව තුලින් කරන ඒ කර්තව්‍යයේදී මම හිතන්නෙ ඊයෙ ගියානම් එක්සත් ජාතික පක්ෂෙ මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ටත් එතන වාඩි වෙන්න අවස්ථාව තිබුනා. එතනදි අපි විශේෂ අවස්ථාවක් දකින්නෙ ගරු සභාපතිතුමනි, අපට එතනට ගිහිල්ලා අපේ කොට්ඨාසෙ තියෙන අඩුපාඩු පෙන්නල දෙන්න හැකියාව ලැබුනා. එතනදි අපි දැකපු හොඳම දෙයක් තමයි අපේ හිටපු ජ්‍යෙෂ්ඨ සභාපතිතුමා අජිත් එඩේරආරච්චි මැතිතුමා රමේෂ් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා. උඩුගම පොල් ඉඩමේ අක්කර තිස් ගණනම අපේ සභාවට පවරා දෙන්න කියලා. ගරු සභාපතිතුමනි අපි වෙනුවෙන් අපේ සභාව වෙනුවෙන් එඩේර ආරච්චි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා. අපි එතනදි දැකපු ලොකු දේවල් ඒවා. ඒක නිසා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාට ගෞරයක් විදිහට ඒකත් සිහිපත් කරනවා. ගරු සභාපතිතුමනි ඒක නිසා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සියලුම මන්ත්‍රීවරුන්ට යන්න පුලුවන් සම්බන්ධී කරණ කමිටුවක් හදල දෙන්න. අපි කුහක විදිහට බලන්න හොඳ නැහැ. අපේ කොට්ඨාසෙ තියෙන අඩු පාඩු අපට පෙන්නල දෙන්න තියෙන හොඳම අවස්ථාව. අපි කොච්චර මෙතන කතා කළත් මෙතන ක්‍රියාත්මක වෙන්නෙ නැහැ අපට දූරියන් ගහක් මෙතනදි

අයින් කර ගන්න බැරිනම් අපට අතනදි එහෙම දෙයක් වත් කතා කරන්න අවස්ථාව ලැබෙනවා. හෝමදොල කොට්ඨාසෙ පිළිබඳව දිස්ත්‍රික් නායකයො ඇමතිවරු ඉස්සරහ අපට අදහස් ඉදිරිපත් කරන්න හැකි වුනා. ඒක නිසා ඒක හොඳ අවස්ථාවක් මම එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලන්නෙ අපි මේක වැරදි විදිහට බලන්නෙ නැතුව අපි සියලු දෙනා එකතු වෙලා අපි සියලු දෙනාට යන්න පුලුවන් විදිහෙ වටපිටාවක් හදාගමු. අපි ගිය ආණ්ඩුව වගේ ආණ්ඩු පක්ෂෙ ටික විතරක් එතනට හිර කරගෙන ජනතා විමුක්ති පෙරමුණේ එක මන්ත්‍රීතුමයි ඉන්නෙ අනිත් පක්ෂෙ එක මන්ත්‍රීතුමියයි ඉන්නෙ ඒ අයට ඒ අවස්ථාව හම්බ වෙනවා. අපේ 15 ගෙන්ම දෙන්න තුන්දෙනාටයි අවස්ථාව ලැබෙන්නෙ. අපේ අනිත් කොට්ඨාස පිළිබඳව කතා කරන්න කිසි කෙනෙක් නැති වෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඒ අවස්ථාව ඉදිරියටත් අපට ලබා දෙන්න. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ අවස්ථාව ලබා දෙන්න. ඊයෙ අවස්ථාවෙන් අපි ප්‍රයෝජන ගත්තා අපි දන්නෙ නැහැ ක්‍රියාත්මක වේද කියලා. අපේ කොට්ඨාසෙ දේ නොකෙරුනත් අපි දැකපු හොඳම දේ තමයි අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව එතුමාට ගෞරවයක් විදිහට නැවත වාරයක් මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, දූරියන් ගහ පුලුවන්නම් ඔබතුමාගෙ කාලෙ ඇතුලත ඉවත් කරලා දෙන්න. ගරු සභාපතිතුමනි උඩුගම දෙසත් ඇස යොමු කරන්න. මම ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්නෙ අපි උඩුගම මන්ත්‍රීවරු නව දෙනෙක් ඉන්නවා. අපේ ඉල්ලීම්නුත් අහක දාන්න එපා ගරු සභාපතිතුමනි, අපේ ඉල්ලීම් ඉටු කරන්නත් ඔබතුමා කටයුතු කරන්න. බලන් යද්දි අපේ ඉල්ලීම් පොඩ්ඩක් පස්සට යනවදෝ කියලා මතයකුත් තියෙනවා. මම අවුරුදු දෙකක් මෙතනට ඇවිල්ල ඉල්ලීම් කළා. දූරියන් ගහ අයින් කරල දෙන්න කියලා. අනතුරක් තියෙන දූරියන් ගහ අයින් කරල දෙන්න බැරිනම් මොකක්ද සභාපතිතුමා තත්වෙ. ගරු සභාපතිතුමනි මම ඊයෙ සම්බන්ධීකරණ කමිටුවෙදිවත් ඒක ඉල්ලුවෙ නැත්තෙ සභාවටත් ඔබතුමාටත් හොඳ නැති නිසා. ගරු සභාපතිතුමනි ඉදිරියෙදිවත් ඉක්මනින් දූරියන් ගහ ඉවත් කරල දෙන්න කටයුතු කරල දෙන්න. ඒ වගේම උඩුගම තියෙන සම්පත්වලට හානියක් වෙන්න කිසිසේත්ම කටයුතු කරන්න එපා. ඒනිසා ඔබතුමා එහෙම දේවල්වලට යෝජනාවක් ආවොත් විමසිල්ලෙන් බලල සාධාරණ උත්තරයක් දෙන්න. ඒකත් මතක් කරන ගමන් සියලු දෙනාට ස්තූතිය පුදකරමින් මම නිහඬ වෙනවා ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ කාලය රන් හා සමානයි කියලා තමයි අපි එදා ඉදල දන්නෙ. නමුත් ඒකට වටිනාකම ලැබෙන විදිහ ඇත්තටම කණගාටුයි. ගරු සභාපතිතුමනි මම ගෙනා යෝජනා තමයි කොළඹ කඩේ අසල කුඹුස්ස පාලම ගැන. දෙවෙනි යෝජනාව අයාලේ යන ගයවන් පිළිබඳව. තුන්වෙනි යෝජනාව කටුපොල් සම්බන්දව. ගරු සභාපතිතුමනි ඒ යෝජනා අතුරින් ඉතාම වැදගත් යෝජනාව කොළඹ කඩේ අසල කුඹුස්ස පාලම සම්බන්ද යෝජනාව. ගරු සභාපතිතුමනි ග්‍රාමසේවා වසම් පහක ළමයි එතනින් ගමනාගමනය කරනවා. නමුත් ඒ පිළිබඳ සෙවිල්ලක් නැතිදෝ කියන මතය තමයි මට දැනෙන්නෙ. ඒක ඉතා ඉක්මනින් ස්ථාපිත කර දෙන්න කියල තමයි මම ඉල්ලා සිටින්නෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි තවත් අපේ වැදගත්ම යෝජනාවක් තියෙන්නෙ පුරන් කුඹුරු අස්වැද්දීම. අපි ගමේ සියලු සමිති සමග සාකච්ඡා කරලා අක්කර පහ බැගින් කුඹුරු වැඩ කරන්න වැඩ පිළිවෙලක් සකස් කරල තියෙනවා. නමුත් අපි කුඹුරු කරන්නෙ කොහොමද? කියල ප්‍රශ්නයක් තියෙනවා. දියවර ගම්මානයේ සිට ඌරල දක්වා කුඹුරු ගොඩ කරගෙන යන තත්වයක් තියෙනවා. ඇත්තටම කණගාටුයි කිසිම කෙනෙකුට කියන්න බැහැ මේ පුරන් කුඹුරු ගොඩ කරනවයි කියලා. කුඹුරු කරපුවා තමයි ගොඩ කරන්නෙ. නිලධාරීන්ට මම ඇඟිල්ල දික් කරන්නෙ නැහැ. නමුත් නිලධාරීන් පවා මේව ගිහිල්ල

බලන්න ඕන. මාධ්‍යවේදී මහත්වරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා. දැන් යන ගමන් ඔබතුමාල ගිහින් බලන්න. තල්ගස්වල රුක්අත්තන ගහ ලග ඉදල මාපලගමට එන කොට කොච්චර කුඹුරු ප්‍රමාණයක් ගොඩකරලද කියලා. ඇත්තටම කණගාටුයි අපේ අනාගත දරුවන්ට බත සකස් කරන්න තියෙන තැන විනාශ කරනවනම් කොහොමද පරිසරය රකින්නෙ? මේකද පරිසරය රකිනවයි කියන්නෙ? මම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ කෘෂිකර්ම මධ්‍යස්ථානයත් එක්ක කතා කළා. මොකක්ද කිව්වෙ අනේ මන්ත්‍රීතුමා මේක රටනෙ ගොඩ කරන්නනෙ. ඒ මිනිස්සු අසරණයි. එතන කවුද බලධාරිය රජය නේද වග කියන්න ඕන. ඇත්තටම කණගාටුයි වාද විවාද කරනව නෙවෙයි. මම කියන්නෙ ඇහැ ඇරල බලන්න කියලා. අපි කොච්චර සමිති සමාගම් දැනුවත් කරලා වැඩ කටයුතු කළත් වෙන්නෙ මොකක්ද ඇත්තටම කණගාටුයි.

අපට කියනවා වගාකරගෙන කන්න කියලා. කොහොමද කන්නෙ බලන්න ගවයන්ගෙන් වෙන හානිය. ඇත්තටම කණගාටුයි මේක අද ඊයෙ නෙවෙයි අපි මේක සභාවට ආපු දවසෙ ඉදලම කිව්වා. නමුත් මොකක්ද ගත්ත පියවර? ගමේ මිනිස්සු කියන්නෙ මේක සභාවට තමයි අයිතිය තියෙන්නෙ සභාවෙන් කරන්න ඕන කියලා. කෘෂි කර්මයට කිව්වත් ඒකෙන් කරන්නෙත් නැහැ. කාටද මේක කියන්නෙ අපි සම්බන්ධීකරණ රැස්වීමෙදි කතා කරනවා හැම තැනදිම කතා කරනවා. මොකක්ද වෙන්නෙ කිසිම පිළිතුරක් නැහැ. අනිත් එක තමයි මම එදත් කිව්වා අපේ කුඹුරුහේනට යන තල්ගස්වල මාර්ගය ගිලා බැහැලා තියෙනවා. කවුද තාක්ෂණ නිලධාරියෙක් යවල බලල තියෙන්නෙ? මොකක්ද මේ වැඩේ අපි කියන්නෙ ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න. අපි නියොජිතයෙක් හැටියට ගමකින් පත්කරල එවල තියෙන්නෙ මේව ගැන කතා කරන්න. සමන් මන්ත්‍රීතුමා කිව්ව වගේ සෑම මන්ත්‍රීවරයෙකුටම පුලුවන් සම්බන්ධීකරන කමිටුවෙ වාඩිවෙලා අහගෙන ඉන්න. ඒත් කෝ වෙන දෙයක් නැහැ. මම පස් වතාවක් විතර සම්බන්ධී කරන කමිටුවට ගියා. අර වතුර බහින්නෙ නැති තැන පිළිබද යෝජනා කළා. හදන්නම් කියනවා කෝ නැහැ. මම කියන්නෙ ගරු සභාපතිතුමා මේ ඇත්ත මේක අපි කතා කරන්න ඕන. ඇත්තටම මේක කරන්න බැරි මොකද? වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ මහත්තය කියනවා කඩුවක් අරගෙන එලවගෙන එනවා කියලා. ඉතිං එහෙමනම් මොකටද මේ රජයක්? රජයක් තිබිල වැඩක් නැහැ. කැලෑ නීතියනෙ තියෙන්නෙ. මේක කෙරෙන්නෙ නැති හින්ද මම මේ කතා කරන්නෙ. මේක කෙරෙන්න ඕන. ඔබතුමාලගෙ රජයෙන් හරි මේක කරල දෙන්න.

ඒ වගේම ගරු සභාපතිතුමාට ස්තුතියක් පුදකරන්න ඕන. ඇතුමලේ සිරිසුනන්ද විද්‍යාලයේ ක්‍රීඩා උත්සවයට ජල බවුසරය ලබාදීම පිළිබදව. සභාවේ සියලුම දෙනාට ස්තූතිය පුද කරන්න ඕන. ඒ වගේම 69 ලක්ෂයක් ඔබතුමාලට ඡන්දය දුන්නෙ යහපත් දේවල් කරන්න අපි බලාගෙන ඉන්නවා. එහෙම නොවුනොත් ඔබතුමාලට වෙන්නෙත් අනිත් අයට වුන දේමයි. එනිසා ඔබ සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවා! අපේ යෝජනා සියල්ල සාර්ථකව ඉටුවේවායි කියල ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහත්මා**

ගරු සභාපතිතුමනි මට දැන ගන්න ඕන. ගරු රංජිත් ජයවීර මන්ත්‍රීතුමාගෙන් මේ එකම ප්‍රශ්න මාලාව ඊයෙ සම්බන්ධීකරන කමිටුවෙත් අද මේ සභාව ආරම්භයෙදිත් මේ අවස්ථාවෙදිත් ඉදිරිපත් කරනවා. එතකොට ඊයෙ සම්බන්ධීකරණ රැස්වීමට දාපු ඒ ප්‍රශ්නවලට මේ වෙනකොට ක්ෂණිව ක්‍රියාමාර්ග ගන්න ක්ෂණික නූඩ්ල්ස් නෙවෙයි. පොඩ්ඩක් ඉන්න ඒ ක්‍රමවේදයක් තියෙනවා. මම ජනතාව විසින් පත් කරපු මන්ත්‍රීවරයා හැටියට මගේ තව මන්ත්‍රීතුමියක් ඉන්නවා. අපිට කොට්ඨාසෙ අපේ ප්‍රශ්න ටික විසදගන්න පුලුවන්. හැම දෙයක් ගැනම අපි අවදානෙන් ඉන්නෙ. අපි මිනිස්සුන්ගෙ අවශ්‍යතාවයන් පැහැර හැරල නැහැ. අපි ඒ දේවල් කරලා තියෙනවා. ක්‍රමානුකූලව ඒ දේවල් සිදු වේවි. කිසි දේකට කලබල වෙන්න එපා. මොකක්ද ඔබතුමා මේ කරන විහිලුව. මම කතා කරන්නෙ මගේ කොට්ඨාසෙ

දෙයක් කතා කරන නිසා. ඊයෙ සම්බන්ධීකරන කමිටුවෙ කතා කළහම මම කිව්වා ඒකට ලක්ෂ 10 ක මුදලක් දාල තියෙනවා කියලා. ඇයි අදත් මේක කතා කරන්නෙ. දැන් උදේ ඇහුවමත් උත්තර දුන්නා. දැන් නැවතත් අහනවා. එකම දේ තුන් හතර සැරයක් කියන්න ඕන නැහැ. පත් වෙච්ච රජයවත් ගෝඨාභය රාජපක්ෂ මහත්තයවත් විශ්ව කර්මයෙක් නෙවෙයි සියලු දේවල් එකවර කරන්න බැහැ. යම් කාලයක් ඕන. යම් ක්‍රමවේදයක් තියෙනවා. ඕන ඕන විදිහට කරන්න බැහැ. මගේ අතේ සල්ලි තියෙනව නම් මට කරන්න පුළුවන්. මුදල් එන ක්‍රමයක් තියෙනවා. යම් නීතිමය රාමුවක් තියෙනවා. ඒවට අනුව තමයි කරන්න ඕන. ඔබතුමාල කරන ඔය යෝජනා කෙලින්ම බලපාන්නෙ අපට.

ගරු සභාපතිතුමනි මට කොට්ඨාසයක් තියෙනවා. මේ සියලු මන්ත්‍රීවරුන්ට හැම තැනම සොයන්න අයිතියක් තියෙනවා. ඔබතුමා යෝජනා ගේන්න. මම කියන්නෙ අපේ කොට්ඨාසෙ පත්කරපු මන්ත්‍රීතුමියක් ඉන්නවා. අපිට මේක කතා කරල කරන්න පුලුවන් ඔබතුමා ඉදිරිපත් කරන්න ඕන නැහැ. අපේ කොට්ඨාසෙ ජනතාවගෙ ප්‍රශ්න අපි දන්නවා. මෙතුමියත් මමත් උඩින් පහත් වෙලා නෙවෙයි. අපේ ගමේ තියෙන ප්‍රශ්න අපි දන්නවා. වෙන කවුරුවත් ගෙනත් දාන්න ඕන නැහැ. ඔබතුමා මේ හැම දේකින්ම වක්‍රාකාරව මොකක්ද බලාපොරොත්තු වෙන්නෙ. ඔබතුමාට වැඩිය ජනතාව ගැන අපට කැක්කුමක් තියෙනවා. මට ඡන්ද 1337 ක් දීල මාව පත්කළේ. ඔබතුමාල කරන ඕන චෝදනාවක් කරන්න. මොනව හරි දෙයක් කරන්න අපට යම් කාලයක් දෙන්න. මේක ගත්ත ගමන් කරන්න බැහැ. ගරු සභාපතිතුමනි අපේ කොට්ඨාසෙ මන්ත්‍රීතුමියක් ඉන්නවා මම ඉන්නවා කොට්ඨාසෙ ප්‍රශ්න මටයි එතුමියටයි කතා කරල විසඳ ගන්න පුලුවන්. අපට ඒකට කාලය දෙන්න එකම ප්‍රශ්නය මතුකරන්න එපා. පහුගිය අවුරුදු හතරහමාරක් තිබුනා ඕච්චර දැඩිලෙස විවේචනය කළේ නැහැ. මේ ඇවිල්ල මාස තුනයි විවේචනය කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද ප්‍රතිශතය සියයට හයයි ගණනක් තිබිල සියයට තුනට බැස්සෙ ඔන්න ඔය ප්‍රතිපත්ති නිසා. ගරු මන්ත්‍රීතුමා මම ඔබතුමාට ආදරය කරන ජනතා නියෝජිතයෙක්. ජයවීර මන්ත්‍රීතුමා ඔබ කරපු දේවල්වලින් මම දැනටත් අපහසුතාවයට පත්වෙනවා. ඔබතුමා ලයිට් කොකු ගෙනත් තියන්නෙයි කියලා ඔබතුමා දාල දෙන්නම් කියලා. ඔබතුමා මගේ කොට්ඨාසෙ මිනිස්සුන්ට කියන්න ඕන නැහැ කොකු ගෙනැල්ල තියන්න කියලා. රංජිත් ජයවීර ගරු මන්ත්‍රීතුමා ඔතනින් එහාට ගිය දේවලුත් මම දන්නවා. ගමට ගියාම කතා කළාම වෙනදේත් මම දන්නවා. ඒ නිසා ඒ ගැන කතා කරන්න මම කැමති නැහැ. මම කියන්නෙ ඉදිරියට අපට දෙශපාලනේ ඕනත් නැහැ. නමුත් අපි මේ ඉන්න කාලෙ මිනිස්සුන්ට යම් දෙයක් කරනවයි කියල ඒ ගෞරවය තියාගෙන ඉන්න ඕන. ඔබතුමා දැන් ඔය නිර්මාණය කරන්නෙ මෙන්න මේ දේ මම කළා කියන්න. ඒක පෙන්නල ඔබතුමා ඉදිරියට යන්න. ඒක ගැටලුවක් නැහැ. අපට ඉදිරියට දෙශපාලනේ ඕන නැහැ. අපට මේ ඉන්න කාලෙ ජනතාවට සේවයක් කරන්නයි ඕන. ඒ නිසා එකම ප්‍රශ්නය දීර්ඝව අහන්න එපා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගෙන් සහ සභාවේ ලේකම්තුමිය මාධ්‍යවේදී මහත්වරුන් ප්‍රධාන සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම මුලින්ම සඳහන් කරනවා. ගෝඨාභය රාජපක්ෂ ගරු ජනාධිපතිතුමන් පසුගිය ජනාධිපතිවරණය වෙලාවෙ. මේ මුලු ලක්වාසී ජනතාව ඉදිරියෙදි එතුමා ප්‍රසිද්ධ වේදිකාවෙ සඳහන් කළා. නීතිගරුක, විනය ගරුක, යුක්ති ගරුක සමාජයක් බිහි කරන්න ඇප කැප වෙනවයි කියලා. හැබැයි මේ සභාවේ මම වාඩිවෙලා බලන් ඉන්න කොට සභාපතිතුමාගේ ඉඳල සියලු දෙනාගේ ඒ කරුණු තුනේ අඩංගු හේතු කාරණා තිබුනද කියල මට සැකයක් තියෙනවා. ඇත්තටම සභාවක් හැටියට සභාවෙ මන්ත්‍රීවරුන් හැටියට අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව තියෙනවා. හැබැයි ඒ කතා කරන වෙලාවෙ ඊට ප්‍රතිවිරුද්ධ මත ප්‍රකාශ කරන එක අපේ සාරධර්මවලට පටහැනියි. මමත් පහුගිය සභාවලදි ඔය වැරදි වැඩේ කළා. හැබැයි මටත් දැන් තේරුම් ගිහිල්ල තියෙනවා. සභාවට ඇවිල්ල යම් මන්ත්‍රීවරයෙක් අදහස් ප්‍රකාශ කරන්නෙ තමන්ගෙ

සමාජයේ තමන්ගෙ ඡන්ද දායකයගෙ තියෙන ගැටලු පිළිබඳව. ඒක නිදහසේ ප්‍රකාශ කරන්න අපි අවස්ථාව ලබා දෙමු. මම මේ සියලු දෙනාගෙන්ම ගෞරවයෙන් ඉල්ලන්නෙ, සමහවිට ඒ කියන වචනවලට කරුණු කාරණාවලට ආවේගයන් ඇති වෙන්න පුලුවන්. අපි ඉවසා දරාගෙන ඉදල එයාගෙ කතාවෙන් පසුව ඒවට පිළිතුරු දෙමු. මේ සභාවෙ විශාල කාලයක් බොහෝවිට වැය වෙන්නෙ නිකරුනේ. අපි තමන්ගෙ කතාව ක්‍රමාණුකූලව ඉතාමත් කෙටියෙන් සාරාංශ ගතව කරනවනම් අපිට සභාව ඉක්මනින් අවසන් කරන්න පුලුවන්. කිසිම සැලැස්මක් නැතුව ඉදිරිපත් කරන කරුණු කාරනාත් එක්ක ඒ පිළිබඳ හරි නිගමනයකට එන්න බැරිව බොහෝ කාලයක් ඒ සඳහා වැය කරනවා. මම හිතන්නෙ සභාව පැවැත්වෙන දිනට පෙර දින ඔබතුමන්ලගෙ කණ්ඩායම් රැස්වීම තියෙනවා. එතනදි මේ කරුණු පිළිබඳ කතා කරනවා ඇති. එතනදි යම් සැලැස්මක් හදාගන්න කියල මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙ කතාවෙදි අදහස් බලාපොරොත්තු වෙමින් මම මුලින්ම සඳහන් කරනවා. පහුගිය අපේ රජය තුලින් මේ සභාවට ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා යම් ඉඩම් ප්‍රමාණක් වගේම යම් මුදලක් ලබා දුන්නා. ඒ පිළිබඳ මේ වෙනකොට තිබෙන තත්වය කුමක්ද? ළඟදි වැඩ ආරම්භ කරන්න පුලුවන්ද? දෙවෙනි කරුණ සභාපතිතුමනි, ගම්පෙරලිය ආදී විශේෂ ව්‍යාපෘති හරහා අති විශාල සංවර්ධන වැඩකොටසක් නාගොඩ කොට්ඨාසය තුල සිදු කෙරුනා. මුල් අදියරේ ඒවට මුදල් ගෙවුවා. අවසන් අදියරේ වැඩ අවසන් කරපු ඒවට මුදල් නොලැබීම නිසා කොන්ත්‍රාත්කරුවන් දැඩි අපහසුතාවයට පත් වෙලා තියෙනවා. පහුගිය දවස්වල පාර්ලිමේන්තුවෙ පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත වෙලා තියෙනවා. මම හිතනවා මේ මුදල් ඉක්මනින් ගෙවුවොත් තමයි ඔබතුමාලගෙ සපිරි ගමක් වැඩසටහන යටතේ ඇවිත් තියෙන අලුත් ව්‍යපෘති කරන්න පුලුවන් වෙන්නෙ. මේ වෙලාවෙ ඒ පිළිබඳවත් සිහිපත් කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, මේ වෙලාවෙ සභාවේ වතුර බවුසරය පිළිබඳව සිහිපත් කරනවා. මාපලගම සිරිසුනන්ද නවෝද්‍යා පාසලේ ක්‍රීඩා උත්තසවය වෙනුවෙන් වතුර බවුසරය ලබා දීම වෙනුවෙන් හා ක්‍රීඩා උත්තසවය උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට සහයෝගය ලබා දීම වෙනුවෙන් සභාපතිතුමාට හා සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට මේ වෙලාවෙ ස්තූතිය පුදකරනවා. ඒ වගේම සභාපතිතුමනි, මේ වතුර බවුසරයට වතුර ලබා ගන්නා ක්‍රමවේදය වෙනස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. උඩුගම උපකාර්යාලයෙන් බවුසරයට වතුර පුරවන කොට පැය කීපයක් යනවා. ඉස්සර අපි ගෝනදෙනියෙ ලිදකින් වතුර පිරෙව්වෙ. ක්‍රීඩා උත්සවය දවසෙ අපට වතුර මදිවෙලා මාපලගම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ලිදෙන් වතුර ගත්තෙ ඒකට අපට පැය භාගයකට වැඩිය ගියේ නැහැ. සභාපතිතුමනි මම දැනගන්න කැමතියි. අගල් දෙකේ ලිදට බස්සන වතුර මෝටරයක් සභාවෙ තිබුනා. ඒක තිබේද? ඒ වගේ වතුර මෝටරයකින් අපට ඉතා සුලු වේලාවකින් බවුසරයට වතුර පුරවන්න පුලුවන්. උඩුගම උපකාර්යාලයෙන් බවුසරයට වතුර පුරවන්න ගියාම, දවසට දෙතුන් පොලකට වතුර ඉල්ලුවොත් දෙන්න වෙන්නෙ එක තැනකට විතරයි. ඒ නිසා ඒ සඳහා ඉක්මන් වැඩ පිළිවෙලක් සකස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊලගට අපේ ජයවීර මන්ත්‍රීතුමත් කුඹුරු ගොඩ කිරීම පිළිබඳව සඳහන් කළා. ඇත්තටම මේ දවස්වල කිසිම ක්‍රමවේදයකින් තොරව පස් කැපීම පිළිබඳව මම ගිය මාසෙට කලින් මාසෙත් සභාවෙදි කතා කළා. ඇත්තටම මේක දැන් සීග්‍රයෙන් වැඩිවෙලා තියෙනවා. පහුගිය රජය කාලෙ මේකට යම් ක්‍රමවේදයක් තිබුනා. පස් කපන්න අවසර ලැබුනෙ නැහැ. පස් කපනවා නම් බලපත්‍රයක් අරගෙන ඒ අනුව කටයුතු කරන්න ඕන. නිසි ක්‍රමවේදයකින් තොරව පස් කැපීමේ ප්‍රතිඵලයක් හැටියට අද ජයවීර මන්ත්‍රීතුමන් කිව්වා වගේ තල්ගස්වල පාරෙ දෙපැත්තෙ විතරක් නෙවෙයි හැම තැනම අක්‍රමවත් ලෙස තමන්ගෙ දේශපාලන බලය යොදවල කටයුතු කරනවා. පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සේවා ආයතනය ආදී මේවට වග කිවයුතු ආයතන තියෙනවා. මේ ආයතන මේ පිළිබඳ කිසි දෙයක් නොසොයන අන්දමට කටයුතු කරනවා. පහුගිය කාලේ මේ වගේ කුඹුරක් හෝ කුඹුරු ඉඩමක්

ගොඩ කළානම් අදාල ඉඩම් හිමියා අත්අඩංගුවට අරගෙන නඩුදාන ගොවිජන සේවා ආයතනයක්, පොලිසියක් තිබුනේ. නමුත් අද ඒ කිසිම නීතියක් ක්‍රියාත්මක නොකර දේශපාලන බලයට මේ සියලු විනාශකාරී ක්‍රියාවන් සිදු කරනවා. ඒ වගේම තමයි ගිංගගේ වැලි ගොඩදාන එක, තල්ගස්වල වත්තෙ කුඹුරුවල වැලි කපන එක සීග්‍රයෙන් වැඩිවෙලා තියෙනවා. ඇත්තටම මේක නොවිය යුතු දෙයක්. දේශපාලන බලය නොයෙක් විට නොයෙක් දේශපාලන පක්ෂවලට ලැබෙනවා. නමුත් බලය ලැබුනයි කියලා පරිසරය විනාශ කරන එක නෙවෙයි සිදුවිය යුත්තේ. අනවශ්‍ය විදිහට මේ සිදුකරන දේවල් මිනිස්සුන්ට කරදරයක් බව මේ වෙලාවෙ සිහිපත් කරනවා. ජයවීර මන්ත්‍රීතුමන් කිව්ව වගේ රෑ එළිවෙනකම් පස් අදිනවා. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට මේව පේන්නෙ නැද්ද දන්නෙ නැහැ. ඒවා දේශපාලන බලයත් එක්ක කරන කටයුතු. මේව දැක්කම පහුගිය දවස්වල තමුන්නාන්සෙලට ඡන්දය දීපු අය කලකිරෙනවා. මේව නොවිය යුතු දේවල් මම හිතනවා මේව ඉදිරියෙදි නිවැරදි කරගනී කියලා.

ඊලගට මේ දනවල මහා වසංගතයක් වෙච්ච ප්‍රශ්නයක් තියෙනවා. වඳුරන් රිලවුන් දඩුලේනුන් මොනරුන් ආදී සතුන්ගෙන් වගාවන්ට විශාල හානියක් වෙනවා. පහුගිය කාලෙ අපේ ග්‍රාම නිලධාරීන්ට මේ උවදුර මැඩපවත්වන්නට වායු රයිපල් දීල තිබුනා. සීග්‍රයෙන් ගම් වදින වනසතුන්ගෙන් ආරක්ෂා වීම සඳහාත් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහාත් යම් වැඩ පිළිවෙලක් සකස් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

ඊලගට ගරු සභාපතිතුමනි, පහුගිය රජය කාලේ විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ පවුල්වල මිනිස්සුන්ට සමෘද්ධි සහනාධාරය ලබා ගන්න හැකියාව ලැබුනෙ නැහැ. 2015 පෙර රජයෙන් අපේ මිනිස්සුන්ට යම් යම් අසාධාරණකම් සිදු වුනා. 2015 පස්සෙ මේ පහුගිය රජය සමයේ අපි යම් ප්‍රමාණයකට සමෘද්ධිය ලබා දෙන්න ගමේ ඉන්න ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂි නිලධාරී ඇතුලු කණ්ඩායමකගේ නිර්දේශ මත සමෘද්ධිය ලබා දෙන්න කටයුතු කළා. අද වෙනකොට මගේ පරණතානායම්ගොඩ මධ්‍යම කොට්ඨාසෙ සමෘද්ධි ලාභීන්ගෙ ගෙවල්වලට ගාල්ලෙන් නිලධාරී කණ්ඩායමක් ඇවිල්ල සමෘද්ධි ලාභීන්ගෙ කරුණු සොයා බලන්න කටයුතු කරල තියෙනවා. ඉතිං මම හිතනවා අපේ පාක්ෂිකයන්ට ලබා දීපු ඒ සහනය දේශපාලන පලිගැනීමක් හැටියට කප්පාදු කරන්න තමයි සූදානම් වෙන්නෙ. 2015 ට පෙර සමෘද්ධිය ලබා ගත් අයගෙ වත්කම් බැරකම් අපි හෙව්වෙ නැහැ. ඒ අයගෙ සමෘද්ධිය කපන්න කටයුතු කළේ නැහැ. අපි පහුගිය කාලෙ දිය යුතු දුප්පත් අයට දුන්නෙ. සමෘද්ධිය කැපීම සඳහා වත්මන් රජය කටයුතු කරනවා. මේ වෙලාවෙ අපි දැඩි ලෙස විරෝධය පානවා.

ගරු සභාපතිතුමනි, දැන් මේ වෙලාවෙ ඔබතුමා කතා කළා. ඩයලොග් ආයතනය මගින් පාරෙ කනු සිටවලා කේබල් පද්ධතියක් අදිනවා කියලා. ඔබතුමා කතා කරන කොට මම කල්පනා කළා. මූලන වාඩිය කන්ද පාරෙ කනු සිටවලා කේබල් ඇදලා ඉවරයි. ඒක ඩයලොග් ආයතනයෙන්ද? ටෙලිකොම් ආයතනයෙන්ද? සභාව දැනුවත් වෙලා නැතිද? මේ වෙලාවෙ කේබල් පද්ධතියක් මූලන වාඩිය කන්ද පාරෙ කුළුනට වෙනකම් ඇදල තියෙනවා. ඒ පිළිබඳ සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාපලගම ගොඩැල්ල වත්ත ප්‍රදේශයේ පහුගිය කාලෙ වාඩියකන්ද පාමුල නාය යාමකට ලක් වුනා. දැනට නිවෙස් දෙකක පමණ අය ඒ ප්‍රදේශයෙන් ඉවත් වෙලා තමන්ගෙ ඥාතීන්ගෙ ගෙවල්වල ඉන්නෙ. අපේ කාලෙත් ඒ අයට ඉඩම් කැබැල්ලක් සහ යම් මුදලක් ලබා දෙන්න නිර්දේශ වෙලා තිබුනා. නමුත් රජයේ නිලධාරීන්ගෙ යම් යම් කඹ ඇදිලි, අතපසුවීම් නිසා ඒ මිනිස්සු මේ වෙනතුරු තමන්ගෙ ඥාතීන්ගෙ ගෙවල්වල ඉන්නෙ. ඔබතුමන්ලා මේ සම්බන්දව සොයා බලලා මේ අයට සාධාරණයක් කරන්න. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා අංශයට ගිහිල්ල කතා කළාම කියන්නේ. පහුගිය රජය කාලේ ඉඩම් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබිලා තිබුනා. මේ ආණ්ඩුව ආවට

පස්සෙ අපට කටයුතු කරන්න හැකියාවක් නැහැ කියලා. ඔබතුමාලා වත්මන් රජය යටතේ අලුත් ඉඩම් ඇමතිතුමාගෙ අනුමැතිය ගන්න නාම ලේඛනය යවලා තියෙනවා. මේ වෙන කොට වත්මන් ඇමතිතුමාගෙත් අනුමැතිය ලැබිලා තියෙනවා. මේ අසාධාරණයට ලක්වෙච්ච පවුල් හයක හතක වගේ පිරිස ඒ ප්‍රදේශයෙන් ඉවත්වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. පවුල් පිටින් හැමදාම ඥාතීන්ගෙ ගෙවල්වල ඉන්න බැහැ. ඒ නිසා මේ පිළිබඳ සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ධනංජය මන්ත්‍රීතුමා කිව්වා. 2015 වර්ෂයට පෙර තිබුන තත්වය මේ රටේ නැවතත් උදා කරනවයි කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා පරාජය කරල ගෙදර යැව්වෙ 2015 ට පෙර මේ රටේ තිබුන ආර්ථිකයේ හොඳකම නිසා. ඉදිරියෙදි ඒ වගේ කාලයකට යන්න ජනතාව කෙහෙත්ම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අපේ පළාත්වල ඉන්න මිනිස්සුන්ට මුලාවෙ වැටුන බව දැන් හොඳටම තේරිල තියෙන්නෙ. මේ වෙලාවෙ නැවත වාරයක් ඔබතුමාල ඉදිරි මැතිවරණය පිළිබඳව කතා කළා. ඒ පිළිබඳ තමුන්නාන්සෙල හිතාගෙන ඉන්න තරම් ජනතා ප්‍රතිචාරයක් නැහැ. වත්මන් ආණ්ඩුව කටින් බතල කොල හිටවනවා වගේ වැඩ පිළිවෙලක යන්නෙ. කතාව විතරයි වැඩ නැහැ. තමුන්නාන්සෙලට ලැබෙන ප්‍රතිචාරත් එක්ක අපි ඉදිරියෙදි බලමු. අපි පැහැදිලි වැඩපිළිවෙලක් එක්ක ඉදිරි මාස කීපය තුල අපේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් ඉදිරි අනාගතේ මේ රටේ බලය අරගෙන කටයුතු කරනවයි කියලා මතක් කරමින්, ඔබ සියලු දෙනාට ජයවේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහත්වරුන් ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමනි මටත් අදහසක් දක්වන්න හිතුනෙ ගෝනදෙනිය වී ගබඩාවට යන පාර සම්බන්දයෙන්. දැනට මගේ කොට්ඨාසයට අදාල නොවුනත් මමත් ගෝනදෙනියෙ ගමේ ඉපදුන කෙනෙක්. මට හොඳටම මතකයි වී ගබඩාවට යන පාර තිබුන තැන. තරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ ලොකු කුළුනු දෙකක් තිබුනා. ඒ වී ගබඩාව ඉදිකරපු අයගෙ නම් පවා ඒ කුළුනෙ තමයි ගහල තිබුනෙ. පෙරපාසලයි, සෞඛ්‍ය මධ්‍යස්ථානයයි ඉදි වෙන්නෙ මෑත කාලෙ. අපි උපදින කොටත් මේ වී ගබඩාව තිබිල තියෙනවා. මම ගියෙත් ප්‍රාදේශීය සභා පෙරපාසලට. දැනට සණස ගොඩ නැගිල්ල තියෙන තැන යට පෙරපාසල තිබුනෙ. මට මතක විදිහට මම 1988 අවුරුද්දෙ තමයි පෙරපාසල් ගියේ. පෞද්ගලික කෙනෙකුට මේ ඉඩම අයිතිවීම සම්බන්දයෙන් ලොකු අර්බුදයක් ධනංජය මන්ත්‍රීතුමාට තියෙන්නෙ. මේ පාර සමබන්දයෙන් ඔබතුමාගෙ විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. කාලයක් තිස්සෙ ඇදෙන ප්‍රශ්නයක් නිසා. අනිත් එක එතුමා යෝජනා කරනවා නැවත මේ වී ගබඩාව පවරා ගෙන පවත්වාගෙන යන්න ඕන කියලා. එහෙම වුනත් මෙතනට බර වාහන යන්න පාරක් තියෙන්න ඕන. මේ සමබන්දයෙන් මම දන්න අතීතය මතක් කළේ. මොකද අපි ඒ දවස්වල අවුරුදු උත්සවය පවා තියන්නෙ ඔය වී ගබඩාවෙ තිබුන පිට්ටනියෙ. ඒ පිළිබඳවත් සිහිපත් කරමින් ඒ වගේම 69 ලක්ෂයක් ලොකු බලාපොරොත්තුවක් ඇතුව තිබුන රජය අවසන් කරලා වෙනත් රජයක් පටන් ගත්තා. නමුත් ඒ ජනතාවට බඩගින්න කියන දේ හොඳටම දැනිල තියෙනවා. වර්ථමානය වන විට රාත්‍රී කාලයේ හොරුන්ගෙන් එලවලු කඩ ඇතුලුව සියලුම ව්‍යාපාරික ස්ථාන බේරා ගැනීමේ තර්ජනයකට මුහුන දෙන්න සිදු වෙලා තියෙනවා. බද්දෙගම ආසනය තුල මීට සති දෙක තුනකට පෙර එලවලු කඩ කැඩුවා. අද වඳුරඹ ප්‍රදේශයේ විශාල ප්‍රමාණයක් හොරු බිඳලා තියෙනවා. අපි බලන්න ඕන මේ නාගොඩ කොට්ඨාසය කොහොම හරි හොරුන්ගෙන් බේර ගන්න. මේ බඩු මිල පාලනය කරල ජනතාවට යම් සහනයක් ලබා දෙන්න කියලා ඔබතුමාලගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, කඩ කැඩුවයි කිව්වහම මට මතක් වුනේ. ඊයෙ හැන්දෑවෙ වඳුරඹ හන්දියෙ කඩ පහක් කඩලා. ඒක නිසා අද ලංකාවෙ ආර්ථිකය මොකක්ද කියන එක අපි තේරුම් ගන්න ඕන. එදා මේ පළාතෙ කඩ කැඩුවෙ නැහැ. පොලීසිවල ගිහිල්ල බලන්න ඒ වගේ පැමිණිලි තියෙනවද කියලා. ජනාධිපතිතුමා පත්වෙලා තවම මාස කීපයයි. මම කියන්නෙ අපි ටිකක් බලමු. බලල හොඳ නැත්නම් පහර දෙන්නත් දෙසරයක් හිතන්නෙත් නැහැ. තවම යන්නෙ කොහේද කියල බලාගෙන ඉන්නවා. සමහර ප්‍රවෘත්ති බලාගෙන ඉන්න කොට හොඳ දේවලුත් තියෙනවා. හොඳ දේවල් අපි අනුමත නොකර අරින්නෙ නැහැ ඒවට අපි සතුටු වෙනවා. නමුත් දේශපාලන වශයෙන් නරක දේවලුත් තියෙනවා. අපට මාධ්‍යක් නැහැ. මේ මාධ්‍යවේදී මහත්වරු ආවට මේ කට්ටිය අපේ නෙවෙයි. මේව දැම්මත් එකයි මට නොදැම්මත් එකයි. එදා එක්සත් ජාතික පක්ෂෙන් ඇති කරපු මාධ්‍ය නිදහස අදත් තියෙනවා. මනේන 2020.01.23 ලංකාදීප පත්තරෙන් අලුත්ම ප්‍රවෘත්තිය දැන ගන්න. ගාල්ල දිසා මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම්ට පහර දෙයි. කවුද මේ පහර දීල තියෙන්නෙ. ප්‍රවෘත්තියෙ අන්තිම වගන්තිය විතරක් කියවනවා. උබ බණ්ඩාරිගොඩගෙ මිනිහෙක් නේද?. මෙයාල ආණ්ඩුවට කඩේ යනවා. මොකද තමන්ගෙ ජීවන පැවැත්ම සඳහා මෙයාල ආණ්ඩුවට කඩේ යනවා. අපට ප්‍රශ්නයක් නැහැ. අපි කඩේ යන්නෙ නැහැ. නමුත් හොඳ දේ කියන්න අපි පැකිලෙන්නෙත් නැහැ. මේ වෙලාව වෙන කොට ආණ්ඩුව කොහේද යන්නෙ කියන එක අපි විග්‍රහ කරන්න යන්නෙ නැහැ. තව ටිකක් අපි බලාගෙන ඉන්නවා. මම පටන් ගන්න කොටම කිව්වා මේ එක සිද්ධියකින් ගෝඨාභය මහත්තය සම්පූර්ණයෙන්ම පෙරලල විනාශ කරල දානවා නෙවෙයි. රටක් පාලනය කරන කොට ඍජු තීන්දු ගන්න ඕන. ඒකට අපි කැමතියි. නමුත් අකමැති තැනුත් තියෙනවා. ඊලගට බලන්න ඊලග ප්‍රවෘත්තිය. ඒකත් මම දිනෙත් එක්කම ලියා ගත්තා මොකද උසාවි යන්න වුනොත් උත්තර බඳින්න ඕන නිසා. 2020.01.30 වෙනිද 7.00 ප්‍රවෘත්ති උපාධිධාරී සංගමයේ නිලධාරීන්ට මරණ තර්ජන. උපාධිධාරී සංගමය පාරට බහින කොට පිකටින් කරන්න පිට්ටනි හදල තිබුනට එතනට ගිහිල්ල පිකටින් කළාට. මේ පැත්තෙන් පොලීසියෙන් හෝ නිලධාරීන් ගෙදරට ගිහිල්ල අම්මටයි තාත්තටයි කියනවා පුතා බේර ගනින් ඕවට යවන්න එපා කියලා. මේ කාරණා දෙකයි මේ වගේ ගොඩාක් මට මෙතනට ගේන්න තිබුනා. නමුත් මම ඒ පැත්තට වැඩිය යොමු වෙන්නෙ නැහැ. හොඳ එකක් ඉස්සරහට දාල නරක 100 සිදු වේවි. අන්න ඒකයි අපි කින්නෙ. ඒ නිසා අපි තව ඩිංගක් බලාගෙන ඉදිමු. මේ වෙලාවෙ මම දීර්ඝ වශයෙන් ඒ පිළිබඳව කතා කරන්නෙ නැහැ.

ගෝනදෙනිය පිළිබඳව ඉතිහාසයක් මට, අජිත් මන්ත්‍රීතුමාට, සභාපතිතුමාට, උප සභාපතිතුමාට තියෙනවා. මම ඒව ගැන කතා කරන්න යන්නෙත් නැහැ. නමුත් අර කුළුනු කනු දෙක සමබන්දව පුංචි මතකයක් තියෙනවා. ඒක නිසා මම හිතන විදිහට සුදනො වෙන්න හැදුවට සුදනො වෙන්න ලේසියෙන් බැහැ. වැරදිලාවත් හරි පැත්තට යොමු වුනොත් අනුන්ගෙ ඉඩම් ගොඩ කරලා ගත්ත සල්ලිත් ආපහු ගෙවන්න වේවි. අපේ ආයතනයටත් වගකියන්න වේවි. ඔප්පුවක් නැහැ මොකුත් නැහැ. මේක ලේසි පහසු වැඩක් නෙවෙයි. සද්දෙන් වහන්න පුලුවන් දෙයක් නෙවෙයි. සභාපතිතුමා හරි තැන ඉන්න එක ගැනත් අපි සතුටු වෙනවා. ඔබතුමා ජන්මෙන් නාගොඩ කාගෙවත් අරක්කු බෝතලයක් බොන්න ඕන මිනිහෙක් නෙවෙයි. ඒක නිසා සද්දෙට වැරදි වහන්න ඉඩ දෙන්නත් බැහැ. මම දන්නවා ඒ ගෙවපු ඒ ගනිපු සියලු පැටිගිරිය. අත්අඩංගුවට පත් වෙන්නෙ කවුද කියලත් අපි දන්නවා. ඒක නිසා ගරු සභාපතිතුමනි ප්‍රවේසමෙන් කටයුතු කරන්න. වැඩ කිරීමෙදි අපිත් එදා ප්‍රවේසම් වුනේ නැහැ. මෙකට ඔප්පුවක් බලපත්‍රයක් තියෙනවද කියලා අපි බැලුවෙ නැහැ. මේක අපේය කියන කොට මොනවත් නොබලා වැඩ කළා. කණගාටු වෙනවා. අපේ වකවානුවෙ ගනිපු ඔප්පු ටිකවත් සභාවෙ නැහැ. සභාපතිතුමාට ඇවිල්ල තියෙන්නෙ ඇදුරො 100 ගෙනාවත් කපන්න බැරි කොඩිවිනයක්. මේක කපන්න හම්බ වෙන්නෙ නැහැ. එක එක අයගේ පුද්ගලික න්‍යායපත්‍ර අනුව නීත්‍යානුකූල තත්වයක්

නැතුවයි මේ සභාවෙ සමහර වැඩ කරල තියෙන්නෙ. ඕක නිසා තමුන්නාන්සෙට මම කියන්නෙ වැඩ කිරීමෙදි සද්ද බද්ද වලට නෙවෙයි නීතියට අනුව වැඩ කරන්න. අපි වැඩ කිරීමෙදි ප්‍රවේසම් විය යුතුයි.

ඊයෙ සංවර්ධන කමිටුව තිබුනා අපිට සතුටුයි. අපි සංවර්ධන කමිටු සිය ගණනකට වාඩිවෙලා තියෙනවා. ගාලු දිස්ත්‍රික් සංවර්ධන කමිටුවටත් වාඩිවෙලා තියෙනවා. නමුත් අපි නොකියා මගුල් ගෙදර යන මිනිස්සු නෙවෙයි. අපි ආත්ම ගරුත්වයක් තියෙන UNP කාරයො. අපි 07 දෙනෙක් ඉන්නවා. කණ්ඩායම් නායකය හැටියට මට විතරයි ආරාධනා පත්‍රයක් ලැබුනෙ. මම මගට ආවා එතකොට තමුන්නාන්සෙලගෙ මුලු කණ්ඩායමම ඉන්නවයි කිව්වා. මම වාහනේ හරවගෙන ආපහු ගියා. ජනතා විමුක්ති පෙරමුණෙන් එක්කෙනයි. එක්සත් ජනතා නිදහස් සන්ධානෙන් එක්කෙනයි. එකසත් ජාතික නිදහස් පෙරමුණෙන් එක්කෙනයි. මේ සේරම හරි එහෙනම් මගේ හය දෙනෙකුට ලියුම් නැහැ. කවුරු කැදෙව්වත් යමක් කරනවානම් හරි දේ කරන්න ඕන. ප්‍රදේශයක් වෙනුවෙන් සංවර්ධන කමිටුවක් තියනවානම් පාට පක්ෂ බලල බැහැ. ලිපියක් එව්ව නම් අපේ කණ්ඩායමේ හය දෙනාටත් එන්න ඕන. මේක ඒක පාක්ෂිකව යන්න හදන ගමනක් කියලා මම ආපහු හැරිල ගියා. සභාපතිතුමා නෙවෙයි මෙතන වැරදි කාරයා. තමුන්නාන්සෙල සියලු දෙනා සහභාගී වීම ගැටලුවකුත් නැහැ. මම ඒක විවේචනය කරන්නෙත් නැහැ. ඒක කරනවනම් ක්‍රම වේදයක් තියෙන්න ඕන. JVP ද UNP ද මොන එකක් හරි ඉන්න ඕන. අපි අනවසරයෙන් අනුන්ගෙ මගුල් ගෙදර කෑම කන මිනිස්සු නෙවෙයි. බලහත්කාරයෙන් ඇවිල්ලා වාඩිවෙලා මොනම යෝජනාවක්වත් කරන්න බැහැ. ඒ කරන යෝජනා එකක්වත් නීත්‍යානුකූල වෙන්නෙ නැහැ. තැනකට යන ක්‍රමවේදයක් තියෙනවා. ඒක තමයි මේ හැමෝම කිව්වෙ. ඒක නිසා මීට පස්සෙ ඉදිරියට අපේ ආණ්ඩුව අපේ ශක්තිය අපේ සංවර්ධනය කියල ඒ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්න. අපෙන් බාධාවක් නැහැ. අපි ඒව විවේචනය කරලත් නැහැ.

ඊලග කාරණය ඇල දොල දැන් ඉවරයි. ඇල දොල වලින් දිගට හරහට වැලි ගොඩ දානවා. මේ මන්ත්‍රීතුමන්ලා කිව්ව වගේ පස් කපනවා. වහාම මේවට නීතිමය තත්වයක් හදන්න කියලා රජයට සහ අදාල ආයතනවලට දැනුම් දෙන්න. ඊළඟට මම පහුගිය දවසක ගියා මගේ ඇස් දෙක පෙන්නන්න අක්ෂි වෛද්‍ය වරයෙක් ලගට. වෛද්‍යවරයා මගෙන් අහනවා මොකකද ගමන් කරන්නෙ කියලා. මම කිව්වා වාහනෙන් තමයි වැඩිය යන්නෙ කියලා. මම හිතුවයි කිව්වා ඔයා බස් එකේ ගිහිල්ල පොදු ප්‍රවාහන තියෙන තැන්වල ගැවසෙනවයි කියලා. වෛද්‍යවරය කිව්වා ප්‍රවේසම් වෙන්න තැනක් තියෙනවා. තමුන්නාන්සෙලගෙ සභාවල කතා කරන්නෙත් නැහැ. පාර්ලිමේන්තුවෙ, පළාත් සභාවෙ, කතා කරන්නෙත් නැහැ. අද බලන්න 99% ලාම්පුතෙල් ගහලා වාහන ධාවනය කරන්නෙ. මට දුන්න උදාහරණයක් පනගන්වපු බස් දෙකක් අතරින් යන්න. හොදට භූමිතෙල් ගද වහනය වෙයි කිව්වා. ඔයාට ජේන එකක් නැහැ. සුදු ලේන්සුවක් අරගෙන මූනෙ බැදගෙන ගාල්ල බස් නැවතුම් පොලේ පැය තුන හතරක් ඉන්න කිව්වා. දැල්ල මොනවගේ බැදිලද කියලා බලන්න කිව්වා. අද මේ මොහොත වෙන කොට පරිසරය දූෂණය වෙන්නෙ 100% ක් පස්වලින්, වැලිවලින් නෙවෙයි. මේ ගමන් කරන හැම බස් රථයක්ම භූමිතෙල් වලින් ධාවනය කරන්නෙ. වැඩිකල් නොගිහිල්ලා මිනිස්සු අන්ධයො වෙනවා. එදා ආණ්ඩුවත් මේ වැරැද්ද කළා. මේ ආණ්ඩුවටත් මේ වැරැද්ද කරන්න ඉඩ දෙන්න එපා. ගරු ජනාධිපතිතුමාව දැනුවත් කරන්න. මේ කාලකන්නි වැඩේ මේ රටේ කරන්න දෙන්න එපා කියලා. මොකද ඇස්දෙක නැත්නම් හිගා කන්න හම්බ වෙන්නෙත් නැහැ. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පළවෙනි යෝජනාව වෙන්න පුලුවන්. ගරු සභාපතිතුමනි මේ පනිවිඩය සියලු ආයතන වලට දෙන්න. මේක නවත්වන්න පුලුවන් වැඩක්. අපි ගියාම අපට දුම් සහතිකේ ගන්න බැහැ. එතකොට මේ අය දවස් 365 ම ලාම්පුතෙල් ගහල දුවලා දුම් සහතිකේ ගන්නවා. එහෙම නම් මේ වරද නිවැරදි නොකළොත් තමුන්නාන්සෙලාට අපිට තව අවුරුදු පහකින් අන්ධයො වගේ ඇවිල්ල අත්වැල් අල්ලගෙන තමයි මෙතන කතා කරන්න වෙන්නෙ. වෛද්‍යවරයා කිව්වෙ ඒක නෙවෙයි අපරාදය අහිංසක දුප්පත් ළමයි ගාල්ලට කොළඹට පන්ති යනවා. මේ ළමයින්ගෙන් 75% බස්එකේ යන්නෙ. මේ ළමයින්ගෙ තරුණ

වයස එන කොට උපාධිය ගන්න කොට මේ ළමයට වෙන්නෙ අක්ෂි වෛද්‍යා සායනවලට යන්න. මේ අපරාධය නවත්වන්න හෙට සිට ක්‍රියාත්මක විය යුතුයි. මෙන්න මේව තමයි අපි අවධානය යොමු කරන්න ඕන. ඒ පිළිබඳ අවදානය යොමු කරන්න කියලා. මම තමුන්නාන්සෙලගෙන් ඉල්ලා සිටිනවා. මාධ්‍යවලිනුත් රජයට මේව පෙන්නන්න. මොනව හරි තීන්දුවක් ගනීවි. නැත්නම් අහිංසක දරුපරපුර විනාශ වේවි. මම ඒ පිළිබඳවත් ඊට එහා කතා කරන්නෙ නැහැ.

ඊලගට කතා කරනවා නම්, මේ ආණ්ඩුවෙ මාස තුනට බලන්න සේවකයො තුන්දාහයි හාරදාහයි එළියට දාලා. ගරු සභාපතිතුමනි, එදා වේල හම්බ කරගෙන කාපු අපේ ගමේ අහිංසකයො දෙන්නෙකුත් ගමට ඇවිල්ලා. මෙන්න සාධාරණ රාජ්‍යයක් කරා යන උදවිය දැනට කරපුවා. වසන්ත මන්ත්‍රීතුමා සමෘද්ධිය පිළිබදව කතා කළා. ඒ පිළිබදව පසුව කතා කරමු. දැනට දහස් ගණනක් දොට්ට දාලා. එක්සත් ජාතික පක්ෂය 2015 ආණ්ඩුව පිහිටවල හොරකමක් වංචාවක් දූෂණයක් නැතුව කවුරු හෝ රාජ්‍ය නිලධාරියෙක් දොට්ට දැම්ම නම් කියන්න. නමුත් මේ මොහොත වෙන කොට මිනිස්සු 12000 එළියට දාලා. තව දාන්න ඊලග මැතිවරණයෙදි අපට පෝර දැම්ම වගේ. ඒ පිළිබඳවත් තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවට අපේ දැඩි අප්‍රසාදය පල කරනවා. අනිත් කාරණය පාරවල්වල තිබුන අපේ බෝඩ් ගැලෙව්වනෙ. අන්න ඒ බෝඩ් ගෙවල්වල තියෙනවා. ඌරල පැත්තෙ නම් මගේ පිංතූරෙ තිබුන හින්දද දන්නෙ නැහැ. කොඩිවිනේ වගේ වෙලා. එකක් වත් තියල නැහැ. ඔක්කොම ගලවගෙන ගිහිල්ලා. නමුත් ඌරලට මම හදවතේ පොටෝ එකක් ගැහුවා. එක්කෝටි පනස් ලක්ෂයක් වියදම් කරලා කාපට් පාරක් හදලා බොඩ් ගැහුවෙ නැහැ. හදවතේ බෝඩ් එක ගැහුවා. ගරු සභාපතිතුමනි මේ බෝඩ් රාජ්‍ය දේපොල. මම ඔබතුමාට චෝදනා කරනවා නෙවෙයි. සමහර බොඩ් ගෙවල්වල තියෙන්නෙ. තමුන්නාන්සෙ රාජකාරි කළොත් මම ගෙවල් කියන්නම්. කවුරු කළත් වැරැද්ද වැරැද්දමයි. ඒව අපි මෙතනට ගෙනැල්ල වෙන්දේසි කරමු. සභාවට ආදායමක් ලබා ගමු. ඒ සම්බන්දව තමුන්නාන්සෙගෙ සම්පූර්ණ අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊලග කාරණය පුට්ටු පාලමේ ඇන්ද ගලවලා යකඩවලට විකුනලා. මෙන්න මේ වගේ මිනිස්සුන්ට තමයි අපි පාලම් බෝක්කු දාන්නෙ. එහෙව් රටක අපි ජීවත් වෙන්නෙ. කවුරු කළත් ඒක වැරැද්ද වැරැද්දමයි. මම මේක මතක් කලේ කාට වුනත් නීතිමය පැත්තෙන් රාජකාරි කරන්න අපට බලය තියෙනවා. මම ඊලගට අවවාදයක් දෙනවා. මම ඒක ප්‍රශ්නයකට ගන්නෙ නැහැ. ගියසැරේ අපි කතා කරපුවා ඔක්කොම ඩිලීට් වෙලා. ඒකට තාක්‍ෂණය දියුනු කර ගන්න. මම එතුමට දොස් කියන්නවත් එතුමට චෝදනා පත්‍රයක් හදන්නවත් නෙවෙයි. මොකද ඒ යන්ත්‍රය යකඩනේ. මට කතා කරල ඇහුවා මට කතාව මතකයි මම කිව්වෙ කැද බොන්නවත් විදිහක් නැත සහල් මිලෙයි කියලා. බඩු මිලෙයි කියලා. අද එක ඩිලීට් වෙලා තිබුනොත් අපි මේ සභාවෙ කතා කරන අදහස් එකක්වත් වැඩක් නැහැ. ඒක නිසා බොහෝම සැලකිලිමත් වෙන්න. ඊලගට අපේ තරංග මන්ත්‍රීතුමා එතුමලගේ කතාව නැවත යොමු කරල තියෙනවයි කියලා කිව්වා. මම ඒක අහන්නම හිතාගෙන ආවෙ. දැන් මම කියපුවා යොමු කරන්න විදිහක් නැහැ. ඇත්තටම මම සාධාරණව කිව්වා අදහස් දැක්වුවයි කියලා ලියන්න කියලා. මිනිහෙක් අමාරුවෙ වැටුනට පස්සෙ මම හරස් ප්‍රශ්න අහන්න ඕන නැහැ. ඒක හැමදාම කියන්නෙ නැහැ. ඒ යොමු කිරීමත් ඉදිරියට කරගෙන සාධාරණ ගමනක් යමු. සභාපතිතුමනි ඔබතුමාගෙ අඩුපාඩු තියෙන්න පුලුවන්. සමන් මන්ත්‍රීතුමා කියපු අර ආච්චි මැරෙන්න ඉස්සර වෙලා දූරියන් ගහත් කපන්න. නැත්නම් මහා විනාශයක් වෙනවා. ඒකට මම පොඩි කාරණයක් කියන්නම් ගහක් කැපීමේ බලය ඔබතුමා සතුයි. එල් ආර් සී නෙවෙයි මොකක් වුනත් තමුන්නාන්සෙ ගිහිල්ල තමුන්නාන්සෙගෙ බලය පාවිච්චි කරන්න. එල් ආර් සී එකෙන්වත් ප්‍රාදේශීය ලේකම්ගෙන්වත් වෙන කෙනෙකුගෙන්වත් අහන්න එපා. හැල්ලු වෙන්න එපා. ගහ අනතුරුදායකයි කියලා පැමිනිල්ලක් ලැබිලා තියෙනවානම් සභාපතිවරයාට අනතුර වලක්වා ගැනීමෙ තීන්දුවකට ඒමෙ බලය තියෙනවා. ඔබතුමා ඒක කරන්න. ඒ පිළිබඳවත් මතක් කරමින් තමුන්නාන්සෙල සියලුම දෙනා කමිටුවෙ වාඩි වෙලා. සංවර්ධන සැලසුම්

හදලා සංවර්ධනය කරා යන්න ශක්තිය ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. නමුත් අපි කෝටි ගණන් වියදම් කරල තියෙනවා. ජනතාවට ඒව ටිකක් අමතක වෙලත් තියෙනවා. එහෙම නම් තමුන්නාන්සෙල ඒ තියපු අඩිය රටේ සංවර්ධනය කරා යන්න හේතු වාසනා වේවා කියල ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි මේ වෙලාවෙ කාලවේලාව ඉක්ම ගියත් කරන ලද ප්‍රකාශයන්වලට අනුව රජයේ පාර්ශවය විදියට පිළිගත යුතු කරුණු කාරණා වගේම පිළිගත නොහැකි කරුණු කාරණා පිළිබඳවත් මේ වෙලාවෙ මේ සභාවේ අවධානය යොමු වුනා. පළමුවෙන්ම සම්බන්ධීකරණ කමිටුව පිළිබඳව හැම දෙනාගෙම අදහස් පල වුනා. සම්බන්ධීකරණ කමිටුව කියන්නේ මේ ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සියලු රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලන අධිකාරිය එක තැනකට ඇවිල්ලා තීන්දු තීරණ ගන්න ස්ථානයක්. ඒ සඳහා පහුගිය රජය මගින් නීති විරෝධී චක්‍රලේඛයක් ඉදිරිපත් කළා. මේ සඳහා මහජන නියෝජිතයන් සීමා කරලා ඒ කටයුතු සීමා කරන්න. ඒ නිසා මම මේ වෙලාවෙ පැහැදිලිව සඳහන් කරනවා. ජනාධිපතිවරණය ඉදිරිපත් කරපු වෙලාවෙ. අපි පැහැදිළි ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඒ වගේම පහුගිය රජයේ තියෙන දර්ශනය සුදුසු නැහැයි කියන මත දෙක තමයි දෝලනය කළේ. එයින් අපේ කදවුර ජයග්‍රහනය කළා. ඒ අනුව පහුගිය රජය මගින් ගෙනාපු සියලු කාර්යයන් ඒ සමග අහෝසි වෙලා යනවා. ජනමතය තමයි ඉතාම වැදගත් වෙන්නෙ. එතනදි මම සඳහන් කරන්න ඕන. රාජ්‍ය නිලධාරීන්ට කතා කරන්න යම් වූ සීමාවක් තියෙනවා. ඒ වගේම අපි මෙතන මොන තරම් කතා කළත් අපේ ප්‍රදේශයේ සංවර්ධනය පිළිබඳ අදාල අංශවල සියලු රාජ්‍ය නිලධාරීන් සම්බන්ධීකරණ කමිටුවට තමයි පැමිණෙන්නෙ. ඒ පැමිණෙන නිලධාරීන් සමග ඍජුවම සම්බන්ද වෙන්න කොට්ඨාසේ මන්ත්‍රීවරයට අවස්ථාව ලැබෙනවා. කොට්ඨාසේ මන්ත්‍රීවරයට තමයි මේ සියලු ප්‍රශ්න මහජනයා ඉදිරිපත් කරන්නෙ. ඒ වගේම ඒ වෙලාවෙ ගමේ ග්‍රාම නිලධාරීතුමාට, ආර්ථික සංවර්ධන නිලධාරි තුමාට, සමෘද්ධි සංවර්ධන නිලධාරි තුමාට යම් සීමාවක් තුල තමයි ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන්න වෙන්නෙ. නමුත් දේශපාලනඥයාට මේ සියලු අංශ වශයෙන් මැදිහත් වෙලා තමන්ගෙ කොට්ඨාසවල තියෙන ගැටලු විසඳා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සම්බන්ධීකරණ කමිටුවෙදි ලැබෙනවා. මේ සියලුම මහජන නියෝජිතයන් සම්බන්ධීකරණ කමිටුවට යාම සුදුසයි කියලා මම විශ්වාස කරනවා. ඊයෙ කැප්පිටියාගොඩ උඩවැලිවිටිය පාලම පිළිබඳව කතා කළා. එවෙලෙ සභාපතිවරයා සඳහන් කළේ. මේ අවුරුද්දෙ අපට කරන්න බැහැ කියලා. නමුත් එවෙලෙ මහජන නියෝජිතයකු හැටියට මම ඉදිරිපත් වෙලා මේකෙ තියෙන බැරෑරුම්කම පිළිබඳව ඉල්ලීමක් කළා. එවෙලෙම මාර්ග සංවර්ධන අධිකාරියට කතා කරලා. මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ සඳහා පිළිතුරක් ලබා ගත්තා. එවලෙම තල්ගස්වල ඉංජිනේරුතුමාට භාර දීලා ඒ පිළිබද වාර්තාවක් එවලා මම හිතන්නෙ පහුගිය කාලය තුල ලැබුන පාලම් වලින් පාලමක් ලබා දෙන්න පොරොන්දු වුනා. කොපමණ දුරට ඒක සාර්ථක වේද නොවේද කියලා මම දන්නෙ නැහැ. නමුත් එහෙම හරි අවස්ථාවක් ලබා ගැනීමේ හැකියාව තිබුනෙ ඒ වෙලාවෙ අදාල කොට්ඨාසෙ මන්ත්‍රීවරයා මේ සම්බන්දයෙන් මැදිහත් වෙලා කතා කිරීම තුල. ඒ වගේම අනිත් අයත් එහෙමයි. හැම ප්‍රශ්නෙකදිම මැදිහත් වෙලා කතා කළා. ප්‍රාදේශීය ලේකම්තුමිය මොන ක්‍රමවේදයකට ආරාධනා කළාද කියලා මම දන්නෙ නැහැ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙ සභාපතිවරයාගේ නියෝජිතයන් විදිහට අපි සියලුම දෙනා ඒ අවස්ථාවට සම්බන්ද වුනා. ඒක නීත්‍යානුකූල නැතෙයි කියනවා නම් සම්පූර්ණ වැරද්දක්. අපි මහජන නියෝජිතයො හැටියට සහභාගිවීම නීත්‍යානුකූලයි කියල මම හිතනවා. ඒ පිළිබඳව මම එච්චරයි කතා කරන්නෙ.

ඊලගට, මේ අපේ කාලේ, අරයගෙ කාලේ, මෙයාග කාලේ කියලා. මෙතනදි වැරදි ප්‍රකාශයන් සිද්ද වුනා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ ආණ්ඩුව භාරගෙන පසුගිය රජය විසින් සිදු කරන ලද වැදගත්වූ කිසිම සංවර්ධන ක්‍රියාවලියක් ඒ වගේම ඔවුන් අරගනිපු ප්‍රතිපත්තිමය තීරණයක් කිසිම වෙලාවක

එතුමා අවලංගු කරලත් නැහැ. ඉදිරියෙදි කරන්නෙත් නැහැ. එතුමා ඒ වැඩ පිළිවෙලේ අඩුපාඩු තියෙනවානම් නිවැරදි කරලා තමයි මේ වකවානුව තුළදි අරගෙන යන්නෙ. ඒ නිසා මේක අපේ කාලෙයි අරයගෙ කාලෙයි කියන යුගය එතුමා අවසන් කරනවයි කියන එකත් මේ වෙලාවෙ මම සඳහන් කරනවා. ඒ වගේම දැන් හැමෝම කතා කරනවා බඩ පිළිබඳව. නමුත් අපි යථාර්ථය අවබෝධ කර ගන්න ඕන. කවුරු රජය කළත් මාස තුනක් වැනි කෙටි කාලයකදි අපේ රටේ තියෙන ආර්ථික පසු බිම තුල කොහෙන් හරි විශ්ව කර්මයෙක් ආවොත් මොනව හරි කරන්න පුලුවන්කම තියෙනවා. අපි කරන්න බැරි වැඩ ගැන කතා කළ යුතු නැහැ. ශ්‍රී ලංකාවෙ තියෙන ආර්ථිකය අනුව තමයි මේ ගමන යන්න වෙන්නෙ. අපේ කුඹුරු ටික පුරන් වෙලානම්, ශ්‍රම බලකාය පාරවල් ගානෙ රස්තියාදු වෙනවනම්, ස්වභාවික විපත් දේශගුණික කාලගුණික තත්වය ආර්ථිකයට බලපානවා. කවුරු ආණ්ඩුකළත් මෙවන් පසුබිමක් මිස ස්වර්ණමය යුගයක් එකවර උදා කරන්න අපහසුයි. අපේ සියලුම මන්ත්‍රීවරු සඳහන් කළා. අද රැකියාවල් අහිමි වෙලා ගොඩක් අය  පාරට වැටිලා දුක් විඳිනවයි කියලා. ඒ වගේම සඳහන් කළා. පහුගිය රජය තුල කිසි කෙනෙක් එලියට දැම්මෙ නැත කියලා. නමුත් මේ වෙලාවෙ කණගාටුවෙන් වුනත් සඳහන් කරන්න ඕන. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙත්, නිවාස අමාත්‍යාංශයෙත් සමහර අයට පත්වීමක්වත් දීලා නැතුව තමයි මේ සේවයේ යොදව ගෙන තියෙන්නෙ. ඒ වගේම යම් ආයතනයකට, දෙපාර්තමේන්තුවකට  මෙන්න මේ  කාඩර් එක අවශ්‍යයි කියලා. රජයට පඩි ගෙවන්න පුලුවන් කාඩර් එකක් නිර්මාණය කරල තියෙනවා. ඒ කාඩර් එකට පිටින් ගිහිල්ලා දේශපාලන අනුග්‍රහයෙන් මේවට පැමිණියට පස්සෙ මේ වගේ අර්බුදයක් ඇතිවෙලා තියෙනවා. ඒ නිසා මේ සියලු දෙනාට සාධාරණය ඉටු කරන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අනිවාර්යයෙන් කටයුතු කරනවා. ඒ නිසා මේක එක පාරට කරන්න බැහැ. හන්දි ගානෙ බත් උයාගෙන කෑවත් මොන දේ කළත් කාඩර් එකේ ඒ ප්‍රමාණය නැත්නම් වැටුප් ගෙවාගන්න බැරිනම් ඒ අය පිළිබඳ තීන්දුවක් ගන්න සිදු වෙනවා. ඒ නිසා තමයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙ හා නිවාස අමාත්‍යාංශයෙ අදාල සේවක පිරිසට වඩා වැඩි සේවකයන්  සඳහා පඩි ගෙවා ගන්න බැරි හින්ද තමයි මේ අය එලියට දැම්මෙ. මැතිවරණයට නාම යෝජනා කැඳවන අවස්ථාවෙ සමෘද්ධි අමාත්‍යාංශයේ පරිගණක ක්‍රියාකරු තනතුරු ලබා දුන්නා. මැතිවරණ කොමසාරිස් මේ සම්බන්දව නඩුවක් දැම්මා ඒ නඩු තීන්දුව අනුව තමයි ඒ අය අද එලියට දාල තියෙන්නෙ. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කවුරුත් කියන විදිහේ අසාධාරණ වැඩ පිළිවෙලක් කරන්න කිසිම විටක කටයුතු කරල නැහැ. මේවට උත්තර ලබා දිය යුතු නිසයි සඳහන් කරන්නෙ.

ඒ වගේම දැන් සමෘද්ධි සහනාධාරය කපන්න වැඩ පිළිවෙක් සූදානම් කරලයි කියලා වනමල් මන්ත්‍රීතුමා කිව්වා. සමෘද්ධිය කැපීමේ වැඩ පිළිවෙලක් අපේ රජය කිසිසේත්ම අනුගමනය කරන්නෙ නැහැ. නමුත් තව දුරටත් සමෘද්ධි සහනාධාරය ලබා දිය යුතු පිරිස් හඳුනා ගැනීම සඳහා ගමේ ප්‍රභූ පිරිස් දේශපාලන කොට්ඨාස, රජයේ නිලධාරීන් සම්බන්ද කරලා කමිටුවක් පත් කරන්න තීරණය කරලා තියෙනවා. ඒ කමිටුව අනුව ඉදිරියේදී තවත් සමෘද්ධිය ලබා දිය යුතු පිරිස් සඳහා අපේ රජය සමෘද්ධිය ලබා දෙන්න කටයුතු කරනවයි කියන එකත් මම මේ වෙලාවෙ සඳහන් කරනවා. ඒ වගේම තව සඳහන් කළා ගිං ගඟේ වැලි ගොඩ දානවයි කියලා. මම පැහැදිලිව කියනවා ඒකනම් පට්ට පල් බොරුවක්. ගිං ගඟේ උඩවැලිවිටියෙ ප්‍රදේශයේදී හොරාට වැලි ගොඩ දමලා, පොලීසියෙන් ගිහිල්ල අත් අඩංගුවට අරගෙන ඒකත් නැවැත්තුවා.  ගිං ගඟේ රෑට හොරා වැලි ගොඩ දානවද කියල මම දන්නෙ නැහැ. අපේ මෙහේ කොහෙවත් වැලි ගොඩ දාන්න අවසර දීල නැහැ. මේ වගේ වැරදි ප්‍රකාශ කිරීමෙන් රජය අපහසු තාවයට පත්වෙනවා. ඒ වගේම ඉඩම් ගොඩ කිරීම සම්බන්ධයෙන් ඇප දෙන්නෙ නැති නීතියක් මේ රටේ තියෙනවා. මහජන නියෝජිතයෙක් හැටියට ජයවීර මන්ත්‍රීතුමාට මෙතන කතා කරනවට වැඩිය මේ රටේ නීතිය අනුව කටයුතු කරලා පොලීසියෙ පැමිනිල්ලක් දාන්න තිබුනා. ඔබතුමා දැක්කයි කියලා  පොලීසියෙ පැමිනිල්ලක් දාල තියෙනවද? ඔබතුමාට කොට්ඨාස 15 තුලම කටයුතු කිරීමේ හැකියාවක් තියෙනවා නම් ඔබතුමා එවලෙම නීතිය ඉදිරියේ දැකපුදේ කියන්න ඕන. මෙතන කතා

කරන්නත් ඕන. මගේ කොට්ඨාසය තුල නීති විරෝධී ක්‍රියාවක් සිදු වෙනවනම් මම කවුරුවත් කියනකම් බලන් ඉන්නෙ නැහැ. මම අවශ්‍ය ක්‍රියා මාර්ගය ගන්නවා. ඒ නිසා ඔබතුමාල මෙතන ඇවිල්ල කියනව වගේම මෙන්න මම කියපු දේවල්වලට ක්‍රියාමාර්ගයක් ගත්තෙ නැහැ කියලා. ලබන මාසෙ ඇවිල්ල කියන්න පුලුවන් තත්වයක් හදා ගන්න. නැත්නම් ඔය වැරදි ප්‍රකාශ නිසා අපේ රජය අපහසුතාවයට පත්වෙනවා.

ඊලගට අපි සඳහන් කරන්න ඕන අපේ රජයට ලොකු කාර්යය භාරයක් පැවරිලා තියෙනවා. පසුගිය රජය ගම්පෙරලිය, රන් මාවත් වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. නමුත් ඒ ව්‍යාපෘති වලින් සහබන්දු මන්ත්‍රීතුමා කිව්ව වගේ ගොඩක් අය අසරණ වෙලා තියෙනවා. මොකද මුදල් ගෙවල නැහැ මුදල් ගෙවීමේ ප්‍රශ්න තියෙනවා. රටේ මුදල් නැහැ මේවට මුදල් හොයා ගන්න ඕන. ඊයෙ පෙරේද අගමැතිතුමා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම පසුගිය රජය විසින් සිදු කරන ලද සංවර්ධන ක්‍රියාවන් සඳහා මුදල් යොදවපු සියලු දෙනාට තව සතියක් දෙකක් යන කොට මුදල් ලැබෙන වැඩ පිළිවෙලක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සකස් කරල තියෙනවා. අපේ රජය කාලේ අපි කරපු ඒවට අවුරුදු තුනක් ගිහිල්ලත් සල්ලි ගන්න බැරිවුන ව්‍යාපෘති තිබුනා. ඒ වුනාට එහෙම කරන්නෙ නැහැ. ඒ නිසා ඒ කරපු ව්‍යාපෘති සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න සිදු වෙලා තියෙනවා. මේ වගේ ලොකු බරක් අපට දරන්න සිදුවෙලා තියෙනවා. ඒ වගේම ඔබ කවුරුත් දකින්න ඇති ඊයෙ රූ 360 වැඩසටහනෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය නොකර පිලිකා රෝගීන් සඳහා රුපියල් 50000 ට ගන්න තිබුන බෙහෙත 150000 ක් වියදම් කරලා ලබා ගෙන තියෙනවා. අන්න ඒ වගේ අවිධිමත් වැඩ සිදු වෙලා තියෙනවා. රජයක් හැටියට සර්ව සාධාරනව සියල්ල කරන්න පුලුවන් කියලා මම කියන්නෙ නැහැ. මෙන්න මේ වගේ නොමනා කීප දෙනෙක් කරපු ක්‍රියාවන් නිසා. අවසානයේ සර්ව සාධාරනව හිටපු මිනිස්සුන්ටත් දුක් විදින්න සිදු වෙනවා. පහුගිය රජය ටෙන්ඩර් කැඳවීමකින් තොරව නීති විරෝධීව යම් යම් වියදම් කරල තියෙනවා. ඒ නිසා අද ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඒ වගේම කවුරුත් නොදන්න පැත්තක් තියෙනවා. ඔබතුමාල අද කොළඹ පිට්ටනියකට ගිහිල්ල බලන්න මොනතරම් වාහන ප්‍රමාණයක් ගාල් කරල තියෙනවද කියලා. ඒ ගාල් කරල තියෙන්නෙ සභාපතිවරුන්ට ඇමතිවරුන්ට රජයේ නිලධාරීන්ට පාවිච්චියට ගෙනපු වාහන. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ අයට වාහන සහ තෙල් සීමා කරල තියෙනවා. ඒ වගේම ගන්න වැටුප 50% වැඩිය අඩු කරල තියෙනවා. ඒ වගේම අපට නොදැනෙන ලොකු කාර්ය භාරයක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඔබේ අපේ දරුවන්ගෙ අනාගතය වෙනුවෙන් කරමින් පවතිනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවෙන් අපට ඒක බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තු මැතිවරණෙන් පස්සෙ ඔය කියන නීති විරෝධී ක්‍රියාවන් සඳහා එතුමා නිවැරදි ක්‍රියා මාර්ගයක් ගන්නවා. ඒක මේ මැතිවරණයෙන් පස්සෙ බලාගන්න පුලුවන් කියන එකත් මම සඳහන් කරනවා. ඒ නිසා ඔබ අපි මොන මත දැරුවත් හොඳ දේ හොඳයි වැරදි දේ වැරදියි කියන්න ඕන. ඒ වගේම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේක භාර ගත්තට පස්සෙ එතුමට කාටවත් ඇගිල්ල දික් කරන්න බැරි තරමට එතුමා නම්‍යශීලී වුනා. ඒ වගේම එතුමා යම් වැඩපිළිවෙලක් සිදු කරල තියෙනවා. ඒ අනුව අපි හිතනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අපි ඔබ වෙනුවෙන් යමක් කරාවි.

ඒ වගේම අපි සතුටින් ප්‍රකාශ කරනවා. ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමකම අතු පැලක් තියෙන නිවසක් වෙනුවෙන් වර්ග අඩි 550 ක අංග සම්පූර්ණ නිවසක් අපි නිර්මාණය කරනවා. ලංකාවේ ග්‍රාම නිලධාරී වසම් දාහතර දහස් ගණනක් තියෙනවා. ඒ සෑම ග්‍රාම නිලධාරී වසමකම වර්ග අඩි 550 ක අංග සම්පූර්ණ නිවසක් අපි නිර්මාණය කරනවා. නොබෝ දිනකින් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසෙ ඌරල නැහිනිගල ගම්මානයෙන් ආරම්භ කරනවා. ඒක සංකේතවත් වැඩසටහන. ඒ වගේම සෑම ග්‍රාම නිලධාරී වසමකටම සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 20 ක මුදලක් ලබා දීල තියෙනවා. ඒක මේ සතියෙ ගිවිසුම් අත්සන් කරල අවසන් කරනවා. ලබන සතිය වෙන කොට අපි වැඩ ආරම්භ

කරන්න බලාපොරොත්තු වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අලුත් වැඩපිළිවෙලක් යටතේ මේ රට නිවැරදි දිසාවට යොමු කරනවා. ඒ වගේම ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් පුරන් කුඹුරු සියල්ලම මේ වන විට සංඛ්‍යා ලේඛන ගත කරනවා. පුරන් කුඹුරු කොපමණ තියෙනවද? පුරන් වීමට හේතුව කුමක්ද? කියලා සොයා බලනවා. ඒ වගේම අපි දැක්කා පහුගිය කාලේ රැකියා දෙන එක යම් පිරිසකට සීමා කරලා තිබුනෙ. අපි ඒක මග හරවලා සාමාන්‍ය පෙළ සමත් නැති අසමත් ඒ වගේම සාමාන්‍ය පෙළින් පහල අයගෙන් ලක්ෂයක ශ්‍රම බලකායක් නිර්මාණය කරලා වෙනම දෙපාර්තමේන්තුවක් හදනවා. අද ඕනම කෙනෙකුට ගමේ ග්‍රාම නිලධාරීවරයට තමන්ගෙ අනන්‍යතාවය තහවුරු කරලා. පාසල් හැරයාමේ සහතිකය සමග අයදුම් පත්‍රයක් ප්‍රාදේශීය ලේකම්ට එවලා. ඒ ශ්‍රම බලකායට ඇතුලු වෙන්න පුලුවන්. ඒ ශ්‍රම බලකාය තුලින් මේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙන යන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කටයුතු කරගෙන යනවා. ඒ වගේම උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් සඳහා රැකියා ලබාදීමේ වැඩපිළිවෙල සඳහා මේ 14 වෙනිදා වෙන කොට ජනාධිපති ලේකම් කාර්යාලයට ඉතාම ඉක්මනින් ඔබේ ප්‍රදේශයේ ඉන්න සියලුම දෙනා මේ 22කට කලින් ලබා දෙන්න. ඒ වැඩ පිළිවෙල තුල කිසිම පක්ෂ පාට භේදයක් නැතුව උපාධිධාරීන්ට සහ ඩිප්ලෝමාධාරීන්ට රැකියා ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කරනවා. ඒ වගේම ගුරු සහායක විභාගය එන සතියෙ ඒක ගැසට් කරනවා. පොඩි විභාගයකට පෙනී ඉදල උසස් පෙළ සමත් අයට ගුරු සහායක ලෙස කටයුතු කරන්න අවස්ථාව තියෙනවා. සෑම පාසලකම පහ වසර දක්වා ගුරු සහායකයෙකු දැමීමේ වැඩපිළිවෙලක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ තියෙනවා. ඒ වගේ පැහැදිලි වැඩපිළිවෙලක් එතුමා මේ පුංචි කාලය තුල ක්‍රියාත්මක කරන්න සූදානම් කරල තියෙනවා.

ඒ වගේම අපේ සභාවලටත් මහා පරිමානයෙන් නැතත් අපට ශක්තියක් වෙන්න භාණ්ඩ හා උපකරණ යම් ප්‍රමාණයක් ලබා දුන්නා. ඒක සභාපතිතුමාගේ මූලාසන කතාවෙදි සඳහන් කරාවි. ලංකාවෙ හැම ප්‍රාදේශීය සභාවකම ගමනාගමනයට අපහසු කිලෝ මීටර 10 ක ප්‍රමාණයක් කාපට් කරන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වැඩපිළිවෙලක් සූදානම් කරලා තියෙනවා. ඊට අමතරව ආසන මට්ටමින් දුෂ්කර ආසනයක් නිසා හිනිදුම ආසනයට විශේෂයෙන් කාපට් ප්‍රමාණයක් ලැබිල තියෙනවා. කිලෝ මීටර් 20 හෝ 40 ක ප්‍රමාණයක් ඒ ආදී වශයෙන් ලොකු සංවර්ධන වැඩපිළිවෙලක් අපි ඉදිරියෙදි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මම මේ වෙලාවෙ සියලුම දෙනාට ආරාධනා කරනවා. චාරිකාව සඳහා සහභාගි වෙන්න. දින වෙනස් කර ගන්න ඕන නම් දින වෙනස් කර ගනිමු. යන්න ඕන පිරිස් සම්බන්ද කර ගන්න ඕන නම් ඒක කර ගමු. මේ තියෙන කාර්ය බහුලත්වයෙන් මිදිල 27 දෙනාම විනෝද චාරිකාව සඳහා සහභාගි වෙන්න කියන ගෞරවණීය ආරාධනය කරනවා. ඒ වගේම අපි තව සඳහන් කරන්න ඕන. මේ මාර්තු පළවෙනිද ඉදල සියලුම වතු කම්කරුවන්ට රුපියල් 1000 ක වැටුප ලබා දීමේ වැඩපිළිවෙල වගේම අත්‍යවශ්‍ය භාණ්ඩ 15 වෙනිද ඉදල විශාල ප්‍රමාණයක් මිල අඩු කරන්න වැඩපිළිවෙල සූදානම් කරනවයි කියන එක සඳහන් කරනවා. අපේ සභාව තුලත් එක එක්කෙනාට ඇඟිල්ල දික් කර ගන්නෙ නැතුව අපි එකාවගේ මේ වැඩපිළිවෙලට අනුගත වෙලා. ගිය ආණ්ඩුව මේ ආණ්ඩුව කියන සංකල්පය නැතිකරලා. අපේ දරුවන්ගෙ අනාගතේ සුරක්ෂිත කරන්න හෙට දින සෞභාග්‍යවත් දේශයක් ගොඩ නගන්නට සියලු දෙනාට ගෞරවයෙන් ආරාධනා කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුනි අපේ උප සභාපතිතුමත් කිව්වා ලක්රුවන් මන්ත්‍රීතුමත් කිව්වා. මම ඉල්ලීමක් විතරයි මේ කරන්නෙ. මම හිතන විදිහට ලංකාවෙම කාපට් ව්‍යාපෘතිය කිලෝ මීටර් ලක්ෂයක් කොහේද. මම විජිත් සහබන්දු මහත්මයට යෝජනා කරනවා. මාමනදොල පාර අපි සල්ලි පාස් කරලා ඔක්කොම අනුමත කරලා තිබුනා. පුලුවන්නම් ඒක ඔබතුමා මේ ව්‍යාපෘතියට යෝජනා කරන්න. ගම්මානෙට යන ප්‍රධාන පාරක්. ඒක හරි බරපතල කාරණයක්.

1990 සුව සැරිය ගිලන් රථ සේවාවවත් යන්න බැහැ. ඒ පිළිබඳව සභාවෙ සභාපතිතුමාගෙ ඒ වගේම අපේ ගමේ මන්ත්‍රීතුමාගෙ සියලු දෙනාගෙ අවදානය යොමු කරන්න කියලා කියනවා. මේ වගේ සුන්දර ආණ්ඩුවක් තියෙනකොට අපි කැමතියි දිගටම විපක්ෂෙ ඉන්න. අවංකවම අපි කැමතියි. ප්‍රභල නෙවෙයි දුර්වල විපක්ෂෙක වුනත් මෙහෙම වාඩිවෙලා ඉන්න කැමතියි. හරිම සුන්දරයි. මේ ආණ්ඩුව මේ විදිහට කරගෙන යනවා. මාරයි අහන් ඉන්න සංතෝෂයි. මම හරිම කැමතියි මේ වගේ ආණ්ඩුවකට. නමුත් ලක්රුවන් මන්ත්‍රීතුමා ඔබතුමා දන්නෙ නැතුව ඇති. නාගොඩ කණිෂ්ඨ විද්‍යාලය ලගට ගිහින් බලන්න. මම දන්න තරමින් ළමයින්ට ලබා දුන් කිරි පැකට් එක නවත්තලා. ලොකු ඒව මම කියන්නෙ නැහැ. ලක්රුවන් මන්ත්‍රීතුමා හුගක් දේවල් අපිට අහිමි කරල තියෙනවා. ඔය කියන රටට ඔය කියන ආණ්ඩුවට අපි කැමතියි. මම මේ විපක්ෂෙම වාඩිවෙලා ඉන්නවා. මේ ආණ්ඩුවට විරුද්ධව. ආපහු එක ඡන්දයක් වෙනුවෙන් ගමේ ඇවිදින්නෙ නැහැ. මොකද ඔය කියන විදිහට ඒ තරම් සුන්දයි . නමුත් මිත්‍රවරුනි අද වෙන කොට පොලීසියට ආයතනවල කිසිම වැටලීමක් කරන්න එපා කියලා ලියුම ඇවිල්ලා තියෙන්නෙ. සභාපතිතුමා දන්නවා වගකීමෙන් කියන්නෙ. එතුමා ඉන්න සාකච්ඡාවෙදි ඒක කිව්වෙ. කිසිම වැටලීමක් කරන්න එපා කියලා. මේ ඡන්දය හින්ද පස් අල්ලන ඒවා, කසිප්පු අල්ලන ඒවා, කුඩු අල්ලන ඒවා මේ සියල්ල රෝඩ් බ්ලොක් ඉදල නවත්වල තියෙන්නෙ. මේ ඡන්දය වෙනකම් කිසිම වැටලීමක් කරන්න එපාය කියල තියෙනවා. ඇත්තම කතාව ඒ රැස්වීමෙ සභාපතිතුමත් හිටියා. ඔය කියන ඒව කරනවා නම් ඇත්තටම අපි විපක්ෂෙ වාඩිවෙලා ඉන්න කැමතියි. අපේ ආණ්ඩුව අපි දුර්වල ආණ්ඩුවක හිටියෙ. වැඩ කළාට වැඩක් වුනේ නැහැ. ඔබතුමාල කියන මේ ගෙවල් අපි හැදුවා. වලකුඹුරෙ තියෙන උඩ පහත දෙපැත්තෙම තියෙන ඔබතුමියගෙ ගෙවල් හැදුවෙ ආණ්ඩුව. ඒ මිනිස්සු මේ ගේ ඇතුලෙම ඉදගෙන අපට විරුද්දව ඡන්දය දෙනවා. එහෙම තමයි ඒක ගැටලුවක් නැහැ ගෙවල් හැදුවා. ඔය කියන කතා කරන්න බැහැ. නමුත් අපි බොහොම සංතෝෂයි. ඔය තුල නෙවෙයි අර අපේ සහබන්දු මහත්තය කිව්ව භූමිතෙල් ගහගෙන දුවන බස් ටික පුලුවන්නම් නවත්තන්න. මම උදේ හවස ගාලු යන මනුස්සයා. ඇත්තටම යන්න බැහැ. පුදුම පවක් ඒක ඇස් දෙක පිච්චෙනවා. අද බයිසිකලයක් පදින අපි පව්කාරයො. මාපලගම ගාල්ල පාරෙ බස් තුනයි ඩීසල් ගහන්නෙ. අනිත් සියල්ල භූමිතෙල් ගහන්නෙ. මෙන්න මේ කියන තැන තමයි අපි ඉන්නෙ. ඒ හින්දා ඔය කියන දේවල් කරන්න පුලුවන්නම් අපි කැමතියි. ගෝඨාභය මහත්තයගෙ කිසිම ප්‍රශ්නයක් නැහැ.

ඒ වගේම මෙතන කතා කළා ධර්මසිරි මන්ත්‍රීතුමා, ලක්රුවන් මනත්‍රීතුමා ඔබතුමාල සංවර්ධන කමිටුවට ගිය එකට අපේ විරෝධයක් නැහැ. අපි කියන්නෙ ඒ ක්‍රමේ වැරදියි කියලා. අපේ ආණ්ඩුවෙන් කරපු ගොන් මොට්ට වැඩක් අපි ඒකට චෝදනා කරනවා. සම්පූර්ණ ගමේ දේ කතා කරන්න තිබුන අයිතිය නැති කරපු එකක්. නමුත් ඔබතුමාල ගියයි කියලා ද්වේශයෙන් කතා කරපු එකක් නෙවෙයි අපි කිව්වෙ. ඒ වගේම මම ධර්මසිරි මන්ත්‍රීතුමාගෙන් පුංචි ඉල්ලීමක් කරනවා. ගිය සභා වාර්තාවෙ තිබුනා යම් කෙනෙක්ගෙ නමක් සදහන් කරලා අනුවර්ථ නාමයකින්. මම ඒ අයට කැමති නැහැ. සභාපතිතුමයි මමයි දවසක් ගිහිල්ලා තඹ රුපියලකට එයා සැලකුවෙ නැහැ. මේ සභාපතිතුමා එතකොට සභාපතිවෙලා නැහැ. මමත් එතුමත් එක්ක ගියහම අපිට කණගාටු වෙන විදිහට අපිට කතා කළේ. නමුත් එයාට ධර්මසිරි මන්ත්‍රීතුමා කතා කරපු විදිහ වැරදියි. මොකද එයාට මෙතන ඇවිල්ල උත්තර දෙන්න බැහැ. අපේ නිලධාරි මහත්තයට කියනවා මීට පස්සෙ ඒ වගේ දේවල් සභාගත කරන්න එපා. මොකද එයාට මේකට ඇවිල්ල උත්තර දෙන්න බැහැ. කවුරු හෝ වේවා ඒක මම කතා කළත් මේ වෙන කෙනෙක් කතා කළත් වැරදියි. එයාට ඇවිල්ල උත්තර දෙන්න බැරි හින්ද ඒ වගේ වචන සභා වාර්තාවෙ දාන්න එපා. ඒක හොද වැඩක් නෙවෙයි කියන එකත් සිහිපත් කරමින් සියලු දෙනාට සුබ දවසක් කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, දීර්ඝ වෙලාවක් ඉතා වැදගත් කතා කීපයක් කරලා අවසන් වුන වෙලාවක දීර්ඝ වශයෙන් කතා කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. මොකද අපේ මන්ත්‍රීතුමාලා අවශ්‍ය පිළිතුරු ලබා දුන්නා. ගරු සභාපතිතුමනි, අයාලේ යන ගවයන් ගැන කතා කළා. අපේ ප්‍රාදේශීය සභාවේ ග්‍රාමසේවා වසම් 50 කට විතරම ඔය අයාලේ යන ගවයන්ගෙ ප්‍රශ්නය තියෙනවා. ගරු සභාපතිතුමනි මම යෝජනාවක් නෙවෙයි අදහසක් විදිහට කියනවා. ඊයෙ සම්බන්ධී කරණ කමිටුවෙදි කතා කළා. ඇප්තොප් වත්තෙ අක්කර 35 ක ඉඩම අපිට ලබා ගන්න. ඒ වගේ ඉඩමක විශාල ප්‍රමාණයක් කොටු කරලා. මේ වගේ අයාලේ යන ගවයන් අල්ලල දාන්න. සභාපතිතුමනි, මේ ගමේ ඉන්න සාම්ප්‍රදායික ගවයන් තමයි උස්සගෙන යන්නෙ. දෙමුහුන් ගවයන් නෙවෙයි. මේ කිරි දෙනුන් ගෙන් ගන්න කිරි බෝතලයකට දෙමුහුන් ගවයන් ගෙන් ගන්න කිරි බෝතල් 10 විතර කවලම් කරන්න පුලුවන්. සාම්ප්‍රධායික ගවයන්ගෙ කිරි ගුණයෙන් වැඩියි. ඒ නිසා අපිට මේකට නිලධාරියෙක් ඒ වගේම සේවකයන් යොමු කරලා. ගවයන් ගෙන් කිරි ලබා ගෙන යෝගට් කර්මාන්තයක් වගේ දෙයක් පටන් ගන්න පුලුවන්. ඒ පිළිබඳව ඔබතුමාගේ අවදානය යොමු කරන්න.

ගරු සභාපතිතුමනි, ඒ ගවයන්ගෙ ප්‍රශ්නය වගේම මොනරුන් වඳුරන් රිලවුන් වගේ සතුන් ගෙන් වන හානිය විශාලයි. අයාලේ යන සුනඛයන් නිසා බයිසිකලයක යන්න වත් බැහැ අනතුරට පත් වෙනවා. ඒ නිසා මේ පිළිබඳ අවදානය යොමු කරන එක හොඳයි. මොකද අපි පහුගිය කාලෙ ආහාර හිගය නිසා නොයෙක් අපහසුතාවන්ට පත්වුනා. ගම්වල ගෘහ ආර්ථිකයක් වශයෙන් එලවළු පළතුරු වවන අය මේ ප්‍රශ්නය නිසා ඉතාම අපහසුතාවයට පත්වෙනවා. ඒ නිසා මේ සතුන් වඳ කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ සම්බන්ධීකරණ කමිටුව ගැන කතා කළා. අපේ සම්පත් අතුකෝරාල මැතිතුමා ගැන අපේ නන්දන මන්ත්‍රීතුමත් කිව්වා. ජනාධිපතිතුමා විසින් නීත්‍යානුකූලව සභාපති වශයෙන් අපනයන බෝග ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා පත්කරලා තියෙනවා. උප සභාපති වශයෙන් සම්පත් අතුකෝරාල මැතිතුමා පත්කරලා තියෙනවා. එතුමා විශාල ජනතා ප්‍රසාදයක් ලබා ගත්ත නායකයෙක්. තමුන්නාන්සෙලට ඒක බලා ඉන්න බැරි කමට නොයෙක් කතා කිව්වට අපි ඒව ගැන සැලෙන්නෙ නැහැ. එතුමාල සමග අපි ඉදිරියෙදි මේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු දියත් කරනවා.

ඒ වගේම වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා කිව්වා. කටින් බතල කොල හිටෙව්වයි කියලා. කටින් බතල කොල හිටවන්නෙ දැන් නෙවෙයි. පහුගිය අවුරුදු හතර හමාරක් බතල කොල හිටවල තමයි ඔබතුමාලට විපක්ෂයේ ඉන්න වුනේ. ඔබතුමාලගෙ නායකයො කටින් බතල කොල හිටවපු හින්ද තමයි තමුන්නාන්සෙලත් අපහසුතාවයට පත් වෙලා තියෙන්නෙ. අපිත් කණගාටු වෙනවා. සංවර්ධන කමිටුවට  තමුන්නාන්සෙලත් ආවනම් හොඳයි. අපි ගිය එක ගැන මොකුත් ප්‍රශ්නයක් නැහැ. මහජනතාවගෙ ඡන්දයෙන් පත්වෙච්ච නියෝජිතයො වශයෙන් අපි 15 දෙනා ඒකට සම්බන්ද වුනා. පක්ෂ නායකයෙක් වශයෙන් රංජිත් ජයවීර මන්ත්‍රීතුමත් ගියා. සභාපතිතුමනි විපක්ෂ නායකතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ට ඔබතුමා ආරාධනා කරන්න. ඒ දවස්වල අපි ඔතනින් පැත්තකට වෙලා ඉන්න කොට ඔබතුමාල ඒ කාලෙ ඒ ගැන හිතුවෙ නැහැ. ඒ ගැන අපි කණගාටු වෙනවා.

ඒ වගේම අපේ විපක්ෂ නායකතුමා කිව්වා. රටේ භීෂණයක් ඇති වෙලා හොරු කඩ කඩනවා. මේ වගේ එතුමා භීෂණයක් මවා පෑවා. අපේ කාලෙ එහෙම භීෂණයක් ඇතිවෙන්නෙත් නැහැ. ඇතිවීමට ඉඩ දෙන්නෙත් නැහැ. රටේ කොන්ද පන ඇති නායකයෙක් ඉන්නවා. ඔබතුමාලා බඩු මිල ගැන කතා කරනවා. පසුගිය කාලෙ පාලනය කරපු එක්සත් ජාතික පක්ෂ රජය කරන ලද අදූරදර්ශී ක්‍රියා නිසා. අපේ රජය අපහසුතාවයට පත්වෙලා තියෙනවා. ඒවගේම ආර්ථික සංවර්ධන වේගය 3% අඩු මට්ටමකට ඇවිල්ල තියෙනවා. ගරු සභාපතිතුමනි, ජනතාවගේ ප්‍රශ්න විසදන විට ඒක බලාගෙන ඉන්න බැරිකමට

කියන ඒවට සැලෙන්න එපා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙ කාලය තුලදී යම් වැඩ කොටසක් කෙරුනෙ නැහැ කියලා මේ සභාවෙ කියවුනා. ඇත්තටම ගරු සභාපතිතුමනි ඔබතුමා හිටියෙ විපක්ෂයේ. ආණ්ඩුවක් තිබුනෙ නැහැ. අපේ ජනාධිපතිතුමා විතරයි. අපි අටව ගත්ත ආණ්ඩුවක් තියෙන්නෙ. ඔබතුමාගෙ කාලෙ සැහෙන වැඩ කොටසක් කෙරුනා. ඔබතුමා මේ සභවෙ ආදායම් නැතුව මේක යන්තම් අපහසුතාවයට පත් නොවී පවත්වාගෙන ආවා. ඉදිරියේදී අපේ රජයේ ශක්තියත් එක්ක 80% කට වඩා මේ සභවෙ කතා කරන දේවල් ක්‍රියාත්මක කරන්න ඔබතුමාට ශක්තිය ලැබේවි. තව මාස දෙකක් තුනක් යනකොට අපි තුනෙන් දෙකේ බලයක් සහිත ආණ්ඩුවක් පත් කරලා. හොඳ අමාත්‍ය මණ්ඩලයක් දිවිරුම් දීලා. අපි වැඩ කරන්න පටන් ගත්තට පස්සෙ. ඔබතුමාලට මොකක්ද කරන්නෙ කියන එක කට උත්තර නැතුව බලාගෙන ඉන්න වෙයි.

අතිගරු ජනාධිපතිතුමාගේ වැඩපිළිවෙල තමුන්නාන්සෙලට තව ටික දවසක් යන කොට බලා ගන්න පුලුවන් වෙයි. ඒ වගේම අපි යන්න බලා පොරොත්තු වෙන විනෝද චාරිකාව අපි සියලු දෙනා එක්කම යමු. ඒ සදහා තමුන්නාන්සෙලා සියලු දෙනාම පැමිණෙන්න කියලා ආරාධනා කරනවා. අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්ව වගේ අපි ඉල්ලීමක් කළා පාරකට කාපට් දාන්න පාරවල් හදල දෙන්න කියලා. අපි ඒවට සියලු සැලසුම් කරලා අපේ මන්ත්‍රීවරු 15 දෙනාගෙම වසම්වල ඉතාම සාර්ථක වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරන්න මෙතුමලා කටයුතු සූදානම් කරල තියෙනවා. අපේ මන්ත්‍රීවරු සංවර්ධන සැලැස්ම හදලා තියෙනවා. විශේෂයෙන් මාමනදොල පාර අපි ඊයෙම කිලෝ මීටර් හතර හමාරක් මන්නවා ගත්තා. ඒ බවත් මතක් කරමින් සියලු දෙනාට සුබ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි ඊයෙ දින සංවර්ධන කමිටු රැස්වීම පවත්වලා. පැය 28 ක් යනකොට ඒ සංවර්ධන කමිටු රැස්වීම පිළිබදව. මේ සභාවේ මාතෘකාවක් වෙලා. විවිධ විදිහට අදහස් ප්‍රකාශ කළා. හෙට පුවත්පතක නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති සංවර්ධන කමිටු රැස්වීම අසාර්ථක, නීත්‍යානුකූල නොවන එකක්ය කියලා. මේ ජනමාධ්‍යවේදී මහත්වරුන්ගෙන් යම් ප්‍රවෘත්තියක් පලවුනොත්, ඒක මේ ප්‍රදේශයේ ජනතාවට කරන විශාල අසාධාරණයක්. ඒ වගේම මේ කටයුතු සංවිධානය කරපු ප්‍රාදේශීය ලේකම්තුමියටත් එම කමිටුවේ නායකත්වය ගත්ත රමේෂ් පතිරණ මැතිතුමා ඇතුලු දේශපාලන අධිකාරියේ සියලු දෙනාටත්, ඒ වගේම ඒ සදහා සම්බන්ධ වුන නිලධාරී මහත්වරුන්ටත් කරන ලොකු අසාධාරණයක්. ඊයෙ එතනට සම්බන්ධ නොවුන ගරු මන්ත්‍රීතුමන්ලට මතක් කර සිටිනවා. ඒ සදහා කැදවීමෙදි යම් යම් අඩුපාඩු සිදු වුනානම්, ඒ පිළිබදව ගරු මන්ත්‍රීතුමාල සියලු දෙනා ප්‍රකාශ කළා වගේ මමත් මේ අවස්ථාවෙ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ සදහා විධිමත්වූ වැඩපිළිවෙලක් ඉදිරියට ක්‍රියාත්මක කරලා. පක්ෂ විපක්ෂ දේශපාලන බේදයකින් තොරව සියලු දෙනාට. ඒ හා සම්බන්ද වීමට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් සලසා දෙන්න. ඒ පිළිබද කතිකාවක් ඇති කරන්න අපිත් කටයුතු කරන බව මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා. ඊයෙ පැවතුනු සම්බන්ධීකරණ කමිටු රැස්වීම ඉතාමත් සාර්ථක, ප්‍රදේශයේ ජනතාවට යහපතක් උදාවෙන, ප්‍රදේශයේ ජනතාවගේ විශාල අඩුපාඩුකම් හදුනාගත්, ඒ සදහා ක්ෂණික පිළිතුරු ලබා දුන්, විශේෂයෙන්ම අදාල අමාත්‍යාංශ ලේකම්වරු, දේශපාලන අධිකාරියේ නායකයන් සහ ඒ ව්‍යාපෘති භාර සියලු දෙනා දුරකතනයෙන් සම්බන්ද කරගෙන, ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීපු ඉතාම සාර්ථක සම්බන්ධීකරණ කමිටුවක් පැවැත්තුවයි කියලා කියන්න කැමතියි. අපේ සහබන්දු මන්ත්‍රීතුමා ඊයෙ එතනට සම්බන්දවෙලා, තමන්ගෙ අදහස ප්‍රකාශ කරලා, සම්බන්ධීකරණ කමිටුවට තමන්ගෙ දේශපාලන අධිකාරියේ සියලු දෙනා සම්බන්ද කර නොගැනීම පිළිබදවත්, අනෙකුත් දේශපාලන පක්ෂවල සියලුදෙනා කැදවීම පිළිබදවත්, තමන්ගෙ විරෝධතාවය ප්‍රකාශ කළා නම්, අවංකවම අපිත් මේ සභාවෙ සියලුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඔබතුමාගෙ මාතෘකාව වෙනුවෙන් කතා කරලා, එවලෙම

පිළිතුරක් දීලා, අපෙත් නීත්‍යානුකූල නොවන අය හිටිය නම්, අපිත් එළියට ඇවිල්ලා. ඒ ගරුත්වය ඔබතුමාලට ලබා දෙන්න කටයුතු කරන බව හදවතට එකගව මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා. ඒ වගේම ඊලග සම්බන්ධීකරණ කමිටුවට නීත්‍යානුකූල නොවන ආකාරයට අපිට ආරාධනා කරල තියෙනවනම්, දුරකතනයෙන් හෝ ලිඛිතව අපිත් සම්බන්ධ නොවන බව මේ සභාව හමුවේ කියන්න කැමතියි. ඒ නියෝජනයට සභාපතිතුමා උප සභාපති විදිහට මට, ඒ වගේම දේශපාලන අධිකාරියේ විවිධ පක්ෂවල නායකයන්ට, මන්ත්‍රීවරුන්ට සම්බන්ද වෙන්න තියෙනව නම් ඒ අය සම්බන්ද වෙයි. පොදුවේ ඒ මතය ප්‍රකාශ කරන බව මේ සභාව හමුවේ කියන්න කැමතියි. ඒ සඳහා ඉදිරියෙදි යම් වැඩපිළිවෙලකට එන්න එකඟ බව ගරු මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරනවා. ඒ වගේම අපහසුතාවයක් ඇති වුනානම් අපේ කණගාටුව මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරනවා. සම්බන්ධීකරණ කමිටුව පිළිබඳව නොයෙකුත් අඩුපාඩු අපි දුටුවා. ඒව මෙතන විවේචනය කරන්න ඕන නැහැ. ඒව අදාල නිලධාරීන්ට වගකිව යුත්තන්ට අපි ප්‍රකාශ කරන්න සූදානම්. ඒ අඩුපාඩුවත් හදාගෙන අපි මේ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා පසුගිය කාලයේ වෙච්ච දුර්වලකම්, අඩුපාඩු, අතපසු වීම් මග හරවාගෙන. ඒ වගේම ඉදිරියේදී අපි කළ යුතු වැඩ කොටස් පිළිබඳව අපි සියලු දෙනා එකතු වෙලා කටයුතු කරමු කියලා. මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරනවා.

මෙතන වැදගත් මාතෘකා කීපයක් අපේ රංජිත් මහත්මයා ප්‍රකාශ කළා. අයාලේ යන ගවයන් පිළිබඳව 1991 ඉදලම සභාවට පත්වෙච්ච ගරු සභාපතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව කතා කළා. මේ සභාවෙ ඒක මාතෘකාවක් වෙලා තියෙනවා. පසුගිය හිටපු ලේකම් තුමිය මේ සභාවෙ කටයුතු කරද්දි සභාවට අවශ්‍ය නිලධාරීන් තනතුරු පිළිබඳව දැනුම් දීමක් කරන්න කියලා ලිපියක් එවල තිබුනා. ඒ අවස්ථාවෙ මම ගරු සභාපතිතුමාටත් කිව්වා. අපට අවශ්‍යයි ප්‍රදේශයට අයාලේ යන ගවයන් ඇල්ලීම සඳහා සුදුසුකම් තියෙන කීප දෙනෙක් බඳව ගන්න. අපේ පනතේ අපට බලය තිබුනත්, ඒ සඳහා වැටුප් ගෙවීමෙදි යම් යම් ගැටලු තියෙනවා. ඒ නිසා නීත්‍යානුකූලව සේවකයන් බඳවා ගැනීම සඳහා අවස්ථාවන් කීපයක් අපේ සභාවට ලබා දෙන්න කියලා. ලිපියේ සඳහන් කරල යැව්වා. ඒවා ඉදිරියෙදි ක්‍රියාත්මක වෙනව නම්, මුදල් ප්‍රතිපාදන ප්‍රතිපූර්ණය වෙනව නම්, සභාවක් වශයෙන් දීර්ඝ කාලීනව තියෙන ප්‍රශ්නයකට විසඳුමක් ලබා ගන්න පුලුවන්. ඉදිරි කාලයෙදි යම් කටයුත්තක් කරන්න පුලුවන්නම් ගරු සභාපතිතුමනි ඒ සඳහා අවස්ථාව සලසා ගන්න කියල මම මේ අවස්තාවෙ සභිපත් කරනවා.

ඊලගට විශේෂයෙන්ම ඊයෙ අපට දැනගන්න ලැබුනෙ. මාපලගම හල්අත්ත ඇල සිට තල්ගස්වලට යන පාරෙන් යට පැත්තෙ බිම් කොටස අර ශෙඩ් එකට එහා තියෙන බිම් කොටස පිළිබඳව. ඒවයි අයිතිය පිළිබඳව යම් යම් ගැටලු ඊයෙ අපි දැන ගත්තෙ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කියනවා එයාලට අයිති නැහැ කියලා. එල් ආර් සී එක කියනවා එයාලට අයිති නැහැ කියලා. මාර්ග සංවර්ධන අධිකාරිය කියනවා එයාලට අයිති නැහැ කියලා. ඒ නිසා අනවසරයෙන් ගොඩ කරගෙන යනවා. ඒක තමයි දැන් මේ සභාවෙ කතා කළේ. දැන් මේක කාටද අයිති කියලා හොයා ගන්න වෙනවා. එතනට ආපු නිලධාරි මහත්වරු කියන්නෙ තමන්ට අයිති නැහැ කියලා. අයිතිවාසිකම් කියන්න කිසිම ආයතනයක් සූදානම් වෙලා නැහැ. මේව තමයි තිබුන ගැටලු.

ඊලගට විශේෂයෙන්ම සමෘද්ධි සහනාධාරය පිළිබඳ නැවත වරක් සමීක්ෂණය කරනවා. ඒවා කපා හරින්න කටයුතු කරන බවක් අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්වා. එහෙම දෙයක් සිදු වෙන්නෙ නැහැ. අපේ කොට්ඨාසවල සමෘද්ධි නිලධාරී මහත්වරු අපිත් එක්ක කතා කරනවා. තවම දීපු කිසිදු සමෘද්ධි සහනාධාර කාඩ් එකක් කපන්න, ඒව සංශෝධනය කරන්න වැඩපිළිවෙලක් මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසෙනම් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. සමස්ථ රටේම එවැනි තත්වයකට තවම කටයුතු කරල නැහැ. ඒ නිසා දීපු සමෘද්ධිය පිළිබඳව කිසිදු ගැටලුවක් ඇති කර ගන්න එපා. ග්‍රාම නිලධාරීවරයා කියනවනම් මෙයාට රැකියාවක් ලැබිල ආදායම් තත්වය ඉහල ගිහිල්ලයි කියලා. ඔවුන්ගේ සමෘද්ධිය

අභිමි කිරීමේ අයිතිය දෙන්න ඕන. නැත්නම් දේශපාලන වශයෙන් සමෘද්ධි කාඩ් කප්පාදුවක් කවදාවත් සිදු වෙලත් නැහැ. සිදු වෙන්නෙත් නැහැ. ඒවට අපි කැමතිත් නැහැ. ඒ නිසා අපි ඒ පිළිබඳව වගකිව යුතු විදිහට කටයුතු කරන්න සූදානම්. අපේ ගම් වාසීන්ට යම් අසාධාරණයක් වෙලා තියෙවානම් ඒ අයට ලබා දෙන්න කියල තමයි අපි ඉල්ලීම් කරල තියෙන්නෙ.

විශේෂයෙන්ම දැනගන්න ලැබුනා. පාලම් ව්‍යාපෘතිවල මේ කොට්ඨාසයේ පාලම් කීපයක්ම, වැඩ කරගෙන යන්න බැරුව මුදල් නැතුව මුදල් ගැටලු තියෙන නිසා අතරමග නතර වෙලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පාලම් ව්‍යාපෘති හදුනගන්නත් බැහැ. රැස්වීමට ආපු එක ව්‍යාපෘතියක මහත්මයෙක් දන්නෙ නැහැ. අනිත් පාලම දාන්නෙ කාටද කියලා. සමහර විට ප්‍රාදේශීය ලේකම්තුමිය දන්නෙත් නැහැ. සැලසුම් අංශය දන්නෙත් නැහැ. දේශපාලන අධිකාරිය දන්නෙත් නැහැ. කිසි කෙනෙක් දන්නෙ නැහැ. පාලම් ව්‍යාපෘතිය ආවෙ කොහොමද? මුදල් ගෙවන්නෙ ගිවිසම් අත්සන් කරල තියෙන්නෙ කවුද? වගකිව යුතු කවුද? කොන්ත්‍රාත් කරු කවුද? කියලා කිසි කෙනෙක් දන්නෙ නැහැ. ඒ නිසා ඒ ගැටලුව අපි දැන් සොයා ගෙන යනවා. දැන ගන්න ලැබුනා උඩලමත්ත පාලමේ ව්‍යාපෘතිය කොළඹ ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථානයේ තියෙන කාර්යාලයකින් ඒ නෝනා මහත්මියකගෙ නමක් කිව්වා. ඒ ව්‍යාපෘති කටයුතු කරනවයි කියලා ඉතිං අපි මේව හොයාගෙන යන කොට කාලයක් යනවා. මේ පිළිබඳ ගැටලු තියෙනවා.

ඊලගට විශේෂයෙන්ම සඳහන් කරන්න කැමතියි. ගරු සභාපතිතුමාගෙ මේ සභාව ආරම්භයේ ඉදන්ම සැලැස්මක් තිබුනා අදාහනාගාරය. අදාහනාගාරයට වජිර ඇමතිතුමා මුදල් වෙන් කළයි කිව්වට , ඒකත් මොනවිදිහට වෙන් කරපු එකක්ද කිසිදු සොයා ගැනීමක් කරන්න විදිහක් නැහැ. ඒ මුදල් එහෙම වෙන් වෙලත් නැහැ. සමහර විට දේශපාලන වාසි ගන්න කෝටි දෙකක් වෙන් කරයි කිව්වද දන්නෙත් නැහැ. ඒ පිළිබඳත් හොයල බලලා නැත්නම් අදාහනාගාරය කරනවනම්, අර ඊයෙ ප්‍රකාශ කළා වගේ ඒකට අනිවාර්යයෙන් රජයේ මැදිහත් වීමක් අවශ්‍යයි. අපි දේශපාලන අධිකාරියට බල කර සිටිනවා. අපිට ණයක් අරගෙන මේක කරන්න හැකියාවක් නැහැ. කෝටි තුනකට ආසන්න මුදලක ණයකට ගියොත් අපේ සභාවාර දෙක තුනක් යනකම් අපට ගෙවා ගන්න බැහැ. අජිත් මහත්තයත් දන්නවා. අපි ජේ සී බී එකක් අරගෙන කොයිතරම් අමාරුවෙන්ද ගෙව්වෙ කියන එක පිළිබඳව. ඒ නිසා දේශීය අරමුදලෙන් අපට ණය ගන්න ගැටලුවක් නැහැ. අපි ණය වෙලා නැති හින්ද අපිට ණය ගන්න පුලුවන් නමුත් මේ වගේ ඒවයි ගෙවීමෙදි ප්‍රදේශයේ ජනතාවගෙ මුදල් මේවට වෙන් කරලා අපි කොහොමද මේ සභාව පවත්වාගෙන යන්නෙ කියන ගැටලුව තියෙනවා. ඒ නිසා ඔබතුමා මේ කාලය තුල උත්සාහයක් අරගෙන ඒ සඳහා ආධාර මුදලක් ලබා ගැනීමට කටයුතු කරන මෙන් සිහිපත් කරමින් වෙන විශේෂයෙන් සඳහන් කළ යුත්තක් නැහැ. විනෝද චාරිකාවත් වැදගත් කොට සලකනවා. මම අත්සන් කළේ නැහැ. දිනේ පිළිබඳ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒක විසඳගෙන පුලුවන් විදිහට සහභාගිවෙලා, සියලු දෙනාගේ සහෝදරත්වය වර්ධනය කර ගැනීමේ පරමාර්ථයෙන් කරන නිසා ඒ සඳහා සියලු ශක්තිය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උපසභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. උප සභාපතිතුමා කිව්ව වගේ පළමුවෙන්ම චාරිකාව පිළිබඳව මමත් කියන්න ඕන. ගරු ලක්රුවන් මන්ත්‍රීතුමනි, ඔබතුමා චාරිකාව හරියටම යන දිනය යන ස්ථානය සාකච්ඡා කරලා සංවිධානය කරන්න. ඊට පසුව අපට වාහනය සහ නවාතැන් පිළිබඳව සොයා බලන්න පුලුවන්. අදාල අමාත්‍යාංශවල සර්කිට් බංගලා තියෙනවා. අදාල ආයතනවලට කතා කරලා, වෙන් කර ගන්න පුලුවන්. දැනට යෝජනා වෙලා තියෙන්නෙ පෙබරවාරි 29 මාර්තු 1,2 මේ දිනේ වුනොත් හොදයි. ඉදිරියට ඡන්ද කටයුතු තියෙනවා. ඒක නිසා සියලු දෙනා මේ දිනවල යන්න උත්සාහ ගන්න.

අපේ මන්ත්‍රීතුමන්ලා අද විවිධ දේවල් පිළිබඳව කතා කළා. සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කල කාරණය ඇත්තටම අපි කාටත් බලපානවා. මම ඒක පිළිගන්නවා. අද පරිසරය බොහොම බැරෑරුම් තත්වයක තියෙන්නෙ. මොකද පරිසරය ආරක්ෂා කරගත්තොත් විතරයි අපේ ජීවිත ආරක්ෂා කරගන්න පුලුවන් වෙන්නෙ. භූමිතෙල් වලින් ධාවනය කරන බස් රථ පිළිබඳ විග්‍රහයක් කරලා, සහබන්දු මන්ත්‍රීතුමා වටිනා අදහසක් ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව අපි අදාල ආයතන දැනුවත් කරලා, අපේ සභාවෙ යෝජනාවක් හැටියට ගරු ජනාධිපතිතුමාට දන්වලා යවමු. දැන් තියෙන ලොකුම ත්‍රස්තවාදය පරිසර හානිය. මේරට පොලිතීන් ප්ලාස්ටික් වලිනුත් විනාශ වෙනවා.

අද දින මේ අවස්ථාවෙ මාධ්‍යවේදීන් පැමිණ සිටිනවා. මාධ්‍යට අපේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබුනා. අද මෙපමණ වේලාවක් සභාව පැවතුනෙත් ඒ නිසා. මම ඒ අයටත් ස්තූතිය පුදකරනවා. ඊලගට මුලින්ම අපේ නෙරංජලී මන්ත්‍රීතුමිය ගම්මැද්දෙගොඩ පාර පිළිබඳව කතා කළා. ඒ පාර යථා කාලයේදි සංවර්ධනය වේවි.

විශෙෂයෙන්ම කතා කරන්න ඕන. ඊයෙ සංවර්ධන කමිටුව පිළිබඳව. අවුරුදු ගණනකට පස්සෙ ඊයෙ තමයි හිනිදුම ආසනේ සංවර්ධන කමිටු රැස්වීමක් තිබුනෙ. ඒකට අපේ දිස්ත්‍රික් නායක ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා සංවර්ධන කමිටුවෙ සභාපති හැටියට පත්කරලා එවලා තියෙනවා. නියෝජ්‍ය සභාපති හැටියට ආසන සංවිධායක හිටපු පළාත් සභා මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමා පත්කරලා එවල තියෙනවා. ඒ වගේම හැම ආසනයකම හිටපු පළාත් සභා මන්ත්‍රීතුමන්ලා, නියෝජ්‍ය සභාපතිවරුන් විදිහට පත් කරලා ඒ ගැසට් නිවේදනය නිකුත් කරලා තියෙනවා. සම්පත් මහත්මයට සංවර්ධන කමිටුවෙ වාඩිවෙන්න අයිතියක් නැහැ කියල නන්දන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. පහුගිය කාලේ හබරාදූවෙ ආන්දෝලනාත්මක සිදුවීම් වුනා. අපේ තාරක නානායක්කාර මැතිතුමා එනවයි කියලා ප්‍රාදේශීය සභා සභාපතිවරු විරෝධතාවක් දැක්වුවා. ගරු මන්ත්‍රීතුමන්ලා මේක වුනෙත් මම හිතන්නෙ අන්න ඒ වගේ. මම තමයි දුරකතනෙන් කතා කරලා අපේ මන්ත්‍රීවරුන්ට කිව්වෙ. තමන්ගෙ අදහස් ප්‍රකාශ කරන්න එන්න කියලා. ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ඇහුවම අනික් පක්ෂවල නියෝජිතයන්ට ආරාධනා කළාය කිව්වා. මහජන නියෝජිතයෙක් හැටියට තමන්ගෙ අදහස් ඉල්ලීම් ප්‍රකාශ කරන්න, ප්‍රශ්න කතා කරන්න යන ස්ථානයේදී තමන්ට අයිතිය තියෙන්න ඕන. නමුත් ඉඩකඩ නොමැති වීම හා පහසුකම් සපයා දීමට නොහැකි වීම නිසා තමයි සියලු දෙනාට ආරාධනා නොකරන්නෙ. ඒ ගැන වැරදි වැටහීමක් තියා ගන්න එපා. උප සභාපතිතුමා කිව්වා වගේ සහබන්දු මන්ත්‍රීතුමා ඊයෙ ඇවිල්ල තමන්ගෙ අදහස් ටික ප්‍රකාශ කළා නම් වටිනවා.

ඒ වගේම ඊයෙ සංවර්ධන කමිටුවෙ කතා කරපු සංවර්ධන ව්‍යාපෘති, මුලු ලංකාවෙම කිලෝමීටර් 100000 ක කාපට් ව්‍යාපෘති සිදු වෙනවා. පසුගියදා ජොන්ස්ටන් ඇමතිතුමා මුලු ලංකාවෙම සභාපතිවරු පාර්ලිමේන්තුවට කැඳෙව්වා. අපෙන් මාර්ග ලබා දෙන්න කියලා එදාම ඉල්ලුවා. නාගොඩ ප්‍රාදේශීය සභාවට මේ ව්‍යාපෘති මගින් කිලෝමීටර් 10 ක් ලැබිලා තියෙනවා. අපිට මේ කිලෝමීටර් 10 පාරවල් දෙකකට දාන්නත් පුලුවන්. මේ ව්‍යාපෘතියෙ පරමාර්තය තමයි පළාත් සභා පළාත් පාලන ආයතන සතු මාර්ග, ග්‍රාමීය මාර්ග පුලුල් කර වැඩිදියුනු කිරීම. මාර්ග සංවර්ධන අධිකාරිය සතු වැඩිදියුනු කළ යුතු මාර්ග පුලුල් කර මාර්ග මතුපිට වැඩිදියුනු කිරීම, මංසන්දි වැඩිදියුනු කිරීම, විද්‍යුත් වර්ණ සංඥා ස්ථාපිත කිරීම හා පදික මාරු, යටි බිම් හා උඩු බිම් මාර්ග ඉදිකිරීම. මීටර් තුනේ සිට මීටර් පහ දක්වා ග්‍රාමීය මාර්ග පළාත් මාර්ග වැඩිදියුනු කිරීම. මේ සේරම අධීක්ෂණය කරන්නෙ මහා මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂතුමා. ඊයෙ ඉඳල RDA එකේ නිලධාරීන්ට නිදහසක් නැහැ. ඊයෙ පෙරේද ඉඳල දිගට පාරවල් මැන ගෙන යනවා. මේ සඳහා අපෙන් ක්ෂණික යෝජනා ගත්තා. අපි දීපු යෝජනාවලින් විශේෂිත වූ මාමනදොල පාර ඊයෙ මැනල කටයුතු කරල ඉවරයි.

ඊලඟට මේ කිලෝමීටර් 10 බෙදීමෙදි අපේ කොට්ඨාසවලට යම් යම් අඩුපාඩු වෙන්න ඇති. යතා කාලෙදි ඒ අඩුපාඩු මග හරවා ගන්න පුලුවන්. මොකද පළාත් සංවිධායකතුමාටත් ව්‍යාපෘති මගින් කිලෝ මීටර් 25ක් එනවා. හිනිදුම ආසනේ කිලෝ මීටර් 75 ක ප්‍රමාණයක් කාපට් ඇතිරෙනවා. අවශ්‍යතාවය අනුව කොන්ක්‍රීට් කරන්න වුනත් පුලුවන්. ඉතිං ඒ ගැන අපි අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ට, අග්‍රාමාත්‍ය මහින්ද රාපජක්ෂ මැතිදුන්ට සහ ජොන්ස්ටන් ප්‍රනාන්දු ගරු ඇමතිතුමාට ගෞරව ස්තූතිය පුද කරනවා. මොකද මේවා ගොඩක් කාලෙක ඉදල තිබුන අවශ්‍යතාවයන් නිසා. ඒ නිසා අපි උනන්දුවෙලා අපේ ගමේ පාරවල් ටික සකසා ගන්න කටයුතු කරන්න ඕන. මේ පළමු අදියර ඊලඟට දෙවන අදියරත් එනවා. ඒ වගේම තමයි සපිරි ගමක් යටතේ ගමකට ලක්ෂ 20 ක ප්‍රතිපාදන ලබා දීලා තියෙනවා. ඒ ලක්ෂ 20, ලක්ෂ 5 යෝජනා වෙන්න පුලුවන් නැත්නම් ලක්ෂ 10 වෙන්න පුලුවන් ලක්ෂ 20 ම වෙන්න පුලුවන්. ලක්ෂ 5 ට අඩු යෝජනා නෙවෙයි. ගම සම්බන්ද කරගෙන යෝජනා අරගෙන දැන් ඒව ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලට ඇවිල්ලා තියෙනවා. ඒවා අනුමත වෙලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලුත් ඇවිත් තියෙනවා. කුඹුරු මැදින් එහෙම යන සමහර යෝජනා තවම ඇස්තමේන්තු කරල නැහැ. අනිත් ඒවා දැන් ගිවිසුම් අත්සන් කර ගෙන යනවා. හෙට වුනත් වැඩ පටන් ගන්න පුලුවන්.

ඒ වගේම පසුගිය දවස්වල කරපු කොන්ත්‍රාත්වල මුදලුත් දැන් එමින් පවතිනවා. ඒවත් දෙන්න අපේ අතිගරු මහින්ද රාපජක්ෂ මැතිතුමා කටයුතු කරලා තියෙනවා. නමුත් සමහර ව්‍යාපෘතිවලට ඩොලර් බිලියන ගණන් ගෙවන්න තියෙනවා. මුදල් නැහැ. පාලම් ව්‍යාපෘති නම් ඉටු වෙනවා. අනිත් ඒවට බිලියන ගණන් ගෙවන්න තියෙනවා කියල තමයි අපි දැනුවත් කළේ. ඊලඟට අතරමග නැවතුන අයි රෝඩ් ව්‍යාපෘති පිළිබඳව අපි කතා කළා. අදාල කොන්ත්‍රාත් සමාගම් නඩු දාලා තියෙනවා. නඩුවලින් පරිභාහිරව ඒක කරන ක්‍රමවේදයක් හදනවා කියල අමාත්‍යාංශ ලේකම්තුමා අපට ප්‍රකාශ කළා .මම හිතන්නෙ නතර කරපු අයි රෝඩ් ව්‍යාපෘතිත් යතා කාලෙදි ඉටුකරනවා. මොකද ඒ සම්බන්දව වර්තමානයේ ඉන්නෙ මාර්ග සංවර්ධනය පිළිබඳ හිටපු ලේකම්තුමා එතුමා දක්ෂ ලේකම් වරයෙක්.

ඒ වගේම අපේ තරංග මන්ත්‍රීතමා කිව්වා වගේ, හතර වෙනිදා සමන් මන්ත්‍රීතුමාලගෙ ක්‍රීඩා සමාජයක ක්‍රීඩා තරගයක් තිබුනා. ඒක නිසා තමයි උඩුගම පිට්ටනිය එදා වහලා තිබුනෙ. වාහන දාන්න මම එපා කිව්වෙ නැහැ. නමුත් එතන වාහන දාන එක ඇත්තටම හොඳ මදි. නමුත් අපට වාහන දාන්න ස්ථානයක් තවම සොයා ගන්න බැරි වුන නිසා වාහන එතන දානවා. අපි යථා කාලෙදි අදාල මන්ත්‍රීවරුත් එක්ක සාකච්ඡා කරලා, පිට්ටනියෙන් පරිභාහිරව වාහන එලියෙ දමන්න අපි කටයුතු කර දෙමු.

පියල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල දැන්වීම් පුවරු සවිකරන්න සුදුසු ස්ථාන පිළිබදවය පහුගිය දවස්වල පොලීසියෙන් අපෙන් ඉල්ලීම් කළා. අපි ඒ ස්ථාන පිලිබදව දැනුවත් කළා. ඊට පස්සෙ අපට දැනුම් දීමක් මොනවත් නැහැ. පරිසර අංශයෙන් මොනවහරි කරන්න තමයි අපෙන් ඉල්ලීම් කරලා තිබුනෙ. මාසෙකටත් කලින් අපි ඒ ස්ථාන ලබා දුන්නා. අපි පාරවල්වල සවි කර තිබුන බෝඩ් ගලවද්දි චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි හැම බෝඩ් එකක්ම ගැලෙව්වෙ නැහැ. අපි ගලවගෙන ආපු බෝඩ් මෙතන තියෙනවා. අපිට ආරංචි වුනා යම් යම් බෝඩ් ගලවලා ඉවත් කරනවයි කියලා. අර පාලමේ ඇන්ද ගලවාගෙන ගිහිපු එක සම්බන්දව මට ගමෙන් නෙවෙයි වෙනත් නිලධාරීතුමියක් කතා කළේ. පොලීසියෙ පැමිනිල්ලක් දාන්න මන්ත්‍රීතුමා අපට දැනුම් දෙන්න. මේ වැඩ කරන විනාශකාරී කණ්ඩායමක් ඉන්නවා. හොයා ගන්න පුලුවන් වේවි.

සමන් මන්ත්‍රීතුමා ඇප්තොප්වත්ත පිළිබඳව කතා කළා. ඇප්තොප්වත්තෙ අපට අක්කර පහක බිම් ප්‍රමාණයක් වෙන් වෙලා තියෙනවා. නමුත් එදා ඉදලා ඇප්තොප්වත්තෙ කටයුතු කරද්දි අක්කර 34 යි පර්චස් ගණනක් අපට ලබා දීලා තිබුනා. ඒක නැවත අපි ඊයෙ පැවති සංවර්ධන කමිටුවෙදි සම්පූර්ණ

බිම් ප්‍රමාණයම ඉල්ලුවා. සභාපති හැටියට රමේෂ් පතිරණ ගරු ඇමතිතුමා ඒක අපට පවරාදීමට යෝජනා කළා. ඒ අවස්ථාවෙ අපේ හිටපු සභාපති, අජිත් මහත්තයා මේ පිළිබඳව සම්පූර්ණ විස්තරය කියලා පැහැදිලි කරල දුන්නා. ඒ නිසා ඒ බලාපොරොත්තුවත් අපට ඉටු කර ගන්න පුලුවන් වෙයි. මම තව යෝජනාවක් දැම්මා. මගේ හිතේ ඉස්සර ඉඳන් තිබුනා. නාගොඩ නගරය පුලුල් කර ගන්න. නාගොඩ හන්දියෙ තියෙන ලියැද්ද බල ප්‍රදේශය පවරා ගැනීමට. නමුත් ක්ෂණිකව කර ගන්න බැරි වේවි. උනන්දු වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් මහින්ද රාජපක්ෂ මැතිදුන් සමග එකතු වෙලා. මේකට යම් වැඩපිළිවෙලක් කරාවි. මොකද නාගොඩ හන්දිය කියන්නෙ මේ බල ප්‍රදේශයේ තියෙන ප්‍රධානම නගරය. නාගොඩ නගරය ආශ්‍රිතව තමයි මේ බල ප්‍රදේශයේ තියෙන සේරම වැදගත් ස්ථාන, මර්මස්ථාන තියෙන්නෙ. ඒ නිසා නාගොඩ නගරය සංවර්ධනයට අවශ්‍ය ඉඩකඩම් අඩු නිසා අඩුම ගානෙ වැසිකිලියක් හදන්නවත් ඉඩ නැහැ. සෑම නගරයකම එහෙම තමයි. නාගොඩ නගරයට අවශ්‍ය තැපැල් කන්තෝරුව, සෞඛ්‍ය මධ්‍යස්ථානය තියෙන්නෙ පෞද්ගලික ස්ථානවල. ඒ අවශ්‍යතාවයන් ඉටු කර ගන්න ලියැද්ද ඉඩම පවරා ගන්න හැකි වුනොත් අපට ලොකු ශක්තියක් වෙනවා.

ඒ වගේම තමයි ආදාහනාගාරය පිළිබඳව වසන්ත මන්ත්‍රීතුමා විමසා සිටියා. ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ඉඩම තමයි අපට ප්‍රාදේශීය සභාව සතු කරගන්න නොහැකිව තිබුනෙ. දැන් ඒ සියලුම දේවල් හරි. ඉඩම් අමාත්‍යාංශයෙන් අපට ලියුම දෙන්න විතරයි තියෙන්නෙ. එතනදි ගයන්ත ගරු ඇමතිතුමා අපට විශාල සහයක් දැක්වුවා. ඒ එක්කම වජිර ඇමතිතුමා අපට ලක්ෂ 200 ක් ආධාරයක් හැටියට ලබා දුන්නා. නමුත් මේ වෙන කොට ඒ මුදල අපට ලබා ගැනීමට නොහැකියි. මොකද මේ ඉඩම අපේ නමින් තිබුන නම් ඒ මුදල අනුමත කර ගන්න තිබුනා. පලාත් පාලන අමාත්‍යාංශයෙන් නිතර කිව්වෙ. ඉඩම ඉක්මනට පවරා ගන්න කියලා. අපි ඒ සඳහා සෑහෙන වෙහෙසක් ගත්තා. ඒ අනුව දැන් දවස් 10 ට විතර උඩදි තමයි අදාල ලිපි ගනුදෙනු වෙලා, මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා ඒකෙන් අනුමත වෙලා තියෙන්නෙ. මම කිව්වා අපට මුදල් ගෙවන්න බැහැ . ඒනිසා ඉඩම නොමිලෙ දෙන්න කියලා. ඒ නිසා අපට ඉඩම නොමිලෙ ලැබෙන්නෙ. අනිත් පළාත් පාලන ආයතනවලට දීල තියෙන්නෙ මුදල්වලට. අපට මුදල් නැති නිසා තමයි මුදල් අමාත්‍යාංශය හරහා ගිහිල්ල නොමිලේ ලබා දීමට කටයුතු කරලා තියෙන්නෙ. ඊයෙ සංවර්ධන කමිටුවෙ මේ පිළිබඳ කතා කළා. අපට දේශීය අරමුදලෙන් අපට ලක්ෂ 350 ක විතර ණයක් වුනත් ගන්න පුලුවන් අවුරුදු 40 කින් ගෙවන්න ණය ලබා දෙන්නෙ. මාසයකට රුපියල් 50000 ක 60000 ක විතර ගෙවීමක් කරන්න වෙන්නෙ. අපි ඉස්සෙල්ල හිතාගෙන හිටියෙ එහෙම කරන්න. මම ඒ ආයතනත් සමග කතා කළා. නමුත් අපට ලක්ෂ 200 ක් දෙන්න වජිර ඇමතිතුමා පොරොන්දු වුනා. දැන් ඒ මුදල් ලැබේද නොලැබේද කියන්න දන්නෙ නැහැ. නමුත් අදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව මම ඉදිරියෙදි කටයුතු කරනවා.

ඊලගට ජල ප්‍රශ්නය ගැන කතා කරනවනම්, අදත් ජල බවුසරය උඩුගම රෝහලේ. පහුගිය දවස්වල පාසල්වලට ඉල්ලුවා. පාසල්වලට ලබා දුන්නා. උඩුගම රෝහලට ජලය නැහැ. දිනපතාම වගේ ලබා දෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය තියෙද්දි අපෙන් වතුර ඉල්ලන්නෙ ඇයි කියලා මම විමසුවා. නමුත් අපේ යුතුකමක් හැටියට රෝහලට ජලය ලබා දෙනවා. වෛද්‍ය අධිකාරීතුමා ජලසම්පාදනයත් සමග සාකච්ඡා කරපු නිසා රෝහලට ලබා දෙන ජලය අපට ජලසම්පාදනයෙන් නොමිලේ ලබා දෙනවා. ඒ වගේම සමෘද්ධිය පිළිබඳව කතා කළා. තව මාස තුනකින් සමෘද්ධි ලාභීන්ගෙන් ලක්ෂයක් අයින් කරනවා. ඒ ගෝඨාභය මැතිතුමා ලක්ෂයකට රැකියා ලබා දෙන නිසා. නමුත් ලක්ෂයකට අලුතින් සමෘද්ධිය ලබා දෙනවා. ඒ වගේම ඔබතුමාල කිව්වා රැකියා අහිමි කිරීම් පිළිබඳව. ඒ සම්බන්ධව මම දැනුවත් වුනේ, ඒව කිසිම ඇගයීමකින් තොරව දීපු රැකියා. ආණ්ඩුවෙන් දීමනා ලබා දීමට මුදල් වෙන් කරගෙන නැහැ. ඒ නිසා නියම ක්‍රමවේදයකට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ අයට නැවත අර ලක්ෂයේ රැකියාත් සමග රැකියා ලබා දෙනවා කිව්වා. මේක එක්සත් ජාත්ක පක්ෂයට කරපු හානියක් නෙවෙයි. අපේම රජයේ අපේම ඇමතිවරු අපේම අය අයින් කරපු කාලෙකුත් තිබුනා.

මම විශේෂයෙන්ම කියන්න ඕන. වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සේවය කරපු අපේ ගමේ 300 ක් විතර අපේම ආණ්ඩුවෙන් ඉවත් කළා. හේතුව ක්ෂණිකව බඳවා ගත්තා. පඩි ගෙවන්න ක්‍රමයක් නැහැ. ඒ නිසා ඉවත් කළා. ඒ අය අපිට හොඳට දේශපාලනය කරපු උදවිය. අපිට විරෝධතාවයකුත් දැක්වුවා. එහෙම කාලයකුත් තිබුනා. ඒක නිසා හිතන්න එපා මේ එක්සත් ජාතික පක්ෂෙ නිසා ඉවත් කළා කියලා. ඒ නිසා නියම ක්‍රමවේදයට ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගෙ වචනය ක්‍රියාත්මක වෙයි. මේ කරන වැඩකටයුතු සාර්ථක වෙයි. මොකද අපි කෙනෙකුට අසාධාරණ නොවෙන්න වැඩකටයුතු කරන්න ඕන. කෙනෙකුට ඕනම දේශපාලන පක්ෂයකට වැඩ කරන්න අයිතිය තියෙනවා. ඒකට විරෝධය දක්වන්න, හානියක් කරන්න නෙවෙයි. ගෝඨාභය මහත්තයත්, මහින්ද මහත්තයත් ඇවිල්ල ඉන්නෙ සමාජ සේවයට. එහෙම අසාධාරණයක් නොවන බව අපි සක්සුදක් සේ දන්නවා. දැන් යන වැඩපිළිවෙල අනුව හොඳ ගමනක් යන බව අපට තේරෙනවා. ඒ නිසා වනමල් මන්ත්‍රීතුමා කිව්වා වගේ කටින් බතල කොල හිටවන්නෙ නැහැ.

ඒ වගේම අපේ මන්ත්‍රීවරු කිව්වා. මේ අවුරුදු දෙකට වැඩක් කලේ නැහැ කියලා. ඇත්තටම මුදල් නොමැති කම නිසා බොහොම අමාරුවෙන් අපි සභාව ගෙන ගියේ. කරන්න පුලුවන් දේවල් කරන්න පුලුවන් ආකාරයෙන් කළා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා. වර්ථමාන රජයත් එක්ක, අදාල මැති ඇමතිවරු සම්බන්ද කරගෙන, විශාල වශයෙන් ප්‍රතිලාභ මෙහේට ගෙනැල්ලා, යම් සේවයක් කරන්න. ඒක තමයි අපේ බලාපොරොත්තුව. කවුරුත් දන්නවා අපේ සභාව මූල්‍ය තත්වයෙන් අඩු සභාවක්. ආදායම් උත්පාදනය කරන්න අපට හැකියාවක් නැහැ. අපි බලාපොරොත්තු වුනා වරිපණම් එකතු කිරීමට. නමුත් ඒකත් අපට තවම හරියට කර ගන්න බැරි වුනා. කොහොම නමුත් තියෙන ආදායම් තත්වයත් එක්ක වැඩ කටයුතු කරනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතමන්ලා, මන්ත්‍රීතුමියන්ලත් එක්ක එකතු වෙලා, මේ වර්ථමානය වෙනකම් ගෙන ගිය වැඩපිළිවෙල පිළිබඳව අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ සභාවෙ තියෙන සම්පත් මම කාටවත් භුක්ති විදින්න හෝ හානි වෙන්න දෙන්නෙ නැහැ. සභාවෙ සම්පත් ආරක්ෂා කර ගෙන, සියලු දෙනාගෙ ගරුත්වයත් ආරක්ෂා වෙන විදිහට වැඩ කරන්න තමයි. මම බලාපොරොත්තු වෙන්නෙ.

ඒ වගේම පසුගිය දවස්වල අපේ ඉල්ලීම පිට ගරු ආණ්ඩුකාරතුමාගෙන් අපට ඩෙස්ක්ටොප් පරිගණක 03 ක්, ප්‍රින්ටර් 02 ක් ,ෆොටෝ කොපි මැෂින් 01 ක් ලැබුනා. යථා කාලෙදි සංවර්ධන කටයුතුත් බොහොම ඉහල මට්ටමින් සිදු වේවි. පක්ෂ පාට බේදයකින් තොරව කොටසින් කොටස සංවර්ධන කටයුතු සිදු කරනවා. කලින් මම කියපු ගමකට ලබා දෙන ලක්ෂ 20 අවසන් වුනාම තව ලක්ෂ 20 ක් ලබා දෙනවා. ඒ වගේම ගමකට එක නිවාසයක් ලබා දෙනවා. අපි ඒ ගමේ දුප්පත්ම සමෘද්ධිලාභී නිවසක් තමයි තෝරගෙන තියෙන්නෙ. ලංකාවෙ ග්‍රාම සේවා වසම් තියෙන ප්‍රමාණයට නිවාස දාහතර දහස් ගණනක් හැදෙනවා. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ ඌරල පතිනායක මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ නිවසක් හැදෙනවා. ඒක සුදුසම තැනක්. ඔබතුමත් ඒ ගැන බලන්න.

ඒ එක්කම ඔබතුමාල සිලු දෙනාටම මම ආරාධනා කරනවා. ප්‍රාදේශීය සභාවෙ සංවිධානයෙන්, නාගොඩ වෙරිස් ගාර්ඩින් ආයතනයෙදි වෛද්‍ය සායනයක් පැවැත්වෙනවා. දෙරණ ආයතනයෙන් ඒකට පූර්ණ දායකත්වය ලබා දෙනවා. ඒකටත් උදවු උපකාර කරන්න. සියලුම මන්ත්‍රීතුමන්ලා එදාට එන්න. වකුගඩු පරික්ෂාව, ඇස් පරික්ෂාව, ලේ පරික්ෂාව, මෙහිදී සිදු කරනවා. ඒවගේම ගැබිණි මව්වරුන්ට රුපියල් 7000 ක 8000 ක විතර බඩු මල්ලක් දෙන්න බලාපොරොත්තු වෙනවා. දුප්පත් පාසල් ළමුන් 50 කට පොත් බෑග් ලබාදීම සිදු කරනවා. එහෙම නම් ඒකත් මතක් කරමින් සියලු දෙනාටම සුබ අනාගතයක් වේවා. ජය වේවා. අද සභාවේ වැඩකටයුතු මින් හමාර කරනවා. ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:- ..............................